රළ සමග

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

ISSN 1391 - 1031
2017 ජනවාරි
22 වෙළුම 10 කලාපය

ආධාරය රු 30/=

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

*"මාක්ස්වාදය අරාජිකවාදයට වඩා වෙනස්ය. එය සාමාන්‍ය වශයෙන් විප්ලවවාදී අවදියකදී රාජ්‍යයක් හා රාජ්‍ය බලය තිබීමේ අවශ්‍යතාවය, විශෙෂයෙන්ම ධනපති ක්‍රමයේ සිට සමාජවාදයට පරිවර්තනය වීමේ කාල පරිච්ඡේදයේදී එය තිබීමේ අවශ්‍යතාවය පිළිගන්නේය."*

**ලෙනින්**
**තෝරාගත් කෘත,**
**5වැනි වෙළු,**
**46 පිටුව**

# හවුල් ආණ්ඩුවේ ප්‍රතිවිරෝධය උග්‍රවේ

**එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඒකාබද්ධ වී නිර්මාණය කරගත් වර්තමාන හවුල් ආණ්ඩුව තුළ දිනෙන් දින බරපතළ වන රටේ ආර්ථික අර්බුදය හමුවේ උග්‍ර අභ්‍යන්තර ප්‍රතිවිරෝධයක් වර්ධනය වෙමින් ඇති බව වාර්තා වේ.**

ශ්‍රී ලංකාව මෙතක් අනුගමනය කළ වැරදි ආර්ථික ප්‍රතිපත්ති හමුවේ ඉහළ ගිය රාජ්‍ය ණයබරත් දූෂණ වංචා සහ නාස්තිකාරී වියදම් හේතුවෙනුත් විශේෂයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල උපදෙස් පරිදි නිෂ්පාදන ආර්ථිකයෙන් බැහැර වීමත් හමුවේ මේ වන විට වත්මන් ආණ්ඩුව දැඩි මූල්‍ය අර්බුදයකට මුහුණපා සිටී. රාජ්‍ය ණය බර රු. බිලියන 10,000කට වැඩි අතර ඒ අනුව සෑම එක් පුරවැසියෙක්ම රු. ලක්ෂ 5කට වැඩි ණයකරුවෙකි. රාජ්‍ය ඩොලර් සංචිත වේගයෙන් පහළ ගොස් ඇති අතර රුපියලට සාපේක්ෂව ඩොලරයේ අගය පසුගියදා රු. 152ක අගයද ඉක්මවීය. විදෙස් මූල්‍ය ආයතනවලින් ණය ගනිමින්ද මෙම අර්බුදයේ බර ජනතාව මත තබමින්ද එය කෙටි **02 වැනි පිටුවට**




**05 අර්බුදයට විසඳුම...**




නව ව්‍යවස්ථාව සඳහා වන සංවාදය ජාතිවාදය අවුළුවන සංවාදයක් බවට පත්ව පංති අරගලය...

**09 රාජ්‍ය පෞද්ගලික ව්‍යාපාර...**



ජනතාව රවටටා ආණ්ඩුව සිදුකරන ජාතික අපරාධ සඳහා, ඉඩම්, වරාය මංකොල්ල සඳහා ජනවරමක් ...

**11 අනිවාර්යය හා අහම්බය...**



ජීවිතයේ සිදුවන අහම්බ තේරුම් නොගැනීම නිසා මිනිස්සු...

**12 ජනතාවගේ අයිතිය වනසන...**



මෙම කරුණු අනුව අක්කර 15,000ක් චීනයට ලබා ගතහැකි වුවහොත් එමගින් සිදුවන සමාජමය හානිය...

| | |
|---|---|
| සංවාදය........................ | 03 |
| තරුණ........................... | 04 |
| ආවර්ජනා....................... | 06 |
| දැනුම............................ | 07 |
| ජාත්‍යන්තර...................... | 08 |
| කාන්තා.......................... | 10 |
| වේදිකාව........................ | 13 |
| විශේෂාංග...................... | 14 |

***යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!***

# දහදිය සිත්තමෙහි හිමිකරුවෝ ඇගයෙති



කෙටි නාට්‍ය, කෙටි කථා, කාව්‍ය රචනා, ගීත රචනා, ඡායාරූප, චිත්‍රපට, නර්ථන, ගීත ගායනා, නිවේදක තරග අංශ 09ක් සඳහා රාජ්‍ය, අර්ධ රාජ්‍ය, වතු හා පෞද්ගලික අංශ යන ක්ෂේත්‍රයන්හි සේවය කරන වැඩකරන ජනතාව නිර්මාණ ඉදිරිපත් කර තිබුණි. එම නිර්මාණ පළමු, දෙවන හා අවසන් වශයෙන් වට 03කින් විනිශ්චයට ලක්කරමින් ජයග්‍රහණය කරන ලද නිර්මාණකරුවෝ මෙහිදී සම්මාන සහ සහතිකවලින් පිදුම් ලැබූහ.

මෙම උළෙල ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල් කාන්ත, සාහිත්‍ය අනුකමිටුවේ සභාපති චන්දන සූරියආරච්චි, ඇතුළු වෘත්තීය සමිති නායකයින් විශාල ප්‍රමාණයකගේ හා කලාකරුවන් වන කමල් පෙරේරා, බුද්ධදාස ගලප්පත්ති, පරම සන්නජිත් අබේසූරිය, දීපානි සිල්වා, ජගත් චන්ද්‍රසිරි, රමනී ෆොන්සේකා ඇතුළු මහත්ම මහත්මීන් රැසකගේ සහභාගිත්වය ලැබී තිබිණි.

සමස්ත ලාංකේය වැඩකරන ජනතාවගේ නිර්මාණශීලී හැකියාවන් උළෙලකට, සම්මානයකට පමණක් සීමා නොකර වැඩකරන ජනාතව අතර සිටින නිර්මාණකරුවන් නිවැරදිව හඳුනා ගැනීම සඳහාත්, එම නිර්මාණකරුවන්ගේ නිර්මාණ නිවැරදි සමාජ දෘෂ්ටියක් සහිත පිරිපුන් විශිෂ්ට නිර්මාණ බවට පත් කිරීම සඳහාත් නිර්මාණකරුවන්ගේ ප්‍රතිභාව ඉහළ නැන්වීම උදෙසාත් මෙම ප්‍රයත්නය අඛණ්ඩව ඉදිරියට යන බවත් එම නිර්මාණ රාසාඥතාවයෙන් ඉහළ ජන මනස අවදිකරන බුද්ධිමය ආමන්ත්‍රණයන්ගෙන් පූර්ණ නිර්මාණකරණයක් වෙනුවෙන් ඔවුන් සමඟ ජීවත්වෙමින් දහදිය සිත්තම වැඩකරන ජනතාවගේ සැබෑ නිර්මණකරණයේ වේදිකාව බවට පරිවර්තනය වෙමින් තිබෙන බවත් උළෙල අරඹමින් සාහිත්‍ය අනුකමිටුවේ සභාපති චන්දන සූරියආරච්චි සහෝදරයා විසින් අදහස් පළ කරන ලදී.

"වත්මන් පාලනයේ සියලු දේශපාලන තීන්දු රට උගසට තැබීමටත්, ලාංකේය ජාතිය ණයකරුවන් බවට පත් කරවීමටත් ඩොලර් වෙනුවෙන් රටම බිළිදෙමින් තිබෙන මොහොතක ලාංකේය සමාජයම එම දරුණු ඛේදවාචකයට මුහුණ දෙමින් සිටිනවා. අප ජීවත් වන පරිසරය තුළ ඕනෑම ක්ෂේත්‍රයක කලාකරුවෙකුට ඕනෑවටත් වඩා නිර්මාණ වස්තු බීජයන් නැතිනම් අනුභූතීන් පවතින බවත් සමාජයක් ලෙස මුහුණ දෙමින් තිබෙන මෙම සමාජ අර්බුදයෙන් ජනතාව මුදාගෙන හැම කෙනෙකුටම සතුටින් ජීවත් විය හැකි සමාජයක්, සැමට සාධාරණ සමාජයක් ගොඩනැගීමේ අරමුණින් දේශපාලඥයින් ලෙස අපි අපේ භාෂාවෙන් ජනතාව වෙත එම පණිවිඩය රැගෙන යනවා. කලාකරුවන්ටත් පුළුවන් මේ සමාජය ජනතා හිතකාමී සුන්දර සමාජයක් වෙනුවෙන් යමක් කරන්න. ඔබ සතුව පවතින නිර්මාණශීලී හැකියාව ඒ වෙනුවෙන් භාවිතාවට නගන්න අපි ඔබට යෝජනා කරනවා. තමන්ගේ කලා හැකියාව මිනිස් ජීවිත හා බැඳුණු සමාජය විනිවිදිමින් සෞන්දර්යාත්මක ප්‍රතිනිර්මාණ ඔස්සේ මිනිසුන්ව අවදි කළ හැකි නිර්මාණ වැඩි වැඩියෙන් කරන්න කියල යෝජනා කරනවා" එම ඉල්ලීම සහිතව අදහස් පළ කළේ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල් කන්ත සහෝදරයා විසිනි.

ජාතික සමගිය ගොඩනගමින් වෙනස් සහ අලුත් නිර්මාණ සංස්කෘතික අංග රැසකින් සංස්කෘතික උළෙල වර්ණවත් වී තිබිණි.

# විකිණීමට එරෙහිව වරාය සේවකයෝ වීදි බසිති




ආණ්ඩුව විසින් රාජ්‍ය සම්පත් පුද්ගලික අංශයට විකුණා දැමීම සඳහා ගෙන යන වැඩපිළිවෙළ යටතේ හම්බන්තොට වරාය විකිණීමට ගෙන ඇති තීරණට එරෙහිව උද්ඝෝෂණයක් පසුගියදා සමස්ත ලංකා වරාය පොදු සේවක සංගමයේ ලේකම් චන්ද්‍රසිරි මහගමගේ සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් කොටුව ඔරලෝසු කණුව ඉදිරිපිට පැවැත්විණි.

හම්බන්තොට වරාය අවුරුදු 198 කට චීනයේ ඝඑ ඡදරඑ සමාගමට විකිණීමට අදාළ කටයුතු ආණ්ඩුව මේ වන විට කඩිනමින් සූදානම් කරමින් පවතී. ඊට එරෙහිව ඉදිරියටත් දැඩි වෘත්තීය ක්‍රියාමාර්ග ගන්නා බව චන්ද්‍රසිරි සහෝදරයා උද්ඝෝෂණය අතර තුර මාධ්‍ය වෙත කියා සිටියේය.

# වරාය සමුපකාරයේ ජ.වි.පෙ.ට නිතරග ජයක්

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සමුපකාර බැංකුවේ මහසභා නියෝජිතයින් 72ක් පත්කර ගැනීම සඳහා නාමයෝජනා භාරදීම 2016.12.20 දින සිදුකරන ලදී. ඒ සඳහා ඉදිරිපත් වූ ජනතා විමුක්ති පෙරමුණේ සමස්ත ලංකා වරාය පොදු සේවක සංගමයට නිතරග ජයක් හිමි විය. සියලුම මහසභා නියෝජිතයින් එකම කණ්ඩායමකින් නිතරග ජයක් ලැබූ පළමු අවස්ථාව මෙය වන අතර වෙනත් කණ්ඩායමකින් එකදු සාමාජිකයෙක්වත් නාමයෝජනා ඉදිරිපත් නොකළ පළමු අවස්ථාවද මෙය වේ.

මෙම සමුපකාර බැංකුව වරාය අධිකාරියේ සේවකයින්ගෙන් 80%ක් සාමාජිතකත්වය දරන සාමාජිකයන් 7600ක් සහිත කෝටි 200ක වත්කමක් ඇති ආයතනයකි. වරාය අධිකාරියේ සේවක සමුපකාර බැංකුවේ නිලවරණය ප්‍රබල දේශපාලන මැදිහත්වීමක් හා ක්‍රියාකාරීත්වයක් ඇති සමුපකාර නිලවරණයකි. වරාය අධිකාරිය යනු ශ්‍රී ලංකාවේ දේශපාලනයේ තීරණාත්මක ආයතනයක් වන අතර සියලුම පක්ෂවලට අයත් වෘත්තීය සමිතිවල ප්‍රබල ක්‍රියාකාරීත්වයක් ඇති ආයතනයකි. සමුපකාර බැංකු නිලවරණය වෘත්තීය සමිතිවල ශක්තිය උරගා බලන තීරණාත්මක මොහොතකි. පසුගිය නිලවරණවලදී මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ සිට වරාය ඇමතිවරුන් සහ වරාය අධිකාරියේ සභාපතිවරයාගේ මැදිහත්වීම් සහිතව පැවැත්වූ සෑම නිලවරණයකදීම ජ.වි.පෙ. කණ්ඩායමට ජයග්‍රහණය හිමි විය. ජ.වි.පෙ. නියෝජිතයන් සමුපකාර බැංකුව තුළ විනිවිදභාවයක් සහිතව කටයුතු කිරීමත් එම පාලන කාලය තුළදී සමුපකාර බැංකුව සීඝ්‍ර වර්ධනයක් ලබා ගැනීමත් සාමාජිකයින්ට ඉහළ ප්‍රතිලාභ හිමිවීමත් සාමාජිකයන්ගේ ප්‍රසාදයට හේතු වී ඇත. මේ තත්වය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය හා මහාසභාවේ නියොජිතයින් සියලු සාමාජිකයින්ගේ විශ්වාසය දිනාගෙන ඇති බැවින් ජ.වි.පෙ. කණ්ඩායම සමග තරග කර වෙනත් කණ්ඩායමකට ජයග්‍රහණය ලැබීමට නොහැකි තත්වයක් නිර්මාණය වී ඇතැයි වරාය සේවකයෝ පවසති.

# හම්බන්තොට වරාය විකිණීම පිළිබඳව ජ.වි.පෙ.න් ජනපතිට ලිපියක්

**පසුගිය 27වැනිදා ජනාධිපතිවරයා වෙත ලිපියක් යොමුකරමින් ජ.වි.පෙ. දේහපාලන මණ්ඩල සභික පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා හම්බන්තොට වරාය විකිණීමට අදාළ ආණ්ඩුවේ ගිවිසුම රට හමුවේ තැබීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටියේය. එම ලිපිය සම්පූර්ණයෙන් මෙසේය.**

## හම්බන්තොට වරාය විකුණා දැමීම සඳහා වන ආණ්ඩුවේ තීරණය පිළිබඳවයි

එළඹෙන ජනවාරි 07වැනි දින හම්බන්තොට වරායේ අයිතිය අවුරුදු 99ක කාලයක් සඳහා චීන සමාගමකට පවරන්නාවූ ගිවිසුමක් අත්සන් කරනු බව අගමැතිවරයා විසින් දැනටමත් ප්‍රකාශ කරනු ලැබ ඇත.

රටේත් ජනතාවගේත් යහපත වෙනුවෙන් යෙදවිය යුතු මහජන දේපළක් මෙලෙස විකුණා දැමීම ජනතා විමුක්ති පෙරමුණ ලෙස අපි දැඩිව හෙළා දකිමු.

අවුරුදු 99ක කාලයක් වෙනුවෙන් සිදුකරනු ලබන මෙම අයිතිය පැවරීම වඩාත් බරපතළ කරුණක් වනුයේ එය රටේ ජාතික ආර්ථිකයේ හා ජාතික ආරක්ෂාවේ මර්මස්ථානයක් වන වරායක් වීම නිසාය; ස්වෛරීත්වය හා බැඳුණු කරුණක් වීම නිසාය. පවරා දෙනු ලබන්නේ, ලංකාව වැනි භූ දේශපාලනික වශයෙන් වැදගත් ස්ථානීය පිහිටීමක ඇති රටක වරායක් වීම තවත් කරුණකි. මෙය ඓතිහාසික වශයෙන්ද සනාථ වූ සත්‍යයකි. ලංකාව යටත් කරගැනීමට පැමිණි පෘතුගීසි, ලන්දේසි හා බ්‍රිතාන්‍ය යන යටත්විජිතවාදීන් සියලු දෙනා අනෙකා සමඟ යුද්ධ කරගත්තේ මෙරට වරායන් අත්පත් කරගැනීම වෙනුවෙනි. මන්ද වරායන්හි හිමිකාරිත්වය දිවයිනක් වන මෙරට බලය ස්ථාපිත කරගැනීමේදී අතිශය තීරණාත්මක බව ඔවුන් දැන සිටි නිසාය.

පසුගිය වසරේ ජනවාරි 08වැනි දින ඔබතුමා ජනාධිපති ධුරයේ හිඳවූ එක් ජනතා සටන්පාඨයක් වූයේ පසුගිය රාපක්ෂ පාලනයේ නීතිවිරෝධී, රහසිගත ගනුදෙනුවලට විරෝධය පළකිරීමය; ඊට එරෙහිව නෛතික පියවර ගැනීමය. රටෙහි සම්පත් හා කොන්ත්‍රාත් ජාවාරම්කාරයින් වෙත පවරනු ලැබූ රහසිගත සහ දූෂිත පියවරයන් ජනතාවගේ දැඩි විවේචනයට ලක්වී තිබිණි. ඒ නිසාම දූෂණයෙන් තොරවීම, විනිවිද පෙනෙනසුළුභාවය ආදී තේමාවන් ඔබතුමාගේත් ඔබතුමාගේ මැතිවරණ ව්‍යාපාරයේත් සටන්පාඨ බවට පත්විය. කෙසේ වුවද හම්බන්තොට වරායේ අයිතිය විදේශීය සමාගමකට පැවරීමට සති දෙකකට අඩු කාලයක් තිබියෙදී ඒ ගිවිසුම කුමක්දැයි රටේ ජනතාව කිසිවක් දන්නේ නැත; පාර්ලිමේන්තුව දන්නේද නැත. මෙම රහසිගත ගනුදෙනු 'ඩීල්' නොවන්නේ කවර හේතුවක් නිසාදැයි අපි නොදනිමු. එසේම ඒවා රාජපක්ෂ පාලනයේ 'කළු දශකයේ' ඩීල්වලින් වෙනස් වන්නේ කෙසේදැයි ජනතාවට ඇත්තේ ගැටලුවකි.

මෙම ගනුදෙනුව පාර්ලිමේන්තුව හමුවේ තැබූ පමණින් එම කටයුත්ත සාධාරණීකරණය වන්නේ නැත. එහෙත් රටේ දේපළක් විදේශීය සමාගමකට පැවරෙද්දී එහි කොන්දේසි කවරේදැයි රටේ ජනතාවට ප්‍රකාශ කිරීමට ආණ්ඩුවට අවම සදාචාරයක් හෝ තිබිය යුතු අතර එය දැනගනීම මහජනතාවගේ අයිතියක්ද වේ. මන්ද මෙම ගනුදෙනුව වෙනුවෙන් පෙනී සිටින හෝ ඊට අත්සන් තබන කිසිවෙකුත්, මේ ලිපිය ලියන අපත් වසර 99කට පසු මේ අයිතිය ආපසු රටට පැවරෙන විට නොසිටිනු ඇති බැවිනි. මෙය රටේ අනාගත පරම්පරාවටද වගකිව යුතු කරුණකි.

මේ සියලු තත්වයන් සලකා බලමින් අපි ඔබෙන් ඉල්ලා සිටින්නේ, මහජන දේපළක් විදෙස් අයිතියකට පවරන මෙම ගිවිසුම අත්සන් කිරීමට ඉඩ නොතබන ලෙසය; අවම වශයෙන් අත්සන් තැබීමට පෙර මෙම ගිවිසුම කුමක්දැයි රටට දැනගනීමට හැකි වන අයුරින් පාර්ලිමේන්තුව හමුවේ තැබීමට අදාළ පියවර කඩිනමින් ගන්නා ලෙසය. මේ සම්බන්ධයෙන් ඔබ විසින් ගනු ලබන පියවර දෙස රටම බලාසිටින බැවින් ඒ සඳහා කඩිනමින් මැදිහත් වන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

## හවුල් ආණ්ඩුවේ...

01 පිටුවෙන්

කාලීනව පියමං කරගැනීමට උත්සාහ ගනිමින් සිටී. පසුගියදා රනිල් - මෛත්‍රී හවුල් පාලනය ඒ වෙනුවෙන් ජනතාව මත විවිධ නව බදු හා දඩ පැනවීමටත් පවතින භාණ්ඩ හා සේවා බදු ප්‍රතිශත ඉහළ නැංවීමටත් පියවර ගත්තේය. එසේම ණය දෙන මූල්‍ය ආයතනවල උපදෙස් අනුව රාජ්‍ය සම්පත් සහ මහජන දේපළ ගණනාවක් විකුණා දැමීමටද ආණ්ඩුව සැලසුම් සකස් කරමින් සිටී.

කෙසේ වුවද ආණ්ඩුව විසින් ගන්නා ලද මෙම පියවරයන්ට එරෙහිව බලවත් ජනතා විරෝධයක් ආණ්ඩුවට එල්ලවෙමින් තිබියෙදී ආණ්ඩුවේ ශ්‍රීල.නි.ප. පාර්ශ්වය ඒ වගකීමෙන් මිදීමට උත්සාහ ගනිමින් සිටී. විශේෂයෙන් බොහෝ ශ්‍රීල.නි.ප. ඇමතිවරුන්ගෙන් මේ වන විට ආණ්ඩුවේ ප්‍රතිපත්තිමය තීරණ සම්බන්ධයෙන් චෝදනා පළ වෙමින් තිබේ. ඩිලාන් පෙරේරා ඇමතිවරයා එළඹෙන වසරේදී හවුල් ආණ්ඩුවෙන් ශ්‍රීල.නි.ප.ය ඉවත්වීමට නියමිත බව පැවසීමත් බොහෝ ඇමතිවරුන් එ.ජා.ප.ය විසින් ගෙනඒමට උත්සාහ කරන සංවර්ධන විශේෂ විධි විධාන පනත විවේචනය කිරීමත් මීට නිදසුනකි. පළාත් සභා බලතල උදුරා ගන්නා බව පවසමින් ශ්‍රීල.නි.ප.යට බලය ඇති සියලු පළාත් සභාවලින් එම පනත් කෙටුම්පත පරාජය කිරීමට සැලැස්වීමද එ.ජා.ප.යට එල්ල කරන ලද ප්‍රහාරයකි.

මේ අතර එ.ජා.ප. හා ශ්‍රීල.නි.ප. මැති ඇමතිවරුන් ජනමාධ්‍ය ඔස්සේ එකිනෙකා වෙත වාග් ප්‍රහාරද එල්ල කරගන්නා තැනට මෙම අර්බුදය ඔඩුදුවා ඇත. විශේෂයෙන් බලය වෙනුවෙන් ව්‍යාජ එකමුතුවක් මත හවුල් ආණ්ඩුවක් නිර්මාණය කර ගත් ඔවුහු දැන් තම තමන්ට වෙන වෙනම ආණ්ඩු පිහිටුවිය හැකි බවට වහසි බස් දොඩමින් සිටිති. කෙසේ නමුත් මේ සියලු ව්‍යාජ රංගනයන් මගින් පෙන්නුම් කෙරෙමින් ඇත්තේ බලය වෙනුවෙන් හවුල් වුවද බලය වෙනුවෙන් එකිනෙකා හා ප්‍රතිරෝධයන් ගොඩනගා ගන්නා බවය. අනෙක් අතට ආණ්ඩුවේ ජනතා විරෝධී හැසිරීම් සම්බන්ධයෙන් වගකීමෙන් මිදීමට මෛත්‍රී පාර්ශ්වය කටයුතු කරන අතර එ.ජා.ප.යද වගකීම් විරහිතව කටයුතු කරමින් සිටී.

මෙම තත්වය හමුවේ ආණ්ඩුවේ ස්ථාවරත්වය පිළිබඳව බරපතළ ගැටලුවක් බාහිරට ප්‍රදර්ශනය වෙමින් ඇති අතර දේශපාලන විශ්ලේශකයින්ගේ අදහස වනුයේ රනිල් - මෛත්‍රී අතර වර්ධනය වන සීතල බල අරගලයේ පිළිබිඹුවක්ද මෙම අවුල තුළ දැකගත හැකි බවය. මෙහි අවසන් ප්‍රතිඵලය වන්නේ, ආණ්ඩුවත් එය නියෝජනය කරන ධනපති පක්ෂත් දිනෙන් දිනම දුර්වල වීමය.

## පරපෝෂිත කණ්ඩායමෙන්...

16 පිටුවෙන්

හමුවේ තිබෙන අභියෝගය මේ පරපෝෂිත කණ්ඩායමෙන් රට මුදවාගෙන සමාජවාදී ශ්‍රී ලංකාවක් මානවවාදයෙන් පිරුණු, ජාතික සමගිය ගොඩනැගුණු, අරමුණු තිබෙන, බලාපොරොත්තු තිබෙන, අනාගතය පිළිබඳව සුභ සිහින දකින ශ්‍රී ලංකාවක් ගොඩනැගීමයි. ඒ සඳහා අපිට කියුබාවෙන් එක් රැස්කරගත හැකි ආදර්ශයන් බොහෝමයක් තිබෙනවා."

මේ අවස්ථාවට හෙලේනො රාමෝස් කියුබානු තානාපතිතුමිය, ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික විජිත හේරත් සහෝදරයා, ලෝක සෞඛ්‍ය සංවිධානයේ අග්නිදිග ආසියානු කලාපයේ ප්‍රතිශක්තිකරණය පිළිබඳ උපදේශක මහජන සෞඛ්‍ය පිළිබඳ විශේෂඥ වෛද්‍ය නිහාල් අබේසිංහ මහතා, කියුබාවේ ශ්‍රී ලංකා මිත්‍රත්ව සංගමයේ ලේකම් සුබ්‍රමනියම් නාගේන්ද්‍රා මහතා, ප්‍රවීණ කලාකරු සෞම්‍ය ලියනගේ මහතා, ප්‍රවීණ කිවියර ආරියවංශ රණවීර මහතා, ප්‍රවීණ ලේඛක ගුණසේන විතාන මහතා, කියුබානු උපාධිධාරී මොරටුව සරසවියේ ක්‍රීඩා අධ්‍යක්ෂ රත්න මුදලි මහතා, ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික බිමල් රත්නායක සහෝදරයා, යාපනය දිස්ත්‍රික් සංවිධායක රාමලිංගම් චන්ද්‍රසේකර් සහෝදරයා, සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා, සමාජවාදී කාන්තා සංගමයේ ජාතික සංවිධායිකා සමන්මලී ගුණසිංහ සහෝදරිය, සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක රංගන දේවප්‍රිය සහෝදරයා, කියුබාවේ ඉගනුම ලබන ශ්‍රී ලාංකීය සරසවි සිසුන් නියෝජනය කරමින් රනුර පෙරේරා සහ නදීෂාන් ජයකොඩි මහත්වරු එක්වී සිටියහ.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# නව වසරේ නව දේශපාලන ගමනක් වෙනුවෙන් පෙළගැසෙමු

**ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා**



***නියමුවාඃ- දැන් අපි ඉන්නේ 2017 අලුත් වසරේ. මේ නව වසරේ රටත් ජනතාවත් හමුවේ තිබෙන අභියෝග මොනවාද?***

***ටිල්වින් සිල්වා සහෝදරයාඃ-*** ඇත්තටම 2017 වසර එළඹිලා තියෙන්නේ ජනතාව ඉදිරියේ අභියෝග රැසක් මෙන්ම අවස්ථාද මතුකරමින්. විශේෂයෙන්ම වත්මන් හවුල් ආණ්ඩුවේ විනාශකාරි ආර්ථික ප්‍රතිත්තියේ විපාකවලට ජනතාවට මුහුණ දෙන්න වෙන්නේ මේ වසරෙයි. මේ වසර ඇවිත් තියෙන්නේ පසුගිය දෙසැම්බරයේ සම්මත කරගත් අයවැයෙන් පැනවූ බදු හා දඩ කන්දරාවක් සමඟයි. ඒ නිසා විශාල බදු බරකට කරගහන්න ජනතාවට සිදුවෙනවා. ඒ වගේම සහන කැපීම නිසා සිදුවන පීඩාවන්ට මුහුණදීමටත් මේ වසරේ සිදුවෙනවා. දැනටමත් ගොවි ජනතාවට වගාවට ප්‍රමාණවත්ව ජලය සැපයීම නොකළ නිසාත් පොහොර සඳහා ලබාදිය යුතු සහන මුදල ලබා නොදුන් නිසාත් වී අස්වනු විශාල ලෙස අඩුවෙලා. ඉන් ගොවි ජනයාගේ ආදායම් අඩුවන අතර පාරිභෝගික ජනතාවට හාල් කිලෝව රු. 100 ඉක්මවා යාවි.

ඒ වගේම ආණ්ඩුවේ නව ලිබරල් ආර්ථිකයට අනුව රටේ දේපළ හා සම්පත් විකිණීම කරන්නේත් මේ අවුරුද්දේ. මේ ජනවාරි මුල හම්බන්තොට වරාය චීන සමාගමකට පැවරීම සිදුකරනවා. ඒ වගේම හම්බන්තොට හා මොනරාගල ප්‍රදේශවලින් ඉඩම් අක්කර 15,000ක් චීනයට ලබාදීමටත් මේ වසරේ සිදුවීමට නියමිතයි. ඊට අමතරව කොළඹ වරාය නැගෙනහිර ජැටිය, ත්‍රිකුණාමලය තෙල් ටැංකි, කහටගහ මිනිරන් පතල, පුල්මුඩේ ඛනිජ වැලි, ශ්‍රී ලන්කන් එයාර් ගුවන් සේවය, ආදී වටිනා සම්පත් රැසක් විකිණීම මේ වසරේ සිදුවෙනවා. ඉතින් ඒක ජනතාවට අභියෝගයක්. මේ නිසා දැවැන්ත ආණ්ඩු විරෝධයක් හා රටේ සම්පත් විකිණීමට එරෙහිව සටන් රැල්ලක් නිර්මාණය වේවි. එය හරියට හඳුනාගත්තොත් ජනතාවට ජයග්‍රහණ සඳහා ඒ තුළම අවස්ථාවකුත් තියෙනවා.

***නියමුවාඃ- ඔබ සටන් රැල්ලක් ගැන සඳහන් කරනවා. ජවිපෙ පසුගිය දිනෙකත් ප්‍රකාශ කරලා තිබුණ මේ වසර සටන් වසරක් වන බව. මොකක්ද මේ කියන්නේ?***

***ටිල්වින් සිල්වා සහෝදරයාඃ-*** ඉතාම පැහැදිලිව ආණ්ඩුවේ බදුබර නිසා පීඩාවට පත්වන ජනතාවට, ඩොලර් 1ක් රු. 152ක් ඉක්මවා යාම නිසා බඩුමිල වැඩිවීමෙන් පීඩාවට පත්වන ජනතාවට, තම අධ්‍යාපන, සෞඛ්‍ය සේවා සඳහාත්, ගොවි ජනතාව සඳහත් ලබාදිය යුතු සහන කැපීම නිසා පීඩාවට පත්වන ජනතාවට එම පීඩනයට එරෙහිව සටනක් අරගලයක් තිබෙනවා. ඒ වගේම රටේ සම්පත් හා රාජ්‍ය ආයතන විකුණා දැමීමේදී ඉන් පීඩාවට පත්වන ජන කණ්ඩායම්වලටත් තම අයිතීන් රැක ගැනීමේ සටනක් තියෙනවා. දැනටමත් හම්බන්තොට වරාය විකිණීමට එරෙහිව, ඉඩම් විකිණීමට එරෙහිව, කොළඹ වරායේ ජැටිය විකිණීමට එරෙහිව සටන් පැන නැගිල තියෙනවා. අපි ඒ ඉතාම සාධාරණ සටන්වලට නායකත්වය දීමට සූදානම්. දැනටමත් මේ සටන්වල නායකත්වය දරන්නේ අපේ පක්ෂය. මේ සියලු සටන් බිම් තුළ ඒ ඒ ආයතනවල, ප්‍රදේශවල වෙන වෙනම පවතින සටන් හා උද්ඝෝෂණ වෙන වෙනම පවත්වාගෙන යන ගමන්ම මේ සියලු සටන් ඒකාබද්ධ කොට දැවැන්ත පොදු ජන සටනක් බවට පත් කිරීමටත් අපි සූදානම්. ඒ සඳහා අප දැනටමත් පොස්ටර් ව්‍යාපාර, පත්‍රිකා බෙදීම් හා උද්ඝෝෂණ සැලසුම් කරලා ක්‍රියාවට නගනවා. මේ සටන් සියල්ලට නායකත්වය දිය හැක්කේ ජ.වි.පෙ.ට පමණයි. ඒ නිසා ධනවාදය පරදවා නව සමාජයක් වෙනුවෙන් ගොඩනගන දැවැන්ත ජනතා බලයේ කොටසක් බවට මේ සියලු සටන් පත් වේවි කියලා අපි හිතනවා.

***නියමුවාඃ- හොඳයි, ඔබ සඳහන් කළා මේ පැන නගින ජනතා සටන්වලට නායකත්වය දිය හැක්කේ ජ.වි.පෙ.ට පමණක් බව. එය තවදුරටත් පැහැදිලි කළොත්?***

***ටිල්වින් සිල්වා සහෝදරයාඃ-*** දැන් අපේ රටේ තියෙන්නේ අතීතයේ තිබුණ දේශපාලන තත්වය නෙවෙයි. අතීතයේ දෙකට බෙදිලා මාරුවෙන් මාරුවට රට පාලනය කරපු ධනපති පක්ෂ දෙකටම එකට එකතු වෙලා හවුල් ආණ්ඩුවක් හදන්න සිද්ධ වෙලා තියෙනවා. ඒ, මේ දෙගොල්ලම ජනතාව විසින් ප්‍රතික්ෂේප කළ නිසා.

> "ඉහළින් හා පහළින් ඇතිවන අර්බුදය සමාජ පරිවර්තනයකට අවශ්‍ය දේශපාලන පසුබිම සකස් කරනවා. ඒක තමයි ජනතාව ඉදිරියේ තිබෙන අවස්ථාව. එම අවස්ථාව අපතේ යා නොදී එය හරියටම අත්පත් කරගෙන ජනතාවගේ ජයග්‍රහණයක් සඳහා යොදා ගැනීම තමයි අපේ අරමුණ."

ධනපති පක්ෂ දෙකඩවෙලා, කල්ලි බෙදිලා, දුර්වල වෙලා තියෙනවා. මේක විශේෂ තත්වයක්. දැන් රට තුළ පැන නගින ජනතා සටන්වලට නායකත්වය දෙන්න, එ.ජා.ප.යට පුළුවන්ද? බැහැ. ඔවුන් මේ ආණ්ඩුවේ කොටසක්. මේ ප්‍රශ්නවල වගඋත්තරකරුවෝ ඔවුන්. නැත්නම් මෛත්‍රීපාල කණ්ඩායමට මේ සටන්වල නායකත්වය ගන්න පුළුවන්ද? ඒත් බැහැ. ඔවුන් ඉන්නේ ආණ්ඩුවේ. ඔවුන් මේ විනාශකාරී ආර්ථික ක්‍රියාමාර්ගවල හවුල්කරුවෝ. වගඋත්තරකරුවෝ. ඊළඟට මහින්ද රාජපක්ෂ කල්ලියේ තත්වය කුමක්ද? එක් අතකින් ඔවුන් දුර්වලයි. අනෙක් අතින් මේ සටන්වලට ඔවුන්ට කිට්ටුවෙන්න බැහැ. මොකද, ඔවුන්ගේ පාලන කාලයේ ගත්තු තීරණ තමයි වර්තමාන ආණ්ඩුව මේ ක්‍රියාවට නගන්නේ. ඔවුනුත් බදුබර වැඩිකළා. ජනතාව මත බදුබර පනවපු පසුගිය අයවැයට විරුද්ධව ඡන්දය දෙන්නටත් මහින්ද රාජපක්ෂ පාර්ලිමේන්තුවට ආවේ නැහැ. ඒ නිසා ජීවන බරට එරෙහි සටන ඔවුන්ට අල්ලන්න බැහැ. ඔවුනුත් සහන කැපුවා. හොරා කෑවා. ඒව ජනතාවට මතකයි. ඒ වගේම දැන් මේ රට විකිණීමට යන බොහෝ ආයතන විකිණීමට තීරණය ගත්තේ රාජපක්ෂ පාලනය

15 වැනි පිටුවට

## නව වසර හා සුබ පැතුම්!

දැනට අප පාවිච්චි කරන දින දර්ශනයට අනුව 2017 නව වසර උදාවී ඇත. නව වසර උදාවීමත් සමගම සුපුරුදු ලෙසම රූපවාහිනී නාලිකා, එෆ්.එම්. නාලිකා හා පුවත්පත් ආයතනද, ඒවාට අරක්ගත් ව්‍යාපාරිකයෝ හා වෙළෙන්දෝද දේශපාලකයෝද සුබ නව වසරක් වේවායි එකිනෙකා හා තරඟ වදිමින් ජනතාවට සුබ පතති. ජනතාවද පුරුද්දට එකිනෙකාට සුබ පතා ගනිති. එහෙත් මීට කලින් සිදුවූ ලෙසම කිසිදු සුබ ලකුණක් නොමැතිව අවුරුදු ගෙවී යයි. ජනතාව දුකින් දුකට, පීඩාවෙන් පීඩාවට පත්වෙති. සත්‍යය එයයි.

නව වසර සුබ නව වසරක් වේවායි සුබ පතා ගනිද්දී 2016 නිමා කොට 2017 වසර ජනතාව හමුවට පැමිණ ඇත්තේ සුබ පණිවිඩ රැගෙන නම් නොවේ. ධනපති පාලනය 2017 වසරට ලබාදී ඇත්තේ අසුබ පණිවිඩය. 2017 ඇරඹෙන විටම අලුත් අයවැයෙන් සම්මත කර ගනු ලැබූ බදු හා දඩ තොගයක් ජනතාව මත පතිතවීමට නියමිතය. ඉතින් නව වසර සුබ වන්නේ කෙසේද? එසේම අයවැයෙන් අධ්‍යාපන, සෞඛ්‍ය සඳහා වන මුදල් කප්පාදුකර ඇති නිසා නව වසරේ ඒ වෙනුවෙන් ජනතාව මත පතිතවන බරද වැඩිවෙනු ඇත. නව වසරේ සුබ පැතුම් යථාර්ථයක් නොවන්නේ ඒ නිසාය. අනෙක් අතට වත්මන් හවුල් ආණ්ඩුව සිය නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තියට අනුව රාජ්‍ය දේපල හා ජනතාවගේ සම්පත් විකුණා දැමීම ක්‍රියාත්මක කරන්නේද මේ වසරේය. ඒ අනුව හම්බන්තොට වරාය, කොළඹ වරායේ නැගෙනහිර ජැටිය, මත්තල ගුවන්තොටුපල, හම්බන්තොට, මොනරාගල, ඇඹිලිපිටිය ජනතාවගේ ඉඩම් අක්කර 15,000ක්, කහටගහ මිනිරන් පතල, ත්‍රිකුණාමලේ තෙල් ටැංකි, පුල්මුඩේ ඛනිජ වැලි, ශ්‍රී ලංකන් ගුවන්සේවය විකුණා දැමීමට නියමිතව ඇත්තේ මේ වසරේය. ඉදින් තමන් සතු ඉඩම්වලින් තමන් ඉවත්කොට ඒවා වසර 99 කට චීන සමාගමකට බදු දෙන විට එම ප්‍රදේශවල ජීවත්වන ජනයාට නව වසර සුබ වන්නේ කෙසේද? වරාය, ගුවන් තොටුපළ, ගුවන් සේවය, මිනිරන් පතල, ඛනිජවැලි නිධිය විකුණා දමනවිට ඉන් සිදුවන හානිය අනුව රටටත් ඊට සම්බන්ධ වැඩකරන ජනයාටත් නව වසර සුබ වන්නේ කෙසේද?

ගොවි ජනයාට වගාවට වතුර නොදීම නිසා, පොහොර සහනාධාරයට හිමි මුදල් නොදීම නිසා වී අස්වැන්න අඩුවී ගොවියාගේ ආදායම අඩු වන විට, පාරිභෝගිකයාට හාල් කිලෝව රු. 100 ඉක්මවන විට නව වසර සුබ වේද? මේ අප සිතා බැලිය යුතු කරුණුය.


ධනපති ක්‍රමය තුළ කිසිම වසරක් ජනතාවට සුබ වන්නේ නැත. හැම නව වසරක්ම සුබ වන්නේත්, සුබ වී ඇත්තේත් ධනපති පාලකයන්ටය; ව්‍යාපාර හිමිකරුවන්ටය; වෙළෙන්දන්ටය. ජනතාවට බොරුවට සුබ පතන ඉහත සියලු දෙනාට සැමදාම අවුරුදුය; හැමදාම නත්තල්ය. පොදු ජනයාට මතක තිබෙන කාලයක අලුත් අවුරුද්ද සුබවී නැත. ඒ ධනවාදයේ හැටිය.

එහෙත් අප අසුබවාදයට වැටිය යුතු නැත. ඕනෑම අභියෝගයක් තුළ අවස්ථාවක්ද තිබේ. සැම කළු වළාවකම රිදී රේඛාවක් ඇතැයි පැවැසෙන්නේද එයටය. නව වසර සමග ජනතාව මුහුණදෙන මේ සියලු අර්බුද අතර සුබ නව වසරක් සඳහා සැබෑ බලාපොරොත්තුවක්ද තිබේ. ඒ අනාගත ජනතාවාදී පාලනයක් බිහිකර ගැනීම සඳහා ගොඩ නැගෙමින් තිබෙන ජනතා මධ්‍යස්ථානයය. ජනතාවට නව වසරේ සැබෑ සුබ පණිවිඩය රැගෙන එන්නේ එයයි.

ව්‍යාජ, බොරු, පුහු හා රැවටිලිකාරී සුබ පැතුම් පසෙකලා ලැබූ නව වසර පමණක් නොව මුළු අනාගතයම සැබෑවටම සුබ කර ගත හැකි මඟක් ජනතාව ඉදිරියේ තිබේ. ඒ මෙතෙක් පැවති සම්ප්‍රදායික දේශපාලන ගමන් මඟ ඉවතලා නව ගමන් මඟක් තෝරා ගැනීමය. ගෙවීගිය වසරේ පැරණි වූ, ප්‍රයෝජනයක් නැති, නිෂ්ඵල, යල්පැනගිය, සියලු දේ අත්හැර නැවුම්, අලුත් දේවල් ජීවිතයට ළංකර ගන්නාක් මෙන්ම ගතවූ වසර දක්වා අනුගමනය කළ අසාර්ථක, අසමත්, වැරදි දේශපාලන ගමන අත්හැර පොදු ජනතාව විසින් නව වසරේ නව දේශපාලන ගමනක් තෝරා ගන්නේ නම්, පැරණි ධනවාදය වෙනුවට නව වසරේ නවීන සමාජවාදයේ දිශාවට යන ගමනට එක් වන්නේ නම් මේ වසර සුබ නව වසරක් පමණක් නොව මුළු අනාගතයම අලුත් කරන වසරක් වනු ඇත.

2017 නව වසර ජනතාව මත බර පැටවෙන වසරක් වනවා සේම ඊට එරෙහිව ජනතාව සටන් වදින වසරක්ද වනු ඇත. මේ වසර ජනතාවගේ සම්පත් විකුණා දැමීමට පාලකයන් කටයුතු කරන වසරක් සේම ඊට එරෙහිව රට පුරා ජනතාව සටන් වදින සටන් වසරක්ද වනු ඇත. මේ වසර සුපුරුදු ලෙස නැවත වරක් ජනතාව රැවටීමට ධනපති දේශපාලන කණ්ඩායම් උත්සාහ කරන වසරක් සේම ධනපති රැවටිලිකාරී දේශපාලනයෙන් ජනතාව මුදාගෙන ඔවුන්ට සැබෑ ජයග්‍රහණයේ මාවත වෙත රැගෙන යන වසරක්ද වනු ඇත.

එබැවින් සුබ නව වසරක් සඳහා කරනු ලබන සම්ප්‍රදායික සුබ පැතීම් වෙනුවට නව වසර සැබැවින්ම සුබකරගත හැකි මඟට ඒමට ජනතාව අදිටන් කර ගත යුතුය. තමන් මත පටවන ජීවනබරට එරෙහිව, පීඩනයට එරෙහිව තීරණාත්මක ලෙස සටන් වදින්නට ජනතාව සූදානම් නම්, සම්පත් විකිණීමට එරෙහිව අරගල කිරීමට සූදානම් නම්, ජනතාවාදී පාලනයක් අරමුණු කර ගනිමින් ජ.වි.පෙ. මූලිකත්වයෙන් ගොඩ නැගෙන සැබෑ ජනතා මධ්‍යස්ථානයේ කොටස්කරුවෙකු වීමට සූදානම් නම් නව වසර සැබැවින්ම සුබ නව වසරක් වනු ඇත. නව වසර එකී අර්ථයෙන් සුබ කර ගැනීම සඳහා සටන් වැදීමට සූදානම් අරගල කිරීමට සූදානම් පැරණි මඟ අත්හැර නව මඟක් ගැනීමට සූදානම් සැමට ඒ සඳහා අපි නව වසරට සුබ පතමු.



# YES WE CAN

# උදාවී ඇත්තේ සටන්කොට ජයගත යුතු වසරකි

'2017 නව වසරේද සමාජවාදී තරුණ සංගමය ලෙස අප ඉදිරියේ පැවරී ඇති වගකීම් ප්‍රමාණය තවදුරටත් වැඩිවී ඇත',යන්න පැවසුවහොත් වඩා නිවැරදිය. වත්මන් රනිල් මෛත්‍රී හවුල් ආණ්ඩුව ලබාදුන් පොරොන්දු එකිනෙක බිඳදමමින් ඇත. තරුණයන්ට ලබාදුන් රැකියා පොරොන්දුව මුළුමනින්ම අතහැරදමා රැකියාවල නිරත පිරිසටද රැකියා අහිමි කිරීමේ ක්‍රියාවලියකට ආණ්ඩුව අතගසා ඇත.

තරුණ ප්‍රජාවට මුහුණදීමට වූ ගැටලු අතර බාහිර උපාධි කප්පාදුව ප්‍රධාන එකකි. ඊට එරෙහිව රට පුරා පැනනැගුණු විරෝධයන් හමුවේ ආණ්ඩුව විටින්විට ඒසඳහා බොරු පොරොන්දු ලබාදෙමින් ජනාධිපතිවරයාද, උසස් අධ්‍යාපන ඇමතිවරයාද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිශන් සභාව හා විශ්වවිද්‍යාල උපකුලපතිවරුන් යන අය එකිනෙකා මත වගකීම් පවරමින් ප්‍රශ්නය මඟහැර ගොස් ඇත. අයවැයෙන් සහන වෙනුවට පැනවූ බදු ක්‍රියාත්මක වීම දැන් ඇරඹී තිබේ. ධනේශ්වර පාලකයන්ගේ අදූරදර්ශී ආර්ථික වැඩපිළිවෙළ අද රට ගෙනගොස් ඇති තැනනම්, අප රටේ මුදල් ඒකකය වන රුපියල බාල්දුකර එය ලංකා ඉතිහාසයේ ඩොලරයට සාපේක්ෂව පත්ව ඇති පහළම අගයවන රු. 152 ත් ඉක්මවා යන මට්ටමක් උද්ගතවී ඇත.

මෙකී තත්වය හමුවේ තවදුරටත් ආණ්ඩුවට ඉතිරිව ඇත්තේ නව ලිබරල්වාදී ධනේශ්වර මාවතේ වඩාත්ම නරක ඉසව්කරා ගමන් කිරීමයි. ඒ අනුව දැනට රජය සතුව ඇති වරාය, රේගුව, ගුවන්තොටුපල, ආදායම්බදු දෙපාර්තමේන්තුව ආදී ආර්ථික මර්මස්ථාන පෞද්ගලික සමාගම්වලට විකුණා දැමීමට කටයුතු කරමින් ඇත. එමෙන්ම රටේ ඉතිරිවී ඇති ස්වභාවික සම්පත්වන 'පුල්මුඩේ ඛනිජ වැලි නිධිය, එප්පාවල පොස්පේට් නිධිය, කල්පිටිය දූපත් හා රටේ ඉඩම් අක්කර දහස් ගණනින්ද, බහුජාතික සමාගම්වලට පවරමින් ඇත. මේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අවශ්‍ය පරිදි කටයුතු කරමින් රටේ ආර්ථිකය හැසිරවීමේ ක්‍රියාවලියෙන් රජය මුළුමනින්ම ඉවත්වීමයි. මෙකී තත්වය අප රටේ ස්වෛරීත්වයට අතපෙවීම සදහා විදේශයන්ට ඉඩ විවර කර දීමක්ද වෙයි. හෙට දවසේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනයා තව දුරටත් මෙකී තත්වය හමුවේ පීඩාවට ලක්වන අතර ඊට එරෙහිව සටන්වැදීමටද ඔවුන් පසුබට නොවනු ඇත.

ඉහත සදහන් කල තත්වයන්ට අමතරව අප රටේ තරුණ ප්‍රජාවට සුවිශේෂිවන ගැටලු රැසකට දවත්මන් ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වය මඟපාදා ඇත. මෙකී තත්වය හමුවේ තරුණ ප්‍රජාව මෙන්ම රටේ සමාන්‍ය ජනයාද නිවැරදි සටන්කාමී තරුණ නායකත්වයක් ඉල්ලා සිටිනු නොඅනුමානය. ඉදින් සමාජවාදී තරුණ සංගමයේ අපට උදාවූ නව වසර තරුණ මෙන්ම පොදුජන සටන් රැසකට නායකත්වය දියයුතු අභියෝගාත්මක වසරක් වනු ඇත.

# තුන්වන පරපුරේ දේපළ වෙන්දේසිය





බ්‍රිතාන්‍යය අධිරාජ්‍යවාදීන් ලංකාවට නිදහස ලබාදී අදට 68 වසරකි. 1948 පෙබරවාරි 04 දින ශ්‍රී ලංකාවේ නිදහස් දිනය ලෙස සැලකුණ ද, 1947 මහ මැතිවරණයේ සිට ලංකාවේ පාලනය ලාංකිකයින් අතට පත්වෙයි. වරෙක කොළ ආණ්ඩුවක් ද, තවත් විටක නිල් ආණ්ඩුවක් ද වශයෙන් ලංකාවේ ජේත්තුකාර වලව් පන්තිකයෝ අද දක්වාම රට පාලනය කරති. සුද්දා රට භාරදී යන විට කුමන අභව්‍ය ලකුණු ඉතිරි කර ගියද ලංකාව රුපියලක් හෝ ණයබරෙන් තොර රටක් ලෙස පැවතුණි. එතැන් සිට අද දක්වා රට පාලනය කළ නිල්, කොළ ආණ්ඩු විසින් ශ්‍රී ලංකාවේ සමස්ත ණය ප්‍රමාණය, තේරෙන සිංහලෙන් කියතොත් එක් පුද්ගලයෙක් රුපියල් ලක්ෂ පහක් පමණ වනතෙක් ණය කොට ඇත. ඔබද මමද ඔබේ දුව පුතා ද, අනාගතයේ උපදින දරුවාද, ආසන්න වශයෙන් රුපියල් ලක්ෂ පහක ණයකරුවෙකි. ණය ගෙවීම සෙල්ලමක් නොවන්නේ රටේ සමස්ත වාර්ෂික ආදායමම ණය සහ පොලී වාරික ගෙවීමට මදි වූ තැන ආණ්ඩුව පහසු උත්තරයක් සොයා ගෙන තිබේ. ඒ රටේ සම්පත් වෙන්දේසියයි. නැතිනම් දේපළ විකුණා දැමීමයි.


ණය අර්බුදය ඉහටත් උඩින් යාමත්, එනිසා වන දේපල වෙළඳාමත් ගැඹුරින් සලකා බැලීම වටී. ලිබරල් සුභසාධනවාදී සමාජයක් වන ශ්‍රී ලංකාව අද අර්බුදයට යමින් තිබේ. මිනිසාගේ උපතේ සිට මරණය දක්වා උපරිමයෙන් පුද්ගල ජීවිතයට මැදිහත්ව සුභසාධන සේවා සැපයීම, සුභසාධක රාජ්‍යයට අයත් කාර්යය බව උගන්වනු ලැබේ. ආර්ථික හා සමාජ කටයුතු සඳහා රාජ්‍ය සෘජුව මැදිහත් වෙමින් සමාජයේ පීඩාවට පත් කොටස්වල භෞතික වර්ධනය වෙනුවෙන් ක්‍රියා කිරිම රාජ්‍යයේ වගකීම බව ඒ අනුව කියවේ. එහෙත් අද ආර්ථිකය සඳහා වන රාජ්‍ය මැදිහත්වීම අසාර්ථක වී ඇත. රාජ්‍ය ආයතන වංචා දූෂණ, නාස්තියෙන් හා අකාර්යක්ෂමතාවයෙන් පිරි ආයතන බවට පත්වී ඇති අතර ඒවා නඩත්තු කිරිමට වාර්ෂිකව විශාල මුදලක් වැය කිරිමට ආණ්ඩුවට සිදුවෙයි. මේ හේතුවෙන් එක් අතකින් ආර්ථික ක්‍රියාවලිය නොකඩවා පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රතිආයෝජන කිරිමට ආණ්ඩුවට නොහැකි වෙයි. අනෙක් අතින් දානපතියකු ලෙස පවත්වාගෙන එන සුභසාධන ක්‍රියාවලිය ද පවත්වාගෙන යාම ගැටලුවක් වෙයි. මෙම තත්වයට මුහුණදීම සදහා රාජ්‍ය අනුගමනය කරන හිඟ අයවැය ප්‍රතිපත්තිය හේතු කොටගෙන සිදුවුයේ එක් අතකින් උද්ධමනය ඉහළයාමත්, අනෙක් අතින් ජනතාව පීඩාවට පත් කරන්නා වු අතිරේක බදු, ජනතාවගේ හිස මත පතිත වීමත්ය. මෙකි ආර්ථික අර්බුදයට පිළියමක් ලෙස ලිබරල් දේශපාලන චින්තකයින් රාජ්‍ය හකුලුවාලීම පිළිබඳ අවධානය යොමු කරයි. සුභසාධන සේවා කපා හැරිම රාජ්‍ය සතු නිෂ්පාදන බෙදා හැරිම ඇතුළු ව්‍යාපාර පෞද්ගලික අංශයට පවරාදීම රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගතකරණය කිරිම ආදිය යෝජනාවන්නේ ඒ නිසාය. දූන් රනිල් වික්‍රමසිංහ නැමැති ලිබරල්වාදියා ලංකාව සම්බන්ධයෙන් යෝජනා කරන්නේ ද එයයි. දේපළ විකුණාදැමීම හෝ බදුදීම හෝ පෞද්ගලිකරණය හෝ ප්‍රතිව්‍යුහගතකරණය ආදි කුමන ලේබලයෙන් පැමිණියත් එන්නේ ලිබරල් රාජ්‍යයේ බැරි බැරියාවය. තියෙන සම්පත් විකුණාගෙන කා අද ජිවත්වීමේ සරල ක්‍රමය ආණ්ඩුව අපට යෝජනා කරයි. අනාගත පරපුරට අපේයැයි කීමට කිසිත් රට තුළ ඉතිරි නොකොට අපේ හදවත් පෞද්ගලික ව්‍යාපාරිකයන්ගේ මුදල් කුට්ටිවලට වෙන්දේසි කෙරෙන්නේ රටේ ඉඩම් හා පොදු දේපළ යන ජනතාවගේ ගැහෙන හදවත්ය.

වත්මන් ආණ්ඩුව හම්බන්තොට මාගම්පුර වරාය විකිණීමට පිඹුරුපත් සකසා අවසානය. හම්බන්තොට වරාය විකුණා දමන්නේ පාඩු ලබන නිසා බව ආණ්ඩුව කියයි. එසේ නම් කොළඹ වරායේ නැගෙනහිර ජැටිය විකුණන්නේ ඇයි? එය ලාභ ලබන තැනෙකි. ලාභ ලබන හා පාඩු ලබන සියලු තැන් විකිණීම ආණ්ඩුවේ අරමුණයි. හම්බන්තොට ඉඩම් අක්කර 15000ක් චීන ආයෝජකයන් සඳහා විකුණා දැමීමට යෝජනා කරයි. මීට අමතරව ආණ්ඩුවේ වෙන්දේසි සිට්ටුවේ පුල්මුඩේ ඛනිජ නිධිය ද ඇත. කහටගහ මිනිරන් පතලද වෙන්දේසියේ දමා ඇත. මෙකී දේපල වෙන්දේසියට එරෙහිව සැබෑ ලෙස අපේ රටේ සම්පත් රැකගැනීමේ අරගලය පෙරට ගැනීම යුගයේ කාරයභාරයක් බවට පත්ව තිබේ.

"අප අනාගතය හිමි පක්ෂයවන අතර අනාගතය හිමිකරුවෝ තරුණයෝය. අප නව දේ නිමවන්නන්ගේ පක්ෂයක්වන අතර වඩාත් ම ආශාවෙන් එබන්දන් සොයන්නෝ හැමවිටම තරුණයෝය. අප පැරණි දිරා යන දේට එරෙහිව දිවි පරදුවට තබා අරගල කරන පක්ෂය වන අතර පළමුවෙන්ම එබඳු අරගලයට සූදානම් වන්නෝ තරුණයෝය."

-එංගල්ස්












## බයෝ ඩීසල්

පසුගිය ජුලි මාසයේ ඔරුගොඩවත්ත රේගු අංගනයේදී බ්‍රසීලයෙන් ගෙන්වූ සීනි කන්ටේනරයක තිබී රුපියල් කෝටි 300කට ආසන්න කොකෙන් මත් ද්‍රව්‍ය තොගයක් අත් අඩංගුවට ගැනිණි. එය ලංකාවෙන් හමුවූ විශාලම වටිනාමකින් යුත් මත් ද්‍රව්‍ය තොගය බවට වාර්තා පළ විය. ජනාධිපතිවරයා පුද්ගලිකවම වැටලීම සිදුකළ ස්ථානයට ගොස් ඒවා පරීක්ෂා කර කියා සිටියේ ද මත් ද්‍රව්‍ය උවදුර සදහටම රටෙන් තුරන්කරන බවයි. මුදල් අමාත්‍යංශයට අනුයුක්තව තවත් විශේෂ මත් ද්‍රව්‍ය වැටලීමේ ඒකකයක්ද පිහිටුවනු ලැබිණි.

නමුත් ඉන් මාස කිහිපයක් ගෙවී යන්නටත් මත්තෙන් පසුගිය නොවැම්බර් මාසයේද එවැනිම ආනයනය කළ සිනි තොගයක් සමග තිබී කොකේන් මත් ද්‍රව්‍ය පාර්සල් 200 ක් හමුවිය.

පසුගිය පාලන සමයේද කුඩු කන්ටේනර් ගණන් අසුවූවා අපට මතකය. පාලනයන් මාරු වුවත් එම ක්‍රියාවලිය මාරු වී නොමැත. මත් ද්‍රව්‍ය යනු ධනවාදය වර්තමානයේ අධික ලෙස ලාභ උපයන ව්‍යාපාරයක් වී තිබේ. ලංකාවද එහි ජනතාවද අද එම ව්‍යාපාරයේ ගොදුරක් වී තිබේ. මෙම ජාවාරම පිටුපස බහු ජාතික සමාගමුත් එයට සම්බන්ධ දූෂිත දේශපාලඥයිනුත් සෘජු ලෙසම සම්බන්ධව සිටී. එහෙයින් මත් ද්‍රව්‍ය නැවත්වීමටනම් මේ පවතින ධනවාදී දේශපාලන ක්‍රමය වෙනස් කිරීම අනිවාර්යය වී තිබේ.

## අනතුරු අවම කිරීමට

පසුගියදා යාපනය චාවකච්චේරි නගරයේදි වෑන් රථයත් බස් රථයකුත් ගැටීමෙන් සිදුවූ රිය අනතුර සම්බන්ධයෙන් මුළු රටේම අවධානය යොමු විය. එම අනතුරෙන් 11 දෙනෙකු මිය යාමත් එයින් 07 දෙනෙකු එකම පවුලේ සාමපිකයන් වීමත් එයට එක් හේතුවක් විය.

රටේ මාර්ග අනතුරු ඉහළ යාම පිළිබඳව පුළුල් සංවාදයක් ඇති වී තිබෙන අතර පසුගියදා ඉදිරිපත්වූ අය වැය තුළින්ද යොජනා කර සිටියේ සිදුවන අනතුරු අවම කිරීම සඳහා රථ වාහන වැරදි සඳහා දඩ මුදල් විශාල ලෙස ඉහළ දැමීමයි. ඊට අමතරව ජාතික වැඩපිළිවෙළක් ලෙස කහ ඉර සුදු කිරීමේ වැඩ සටහනක්ද ක්‍රියාත්මක කෙරිනි. නමුත් අනතුරු සිදු වීම අඩු වූ බවක් නොපෙනේ.

දඩ ගැසීමෙන් වත්, පාරේ ඇති ඉරිවල පාට මාරු කිරීමෙන්වත් මාර්ග අනතුරු අඩුවන්නේ නැත. එයට මුළු මහත් සමාජ දේහයේම පරිවර්තනයක් අවශ්‍යය. ඒ තුළ මිනිස් ආකල්පවලද බරපතළ වෙනසක් සිදුවිය යුතුය. එකිනෙකා පරයමින් ඉලක්ක පසු පස පන්නන සමාජයක් වෙනුවට අනෙකා ගැන හිතන සියලු දෙනාට ආදරය කරන සමාජයක් බිහිවිය යුතුය.

## එළියක් ඕනෑ


විනිවිදින්නට අඳුර
මුළු ලොවම වෙලාගත්
කළු වළා තල්ලුකොට
හිරු වළා නැගෙනතුරු
ක්ෂිතිජයේ මායිම් පැන...
ලොවක් නිපැයුම් කළ
අරුත් සොයන්නට
පසාරු කළ හද
සොව නසා
හිනැහෙන්නට...
ඕනෑ කර තිබේ...
එලියක්
රවා ගොරවනවුන්
නිවා සනසනුවස්...

# අර්බුදයට විසඳුම අලුත් ව්‍යවස්ථාවක්ද?

වර්තමාන මෛත්‍රී - රනිල් හවුල් ආණ්ඩුව මේ වසරේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මතකර ගැනීමට යන බවට වන වාර්තා නිසා සමාජය තුළ ඒ පිළිබඳ සංවාදයක් මතුව තිබේ. මෙම යෝජිත නව ව්‍යවස්ථාව ගැන විවිධ පාර්ශව විවිධ විග්‍රහයන්ද ඉදිරිපත් කරනු පෙනේ. විශේෂයෙන්ම රාජපක්ෂ කල්ලියට අයත් අය තවමත් ව්‍යවස්ථාව නොදැක තිබියදීත් ඒ පිළිබඳ සිතින් මවාගත් කථා ප්‍රචාරය කරනුද පෙනේ. කෙසේ වෙතත් යෝජිත නව ව්‍යවස්ථාව පිළිබඳව වමේ හා ප්‍රගතිශීලී කඳවුරේ දෘෂ්ටියෙන් කරගත යුතු සැබෑ විග්‍රහයක්ද තිබේ. ඒ, විවිධ වර්ගයේ කෛරාටිකයින්ගේ සාවද්‍ය විග්‍රහවලින් නොමඟ නොයෑම සඳහාය.

ලංකාවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍යය යන්න පිළිබඳ විවාදයක් තිබිය නොහැක. මන්ද දැනට රට තුළ ක්‍රියාත්මක වන්නේ 1978දී ජයවර්ධන පාලනය විසින් ජනතා කැමැත්ත නොවිමසා සම්මත කර ගන්නා ලද, නව ලිබරල්වාදී දේශපාලන ගමන වෙනුවෙන් ධනපති රාජ්‍ය යාන්ත්‍රණය බලවත් කළ ඒකාධිපති ව්‍යවස්ථාව වන නිසාය. මෙම ව්‍යවස්ථාව ගතවූ කාලය තුළ දහනව වතාවක් සංශෝධනය කර ඇති අතර ඉන් සංශෝධන දෙකක් හැර ඉතිරි සියල්ලද ජනතාවට හානිකර හා ඒකාධිපති බලය වැඩිකරන වර්ගයේ ඒවා විය. විශේෂයෙන් මහින්ද රාජපක්ෂ පාලනය තුළ සම්මතකරගත් 18වැනි ව්‍යවස්ථා සංශෝධනය ඊට පෙර 17වන සංශෝධනය මගින් ගෙන ආ ස්වාධීන කොමිෂන් සභාවල බලයද අහෝසි කළ හා ජනාධිපති බලතල වැඩි කළ, තෙවන වරටත් එකම පුද්ගලයාට ජනාධිපතිවීමට මඟ පෑදූ එකක් විය. මෙරට ප්‍රජාතන්ත්‍රවාදය සවිමත් කිරීමේ අර්ථයෙන් ගෙන ආ සංශෝධන ඇත්තේ දෙකක් පමණි. ඒ 17වන සංශෝධනය හා 19වන සංශෝධනය වේ. ඒ දෙකම ජවිපෙ මූලිකත්වයෙන් හා දායකත්වයෙන් කරන ලද බලපෑම නිසා ගෙන ඒමට හැකිවූ සංශෝධන වන අතර එම සංශෝධන දෙකම ගෙන එනු ලැබුවේ ධනපති පංති පාලනය දුර්වලවී බලතුලනය වෙනස් වූ අවස්ථාවල එම විශේෂ අවස්ථා උපයෝගීකර ගනිමිනි. මේ තත්වය තුළ ලංකාවට ජයවර්ධනගේ ව්‍යවස්ථාව වෙනස්කර ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය වුව තව ශක්තිමත් කරන, ජනතාවගේ අයිතින් යම් පමණකින් හෝ තහවුරු වෙන ව්‍යවස්ථාවක් ගෙන ආ හැකිනම් එය නරක නැත.



"දේශපාලනයේදී ජනතාව, සැමදාමත් රැවටිල්ලට හා ආත්ම රැවටිල්ලට අඥාන ලෙස ගොදුරුවී ඇත. එමෙන්ම සියළුම සදාචාර, ආගමික, දේශපාලන හා සමාජ වදන්, ප්‍රකාශයන් හා පොරොන්දු පිටුපස තිබෙන කිසියම් හෝ අනෙක් පංතියක උවමනාවන් සොයා, තෝරා ගැනීමට ඔවුන් උගෙන ගන්නා තෙක්ම ඔවුන් එසේ තවදුරටත් රැවටෙනු ඇත."

**ලෙනින්**
**තෝ: කෘ:**
**1වැනි වෙළුම,**
**52 පිටුව**

තත්වය මෙසේ වුවත් රනිල් වික්‍රමසිංහ පාලනය මෙම නව ව්‍යවස්ථාව රටට හඳුන්වාදීමට උත්සාහ කරන්නේ ධනවාදයේ සමස්ත අර්බුදය විසඳන "කෝකටත් තෛලයක්" ලෙසය. ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණදී සිටින අතිශය ගැඹුරු සමාජ ආර්ථික, දේශපාලන හා සංස්කෘතික අර්බුදය තවත් ධනපති ව්‍යවස්ථාවකින් විසඳිය හැකියයි සිතන්නේ නම් එය විශාල මුලාවකි. මෙම ඒකාධිපති විකෘති සහගත ව්‍යවස්ථාව පවා එම ධනපති ක්‍රමයේ අර්බුදයේ ප්‍රකාශණයක් මිස එහි හේතුව නොවේ. ඒ නිසා ව්‍යවස්ථා වෙනස් කිරීමෙන් ධනවාදී ක්‍රමයේ අර්බුදයට කිසිදු විසඳුමක් ලැබෙන්නේ නැත. ලබාගත හැකි උපරිමය නම් ධනවාදයේ අර්බුදයට එරෙහිව සටන් වැදීම සඳහා ජනතාවට වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී ඉඩකඩ විවරකර ගැනීම පමණි. එබැවින් දැන් ලාංකේය ධනවාදයේ අර්බුදයට විසඳුම වන්නේ සමාජ ක්‍රමයේ වෙනසකි. එනම් නව සමාජවාදී සමාජක්‍රමයකි. එම සමාජවාදී සමාජක්‍රමය රකින සමාජවාදී ව්‍යවස්ථාවකි. එහෙත් රනිල් වික්‍රමසිංහලා ගෙනෙන නව ව්‍යවස්ථාව තවත් ධනපති ව්‍යවස්ථාවක් මිස අන් යමක් නොවේ. එය ඉතා පැහැදිලිය.

ධනවාදය තුළ නව ව්‍යවස්ථාවක් පිළිබඳව වමේ හා ප්‍රගතිශීලී සමාජ ව්‍යාපාරයන්ගේ ස්ථාවරය කෙසේවිය යුතුද? මෙය ඉතා හොඳින් නිරවුල්කරගත යුතු ගැටලුවකි. ලංකාවේ ධනපති ක්‍රමයේ අර්බුදයට තවත් එක් ධනවාදී ව්‍යවස්ථාවකින් විසඳුම් නොලැබෙන බවත් රට ඉල්ලා සිටින්නේ සමාජ පරිවර්තනයක් බවත් එය පළමුව තේරුම් ගත යුතුය. එසේම නව සමාජයක් වෙනුවෙන් විවිධ ජන බලවේග කරන අරගලයේදී ඒ සඳහා රට තුළ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් පුළුල්කර ගත හැකි නම් මිනිස් අයිතිවාසිකම් හා මානව හිමිකම් තහවුරුකර ගත හැකිනම්, ධනවාදී රාජ්‍ය යන්ත්‍රණයේ ඒකාධිපති ස්වරූපය වෙනස් කර ගත හැකිනම්, සමාජ පරිවර්තනයකට ඒවා වාසිදායක නිසා ඊට මැදිහත් විය යුතුය. ව්‍යවස්ථාව ධනපති වුවත් ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය දිනාගැනීමේ අර්ථයෙන් ඊට මැදිහත් විය යුතුය. එය දේශපාලන වරදක් වන්නේ නැත. ධනපති පංති බලය දුර්වලවී බලතුලනයන් වෙනස්වන සමහර අවස්ථාවල ලැබෙන සීමිත ඉඩකඩ තුළින් එවැනි දේ දිනාගත හැකි අවස්ථා මතුවූ විට ඒවා දිනාගැනීම කළයුතුය. අප 17 වන සංශෝධනය ඇතිකර ගන්නේත්, 19වන සංශෝධනයට දායක වූයේත් මේ තත්වයන් යටතේ ඉහත ස්ථාවරයන් මත පිහිටාය.

එය එසේ වුවත් අර්බුදයට ගිය ධනපති පංතියේ පැත්තෙන් බලනවිට සැබෑලෙස පවතින්නේ මෙහි ප්‍රතිවිරෝධයයි. ධනපති පංතිය ධනවාදය තුළ තමන්ද අර්බුදයට පත්ව ඇති නිසා බරපතළ ප්‍රතිවිරෝධයක පවතී. ධනපති පාලනය කථා කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදය පුළුල්කිරීම ගැනය. බලය විමධ්‍යගතකිරීම ගැනය. මානව හිමිකම්, මාධ්‍ය නිදහස රැකීම ගැනය. එහෙත් ඔවුන්ගේ භාවිතාව සකස්වී තිබෙන්නේ, ධනවාදී අර්බුදය ඔවුනට බලකර සිටින්නේ ප්‍රජාතන්ත්‍රවාදය අහිමිකිරීමට හෝ සීමා කිරීමටය. බලය කේන්ද්‍රකර ගැනීමටය. මානව හිමිකම් උල්ලංඝනය කිරීමට හා මාධ්‍ය නිදහස සීමාකිරීමටය. මේ ප්‍රතිවිරෝධය දැන් අප හමුවේ දිග හැරෙමින් තිබේ. වයිෆයි කලාප රටපුරා ඇතිකොට තරුණ පරපුරට අන්තර්ජාල පහසුකම් නොමිලේ දෙන බවට පම්පොරි ගැසූ ආණ්ඩුව අන්තිමට නතරවූයේ මෙවර අයවැයෙන් අන්තර්ජාලය සඳහා 25%ක බද්දක් පනවමිනි. බලතල විමධ්‍යගත කිරීමට කථාකරන, පාර්ලිමේන්තුව තුළ විවිධ කමිටු ගොඩ නගා බලය කේන්ද්‍රගත වීම වැළැක්වීමට කථාකරන ආණ්ඩුව ක්‍රියාවෙන් සිදුකර ඇත්තේ සියලු බලතල එක් තැනකට ඒකරාශිවන සුපිරි විධායක ඇමති තනතුරක් සෑදීමට පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීමය. මූලික අයිතීන් රැකීමට කථාකරන ආණ්ඩුව උද්ඝෝෂණවලදී ඒවාට හමුදාව පවා යොදවා පහරදෙන අතර උද්ඝෝෂකයන් අධිරණයට ගෙන යාම සඳහා අධිකරණයෙන් නිතර වාරණ නියෝගයන්ද ලබා ගනී. මේ ධනපති පාලනයේ කථාව හා ක්‍රියාව අතර වන ප්‍රතිවිරෝධය තේරුම්ගත හැකි උදාහරණ කීපයක් පමණි.

> නව ව්‍යවස්ථාව සඳහා වන සංවාදය ජාතිවාදය අවුළුවන සංවාදයක් බවට පත්ව පංති අරගලය හා සමාජ වෙනසක් සඳහා වන සංවාදය යට කරන්නේ නම් ඊට ඉඩ නොදීමටත් ඒ අතරම ව්‍යවස්ථාවක් සකස්කරන්නේ නම් ඉන් ජනතාවට යමක් දිනා ගැනීමටත් කටයුතු කිරීම පොදු ජනතාවගේ පැත්තෙන් කළ යුතු වේ.

සැබෑලෙසම ගත් විට අර්බුදයට ගිය දුර්වල ධනපති පාලනයට ජනතාව සඳහා ප්‍රජාතන්ත්‍රවාදය (එය ඔවුන්ගේ දුර්වලකම උපයෝගිකර ගෙන උදුරා ගත්තොත් මිස) ලබා දිය නොහැක. වත්මන් ආණ්ඩුවේ ඇත්ත අභිලාෂය වන්නේ ඔවුන් ක්‍රියාවට නැගීමට යන නව ලිබරල්වාදී ප්‍රතිපත්ති බාධාවකින් තොරව ක්‍රියාවට නැගිය හැකි ලෙස රාජ්‍ය බලය කේන්ද්‍රගතකර ගැනීම හා බලය වැඩිකර ගැනීමය. ඊට එරෙහිවන ජනතා බලවේග බියට පත්කිරීම හා මර්දනය කිරීමය. එම නිසා ධනපති පංතිය සිය කැමැත්තෙන් තම බලය දුර්වල කරගනිමින් ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන්නේය යන මිථ්‍යාවට කිසිවෙකුත් රැවටිය යුතු නැත.

යෝජිත නව ව්‍යවස්ථාව සම්බන්ධයෙන් ධනපති පංතියේ ක්‍රියාමාර්ග හා හැසිරීම කෙසේ විය හැකිද? රනිල් වික්‍රමසිංහ පාර්ශවය නව ව්‍යවස්ථාව දෙස බලන්නේ කුමන අර්ථයකින්ද? මෙය වටහා ගැනීම දුෂ්කරම නැත. වික්‍රමසිංහ කණ්ඩායමට නව ව්‍යවස්ථාව අවශ්‍ය වන්නේ කරුණු කිහිපයක් සඳහාය. ඉන් එකක් නම් බටහිර රටවලට එය පෙන්වා ණය ටිකක් ගැනීමටත් එ.ජා. මානව හිමිකම් කොමිසමට පෙන්වා කලින් සම්මතවී ඇති පරීක්ෂණ පිළිබඳ යෝජනාව පස්සට දාගැනීමටත්ය. මෙම වසරේ ජිනීවාහිදී එ.ජා. මානව හිමිකම් කොමිසම රැස්වන අතර ඊට පෙර ව්‍යවස්ථාවේ කෙටුම්පතක් හෝ ප්‍රසිද්ධ කිරීම අත්‍යාවශ්‍යය. ඒ මානව හිමිකම් කොමිසමෙන් ගැලවීමටය. ඒ අනුව යෝජිත ව්‍යවස්ථාව විදේශ බලවේගයන් සතුටු කරන්නක්ද වේ.

අනෙක් අතට නව ව්‍යවස්ථාවක් ඉදිරිපත්කර සම්මත කර ගතහොත් එය මෙම දුර්වල හවුල් පාලනය ලද ජයග්‍රහණයක්ද වේ. එය ආණ්ඩුවට හොඳය. රටේ දැවෙන ප්‍රශ්න ටික කලෙකට හෝ ව්‍යවස්ථාවට යටකර දැමිය හැකිය. අලුත් ව්‍යවස්ථාවෙන් ප්‍රශ්න විසඳේ යැයි ජනතාව තුළ කෙටි කාලීන හෝ බලාපොරොත්තුවක් ඇතිකළ හැකිය. එසේම නව ව්‍යවස්ථාවක් තුළින් උපක්‍රමිකව තමන් සතුව නොපවතින බලය තමන් වෙත තහවුරු කර ගැනීමටද 'අගමැති' රනිල් වික්‍රමසිංහ කල්පනා කරනවා විය හැක.

15 වැනි පිටුවට

# සමුදීමක් නොවන්නට




ෆිදෙල් කැස්ත්‍රෝ යනු ඒකාධිපති පාලකයෙකු බවත් ඔහුගේ මරණින් පසු කියුබානු ජනතාවට නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය හිමි වනු ඇති බවත් ඇමරිකානු ජනාධිපතිවරණයෙන් ජයගත් ඩොනල්ඩ් ට්‍රම්ප්, ෆිදෙල් සහෝදරයාගේ මරණය සැලවීමත් සමග ප්‍රකාශයක් නිකුත් කරමින් පවසා සිටියේය. ට්‍රම්ප් එසේ පැවසුවද ඔහුට වඩා බලසම්පන්න  ඇමරිකානු ජනාධිපතිවරුන් 11දෙනෙක් තම ධුරකාලයන් තුළදී එක්කෝ ෆිදෙල් ඝාතනය කිරීමට හෝ නැතිනම් ඔහු බලයෙන් පහ කිරීමට උත්සහ කළද ඒ සියල්ල අසාර්ථක විය.

ට්‍රම්ප්ලාගේ පංතියේ නිදහසට සීමා පමුණුවන, ඔවුන්ගේ සූරාකෑමට බාධා පමුණුවන ෆිදෙල්ලා සැබැවින්ම ඔවුනට ආඥාදායකයෙක්, ඒකාධිපතියෙක් විය. එය එසේ වෙද්දී ට්‍රම්ප්ලාගෙන් සූරාකෑමට ලක්වන පොදු ජනතාවට ෆිදෙල් සැබෑ විමුක්තිදායකයෙක් විය.

ෆිදෙල් සහෝදරයාගේ අභාවයත් සමගම මෙරට තුළ ක්‍රියාත්මක වන නොයෙකුත් සංවිධාන, දේශපාලන පක්ෂද ෆිදෙල් සැමරුම් සංවිධාන කළද ඒ බොහොමයක් සංවිධාන හා දේශපාලන පක්ෂ පය තබා ඇත්තේ ෆිදෙල් සැමදාමත් එරෙහි වූ  සූරාකන්නන්ගේ පිලෙහි වීම හාස්‍යජනකය.

මේ සියලු තත්වයන් මැද ෆිදෙල් සැමරුමකට සැබෑ අයිතිය ඇති ශ්‍රී ලංකාවේ එකම දේශපාලන ව්‍යාපාරය වන ජනතා විමුක්ති පෙරමුණද "ආදරණීය ෆිදෙල්, සමුගැනීමක් නොවේ" යනුවෙන් සැමරුම් උත්සවයක් දෙසැම්බර 04 වෙනිදා කොළඹ විහාර මහා දේවී උද්‍යානයේදී පවත්වන ලදී. කියුබාවේ සැන්තියාගෝ නුවර ෆිදෙල් සහෝදරයාගේ භෂ්මාවශේෂ තැන්පත් කිරීමේ උත්සවයට සමගාමීව මෙම සැමරුම් උත්සවය පවත්වන ලද අතර මේ අවස්ථාවට ජ.වි.පෙ. නායක අනුර දිසානායක, ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, ප්‍රචාරක ලේකම් විජිත හේරත්, ජාතික සංවිධායක බිමල් රත්නායක යන සහෝදරවරුන් ඇතුළුව ජ.වි.පෙ සාමාජික සාමාජිකාවෝ රාශියක් සහභාගි වී සිටියහ.

මෙයට අමතර මේ අවස්ථාව සඳහා  කියුබානු තානාපතිනි හෙලේනා රාමෝස් සහෝදරිය, ප්‍රවීන කලාකරුවන් , ලේඛකයන්, විශ්ව විද්‍යාල ආචාර්යවරුන්, විද්වතුන් ඇතුළු පිරිසක්ද සහභාගිවී සිටියහ.

# අහසින් පොළොවට




වසරේ නොයෙක් දිනයන්හි විවිධ කලා උළෙලවල් පැවැත්වෙන ආකාරය අප දැක ඇත්තෙමු. ඒ බොහෝ කලා උළෙලවල් පිටුපස ඇත්තේ බහු ජාතික හෝ දේශීය සමාගමකි. ඒ නිසාම එම සමාගම්හි වානිජ වුවමනා සමග ගැටෙන කිසිදු නිර්මාණයක් හෝ පුද්ගලයෙකු එවැනි උළෙලවලදී සම්මානයට පාත්‍ර නොවේ; ඇගයීමකට ලක් නොවේ.

දසවෙනි වරටත්  ජාතික වෘත්තිය සමිති මධ්‍යස්ථානයේ සාහිත්‍ය අනු කමිටුව විසින් සංවිධානය කරන ලද "දහදිය සිත්තම" වැඩ කරන ජනතා කලා උළෙල බිහි වන්නේ මෙවන් වටපිටාවක් තුළය. කලාව, සාහිත්‍ය වැඩ කරන ජනතාවට අකැප දේ ලෙස නම් කර ඇති සමාජයක එය එසේ නොවන බවට සමාජයට ඒත්තු ගැන්වීමට ජ.වි.පෙ.ට අනුබද්ධ  ජාතික වෘත්තිය සමිති මධ්‍යස්ථානය වාර්ෂිකව සංවිධානය කරනු ලබන මෙම කලා උළෙල සැබැවින්ම උඩුගම් බලා පිහිනීමක් බඳුය. වසර දහයක් පුරා අඛණ්ඩව මෙවෙනි උළෙලක් පැවැත්වීමද අභියෝගාත්මක කාරණාවක් විය.

වඩා මානවවාදී සමාජයක් ගොඩ නැගීමේදී කලාව හා සාහිත්‍ය අනිවාර්යය. එක්සත් ජාතික පක්ෂයේ පතාක යෝධයෙකු වූ ජේ.ආර්. ජයවර්ධන පාසැල් විෂය මාලාවෙන් සාහිත්‍ය විෂය ඉවත් කරනු ලැබුවේද කුමන වර්ගයේ සමාජයක් ගොඩනැගීමටද යන්න ඉතා පැහැදිලිය. එනිසාම වඩා යහපත් සමාජයක් ගොඩ නැගීම සඳහා ක්‍රම වෙනසක් සිදු විය යුතු වුවත් එම ක්‍රම වෙනස සිදු කරන්නට දායක වන්නන් වඩා මානවවාදී ගුණාංගයන් ගෙන් යුක්ත වූවන් බවට පත් කිරීමටද සාහිත්‍යය හා කලාව ඉවහල් වේ. 'දහදිය සිත්තම' කලා උළෙලේ එක් අරමුණක් වන්නේද වැඩ කරන ජනතාවගේ නිර්මාණශීලීත්වය ඉහළ තලයකට ඔසවා තැබීමයි.

මෙවන් තත්වයක් තුළ ජාතික වෘත්තිය සමිති මධ්‍යස්ථානය දසවෙනි වරටත් සංවිධානය කරන ලද "දහදිය සිත්තම" වැඩ කරන ජනතා උළෙල පසුගිය දෙසැම්බර් 20 වෙනිදා මරදාන ටවල්හෝල් රඟහලේදී උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි.

රාජ්‍ය, අර්ධ රාජ්‍ය, වතු සහ පෞද්ගලික අංශයෙන් නිර්මාණ ඉදිරිපත් කර ජයග්‍රහණය ලැබුවන්ට මෙහිදී තෑගි සහ සහතික පත් ප්‍රදානය කිරීම සිදු කරන ලදී.  ජාතික වෘත්තිය සමිති මධ්‍යස්ථානයේ සභාපති කේ.ඩී. ලාල්කාන්ත, සාහිත්‍ය අනුකමිටුවේ සභාපති චන්දන සූරියාරච්චි ඇතුළුව වෘත්තීය සමිති නියෝජනය කරන සහෝදර සහෝදරියන්ද, කමල් පෙරේරා, බුද්ධදාස ගලප්පත්ති, ප්‍රසන්ජිත් අබේසූරිය, දීපානි සිල්වා, ජගත් චන්ද්‍රසිරි, රමණී ෆොන්සේකා, ඇන්තනි ජීවා ආදී කලාකරුවෝ රැසක්ද මේ අවස්ථාවට සහභාගි වූහ.

# පොහොරත් නැහැ, මුදලත් නැහැ

ශ්‍රීට මාස කිහිපයකට පෙර කෘෂිකර්ම අමාත්‍යංශය විසින් රුපියල් මිලියන 21ක් වියදම් කර කුලී පදනම මත ගොඩනැගිල්ලක් ලබා ගන්නා ලදී. එසේ අධික මිල ගණන්වලට ගොඩනැගිලි ලබා ගත්තද රටේ කරුණු කාරණා සිදුවන්නේ කෘෂිකර්මය පිළිබඳ අමාත්‍යංශයක් නොමැති ගාණටය.

යහපාලන ආණ්ඩුව ඉතිහාසයේ පැවති ආණ්ඩුවලට සාපේක්ෂව අසාර්ථකම ආණ්ඩුවත් බවට පත්ව වෙමින් යන බව බලයට පත්ව වසර දෙකක් ඉක්ම යන්නට මත්තෙන්ම ඔප්පු කරමින් සිටී. රනිල් - මෛත්‍රී හවුලේ බල අරගලයත්, එකිනෙකා පරදා හොරා කෑමේ අරගලයත් හැරෙන්නට මේ දෙපාර්ශවයටම රට වෙනුවෙන් යමක් කිරීමට කිසිදු වුවමනාවක් නොමැති වී බව රටේ ජනතාව හමුවේ තහවුරු වී හමාරය. රටේ සෑම ක්ෂේත්‍රයක්ම පිරිහීමට පත් ව තිබේ.

සෞඛ්‍ය, අධ්‍යාපන, ප්‍රවාහන, වෙළඳ, ක්‍රීඩා  ආදී ක්ෂේත්‍රයන් මෙන්ම කෘෂිකාර්මික ක්ෂේත්‍රයද දරුණු බිඳ වැටීමකට ලක්ව ඇත. වී වගාව සම්බන්ධයෙන් මතුව ඇති ගැටලුකාරී තත්වයන් අධ්‍යනය කිරීමෙන් මේ බව වඩා හොඳින් අවබෝධ කර ගත හැක.

වී වගාව සම්බන්ධයෙන් මතුව ඇති ආසන්නතම ගැටලුව වී ඇත්තේ මේ වන විට මහ කන්නය වගා කටයුතු ආරම්භ වී තිබුණද ආණ්ඩුව මගින් පොහොර ලබා ගැනීම සඳහා ලබා දෙන මුදල් තවමත් ගොවීන්ට නිකුත් කර නොතිබීමයි. මේ තත්වය තුළ නිසි කලට පොහොර නොදැමීම නිසා අස්වැන්නට වන හානිය පිළිබදව ගොවීහු දැඩි නොසන්සුන්තාවයකට පත්ව තිබේ.

මේ සහනාධාර මුදල් ගොවීන්ට ලබා නොදීම සම්බන්ධයෙන් පසුගිය දෙසැම්බර් හයවෙනිදා ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා ස්ථාවර නියෝග 23/2 යටතේද පාර්ලිමේන්තුවේදීද ප්‍රශ්න කිරීමක්ද සිදු කරන ලදී. එසේම සමස්ත ලංකා ගොවිජන සම්මේලනයද සහනාධාර මුදල් කඩිනමින් ලබා දෙන ලෙස ආණ්ඩුවට බල කරමින්  විරෝධතා මාලාවක් සංවිධානය කළ අතර  එහි එක් විරෝධතාවයක් පසුගිය දෙසැම්බර් හත්වෙනිදා විශාල ගොවි ජනතාවකගේ සහභාගීත්වයෙන් අම්පාර නගරයේදී පැවැත්විණි. මේ විරෝධතාවය ඉතා සාර්ථකව පැවැත්වුණු අතර මේ අවස්ථාව සඳහා සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ ජාතික සංවිධායක නාමල් කරුණාරත්න, ජ.වි.පෙ. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී වසන්ත පියතිස්ස ඇතුළු ගොවි නායකයෝ රැසක්ද සහභාගි වූහ




# පලස්තීනයට සහයෝගය




රටවල් බෙදා වෙන් කිරීම අධිරාජ්‍යවාදීන්ගේ මූලික උපක්‍රමයකි. එම බෙදා වෙන් කිරීම මගින් එම රටවල් සූරාකෑමට ලක් කිරීම මෙන්ම එම පිහිටවන නව දේශ සීමා අතර යුද ගැටුම් ඇති කර  ආයුධ වෙළඳාම තුළින් තම මඩි තද කර ගැනීමද ඔවුන්ගේ සූරාකෑමේ ව්‍යපෘතියේ එක් පියවරකි.

1947 දී එක්සත් ජනපදයේ මැදිහත්වීම ඇතිව එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පලස්තීනය නම් ස්වාධීන රාජ්‍යය තුළ ඊශ්‍රායලයක් නම් කරනු ලබන්නේ මෙම බෙදුම්වාදී ක්‍රියාවලියේ තවත් පියවරක් ලෙසය. එහෙත් අරාබියකරය තුළ ඇමරිකානු වුවමනාවන් නියෝජනය කරන ඊශ්‍රායලය ගෙන යන යුදමය ක්‍රියාමාර්ග හේතුවෙන් පලස්තීනයට තමන්ට අයත් භූමි ප්‍රමාණය අහිමි වෙමින් තිබේ.

මේ වන විට එක්සත් ජාතීන්ගේ සංවිධානය නියෝජනය කරන රටවලින් බහුතරයක් පලස්තීනය ස්වාධීන රාජ්‍යයක් ලෙස පිළිගෙන තිබේ.

එය එසේ වුවද පලස්තීනයට සහය පළ කරමින් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ගෙන එන ලද යෝජනාවකට එරෙහිව ඡන්දය ප්‍රකාශ කිරීමට යහපාලන ආණ්ඩුවේ විදෙස් කටයුතු අමාත්‍යංශයේ නිලධාරීන් විසින් කටයුතු කර තිබේ. ජ.වි.පෙ. ට අනුබද්ධ සමාජවාදී තරුණ සංගමය දිර්ඝ කාලයක සිට ස්වාධීන පලස්තීනයක් වෙනුවෙන් තම සහෝදරාත්මක සහයෝගය දක්වමින් සිටී.

නොවැම්බර් 29 දාට යෙදෙන පලස්තීන සහයෝගිතා දිනයට සමගාමීව පලස්තීනයට සහය පළකරමින් සමාජවාදී තරුණ සංගමය දිවයින පුරා වැඩසටහන් මාලාවක් සංවිධානය කර තිබු අතර එහි එක් පියවරක් ලෙස මහජන පෙත්සමක් කොළොන්නාව සහ කඩුවෙල යන නගරවලදී අත්සන් කරන ලදී.

එයට අමතරව කොළඹ මාලිගාවත්තේ  YMMA ශාලාවේදී පසුගිය දෙසැම්බර් දෙවෙනිදාද පලස්තීන සහයෝගිතා වැඩ සටහනක් තරුණ සංගමය විසින් සංවිධානය කරන ලද අතර මේ අවස්ථාව සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති, සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා ඇතුළුව විශාල පිරිසක් සහභාගි වී සිටියහ.

**ධනවාදයේ ආර්ථික අර්බුදය යළිත් වටයකින් ලෝකය ගිලගෙන තිබේ. එය මීට පෙර ධනවාදය මුහුණ දුන් අර්බුදයන්ට වඩා ගැඹුරු හා පැතිරුණු එකකි. ධනේශ්වර පාලකයින් එයට මුහුණ දීමට සූදානම් වන්නේ, කප්පාදු වැඩපිළිවෙළවල් හඳුන්වා දීමෙනි. සහන කප්පාදුව හමුවේ පීඩාවට පත්වන ජනතාව මෙම අර්බුදයන්ට සැබෑ විසඳුම සමාජවාදය බව ඉක්මණින් හෝ පසුව තේරුම් ගනු ඇත.**

**ධනවාදයේ අර්බුදයට ස්ථිර සාර විසඳුම ඇත්තේ සමාජවාදය තුළ පමණි. එසේ වුවද සමාජවාදය පිළිබඳ මේ මොහොතේ පවතින වැරදි හා මිත්‍යා මත විසින් සමාජවාදය පිළිබඳ උනන්දුවක් දක්වන පිරිස් තුළ පවා සමාජවාදය පිළිබඳ සැක සංකා මතුකර තිබේ.**

**සමාජවාදය පිළිබඳව පවතින මෙම මිත්‍යා හා වැරදි මතවලට පිළිතුරු සැපයීම මේ මොහොතේ අවශ්‍යතාවයක්ව පවතී. ඒ වෙනුවෙන් අද සිට ලිපි පෙළක් ආරම්භ කිරීම 'නියමුවා' තීරණය කළේ එබැවිනි. සමාජවාදය පිළිබඳව වන මෙම කතිකාවත පෝෂණය කිරීම සඳහා ඔබගේ අදහස්ද අපි ඉතා අගය කොට සලකමු.**

# සමාජවාදය තුළදී...



## සියලු දේපළ රජයට පවරා ගන්නේද?

සමාජවාදය පිළිබඳ පැතිරී ඇති විවිධ වැරදි හා මිත්‍යා මත විසින් මතුකර ඇති, නිතර අසන ප්‍රශ්නයක් වන්නේ සමාජවාදය තුළදී සියලු දේපළ රජයට පවරා ගන්නවාද යන පැනයයි. සමාජවාදය පිළිබඳ වැරදි මත පතුරුවන්නන් විසින් ජනතාවගේ ඇතැම් කොටස් තුළ තහවුරු කර ඇත්තේ, සමාජවාදය තුළදී අපගේ ගේ දොර, යානවාහන, ඉඩකඩම්, ගෘහ උපකරණ ආදී සියලු දේ කිසිවක් ඉතිරි නොකරම පවරා ගන්නා බවකි. එහෙත්, මේ පිළිබඳ සත්‍යය කුමක්ද?

මිනිසෙකුට තම ශ්‍රමයේ ඵලයක් වශයෙන් පෞද්ගලිකව අයිතිකර ගත හැකි දේපළ අයිතිය අහෝසි කරන්නේය යන්න කොමියුනිස්ට්වාදීන්ට ආරම්භයේ සිටම එල්ල වූ දෝෂාරෝපණයකි. එකී චෝදනාවට මාක්ස් හා එංගල්ස් කොමියුනිස්ට් ප්‍රකාශනයෙන් පිළිතුරු දී තිබුණේ මේ ආකාරයටයි.

"අමාරුවෙන් දිනාගත්, ස්වයං උපාර්ජිත, ස්වයං ශ්‍රමයෙන් ලබාගත් දේපොළ! ඔබ කියන්නේ ධනවාදී දේපොළ ක්‍රමයට පෙර පැවති කුඩා හස්ත කර්මාන්ත ශිල්පියාගේ සහ ගොවියාගේ දේපොළ ගැනද? එම දේපොළ විනාශ කිරීමට අපට කිසිදු උවමනාවක් නැත. කර්මාන්ත සංවර්ධනය විසින් අති විශාල වශයෙන් මෙය විනාශ කර ඇත. එය දැනටමත් එය විනාශ කරමින් සිටී." (පිටුව 50)

ධනවාදයට පෙර පැවති මිනිසෙකු තම ශ්‍රමයේ ඵලයක් වශයෙන් පුද්ගලිකව අයිති කරගත් දේපළ අයිතිය අහෝසි කර දමන ලද්දේ ධනවාදය විසිනි; මහා පරිමාණ කර්මාන්තය විසිනි. එමඟින් කුඩා හස්ත කර්මාන්ත ශිල්පියා සහ කුඩා ගොවියා බංකොලොත්භාවයට ඇද දමන ලදී. ඔවුන් වැටුප් ශ්‍රමිකයන් බවට පත් කරන ලදී. ඒ අනුව ධනවාදයට පෙර පැවති මිනිසෙකු තම ශ්‍රමයේ ඵලයක් වශයෙන් පුද්ගලිකව අයිති කර ගත් දේපොළ අයිතිය අහෝසි කර දැමීම වරදක් නම් එහි වරද භාර ගත යුත්තේ ධනපති ක්‍රමයමය.

## සමාජවාදය යනු කුමක්ද?

දේපළ පිළිබඳ නිවැරදි වැටහීමකට සමාජවාදය යනු කුමක්දැයි නිවැරදිව වටහා ගැනීමට අත්‍යාවශ්‍ය වේ. සමාජවාදය නිශ්චිත සමාජ ක්‍රමයක් නොවේ. එය සංක්‍රමණීය අවධියකි. ධනවාදයේ සිට කොමියුනිස්ට් ක්‍රමය දක්වා වූ සංක්‍රමණීය අවධිය සමාජවාදයයි. එබැවින් සමාජවාදය තුළදී ධනවාදයේ අංග ලක්ෂණත් කොමියුනිස්ට් ක්‍රමයේ අංග ලක්ෂණත් එක විට පවතී.

සමාජවාදයේදී ප්‍රධාන දේපළ වර්ග තුනක් හමුවේ. ඒවා නම්,

1 රාජ්‍ය දේපොළ
2. සාමූහික දේපොළ
3. පෞද්ගලික දේපොළ

සමාජවාදී රාජ්‍යයක රජය සතුව පවත්නා කර්මාන්ත ව්‍යවසායයන් සහ ආයතන මගින් රාජ්‍ය දේපොළ සෑදේ. (මේ පිළිබඳව මෙම ලිපිය තුළදී තවදුරටත් කරණු සාකච්ඡා කෙරේ)

සාමූහික දේපළවලට අයත් වන්නේ, ගොවීන්, කුඩා හා හස්ත කර්මාන්තකරුවන් විසින් ස්වේච්ඡා පදනමින් ගොඩනගා ගනු ලබන සමුපකාරයන්ට අයත් දේපළයි. එම දේපොළ අයිති වන්නේ රජයට හෝ ජනතාවට හෝ නොවේ. ඒවායේ අයිතිය හිමිවන්නේ එකී සමුපකාරවලට ස්වේච්ඡාවෙන් සම්බන්ධ වන ජන කොටස්වලට පමණි.

සමාජවාදී සමාජයකදී පෞද්ගලික දේපළද පවතී. කර්මාන්තකරුවන්, ව්‍යාපාරිකයින්, ගොවීන් ආදී ජන කොටස්වලට අයිති කර්මාන්තශාලා, ව්‍යවසායයන්, ගොවිබිම් ආදිය ඊට අයත්වේ.

එක් එක් සමාජවාදී රටක මෙම දේපොළ වර්ග කුමන සංයුතියකට අනුව, කුමන අනුපාතයකට අනුව පවතින්නේද යන්න තීරණ වන්නේ, එකී රට සමාජවාදය වෙත එළඹෙන මොහොතේ එය පැවති සංවර්ධන මට්ටම අනුවය. ඒ අනුව කිසියම් රටක රාජ්‍ය දේපොළවල සංයුතිය අනෙක් දේපළවල සංයුතියට වඩා වැඩි වෙද්දී තවත් රටක පෞද්ගලික දේපොළවල සංයුතිය සෙසු දේපොළවල සංයුතියට වඩා වැඩි විය හැකියි.

## දේපොළ යනු මොනවාද?

මාක්ස්වාදයට අනුව සෑම භාණ්ඩයක්ම හෝ සෑම දෙයක්ම දේපොළක් නොවේ. යම් කිසි භාණ්ඩයක් හෝ දෙයක් දේපොළක් බවට පත්වන්නේ එමගින් තවෙකෙකුගේ ශ්‍රමය සූරාකෑමක් සිදු කරන්නේ නම් පමණි. මේ අනුව ගේ දොර, යාන වාහන, ගෘහ උපකරණ වැනි පරිභෝජන භාණ්ඩ මාක්ස්වාදී අර්ථයෙන් දේපොළ ගණයට නොවැටේ.

ධනවාදී දේපොළ බිහිවූයේ කුඩා හස්ත කර්මාන්ත ශිල්පියාගේ කුඩා ගොවියාගේ දේපොළ බිහි වූ ආකාරයට නොවේ. ධනවාදී දේපොළ බිහි වූයේ ධනපතියාගේ පුද්ගලික ශ්‍රමයේ ඵලයක් හැටියට නොවේ. වර්තමානයේ දී ධනවාදී රටවල පවතින මහා පරිමාණ ධනපති කර්මාන්තය සහ ව්‍යවසායයන් බිහිවූයේ වැටුප් ශ්‍රමිකයාගේ නිර්ධනයාගේ ශ්‍රමයෙනි.

මාක්ස් හා එංගල්ස් ඒ පිළිබඳව කොමියුනිස්ට් ප්‍රකාශනයේදී මෙසේ පවසති.

"එහෙත් වැටුප් ශ්‍රමය

> ධනවාදයට පෙර පැවති මිනිසෙකු තම ශ්‍රමයේ ඵලයක් වශයෙන් පුද්ගලිකව අයිති කරගත් දේපළ අයිතිය අහෝසි කර දමන ලද්දේ ධනවාදය විසිනි; මහා පරිමාණ කර්මාන්තය විසිනි. එමඟින් කුඩා හස්ත කර්මාන්ත ශිල්පියා සහ කුඩා ගොවියා බංකොලොත්භාවයට ඇද දමන ලදී. ඔවුන් වැටුප් ශ්‍රමිකයන් බවට පත් කරන ලදී.

නිර්ධනයාගේ ශ්‍රමය ඔහුට කිසියම් දේපොළක් නිර්මාණය කරයිද? කොහෙත්ම නැත. එය නිර්මාණය කරන්නේ ප්‍රාග 'ධනයයි. එනම්, එය වැටුප් ශ්‍රමය සූරාකන දේපොළ නිර්මාණය කරයි...

ධනපතියෙකු වීමට නිෂ්පාදනයෙහි හුදෙක් පුද්ගලික තත්වයක් පමණක් නොව සමාජමය තත්වයක්ද අවශ්‍ය වෙයි. ප්‍රාග්ධනය සාමූහික ඵලයකි. එය නිර්මාණය කොට ක්‍රියා කරවීමට හැක්කේ සමාජයේ සාමාජිකයන් බොහෝ දෙනෙකුගේ ක්‍රියාකාරීත්වය තුළින් පමණි." (පිටු 50)

මේ අනුව පෙනී යන්නේ, අද දවසේ පවතින මහා පරිමාණ කර්මාන්තයන්, අනෙකුත් මහා පරිමාණ ධනපති ව්‍යවසායයනුත් (පොදුවේ ගත්කල මේවා ප්‍රාග්ධනය ලෙස හැඳින්වේ) එක් එක් ධනපතියාගේ පුද්ගලික දේපොළක් ලෙස පැවතියද එම දේපොළ නිර්මාණය කරනු ලැබුවේ ඒ එක් එක් ධනපතියාගේ පුද්ගලික ශ්‍රමයෙන් නොවන බවය. එම දේපොළ ගොඩනැගුණේ සමාජයේ සාමාජිකයන් බොහෝ දෙනෙකුගේ, වැටුප් ශ්‍රමිකයන් බොහෝ දෙනෙකුගේ, නිර්ධනයින් බොහෝ දෙනෙකුගේ ශ්‍රමයෙනි.

## සමාජවාදයේදී පවරාගනු ලබන්නේ කුමන දේපළද?

සමාජවාදය ගොඩනැගීම ආරම්භ වන්නේ නිර්ධන පංතිය අතට රාජ්‍ය බලය ලබා ගැනීමත් සමඟයි.

සමාජවාදයේදී සමාජයේ ආර්ථික නියමය වන්නේ සමාජවාදී නිෂ්පාදනයේ ස්ථාවර වර්ධනය සහ එහි අංග සම්පූර්ණ කිරීම මගින් සමාජයේ සියලුම සාමාජිකයන්ගේ බහුවිධ සංවර්ධනය සහ හැකි පූර්ණතම සුභසිද්ධිය සහතික කිරීමය. මේ නිසා සමාජවාදී නිෂ්පාදනය සමාජයේ සියලු සාමාජිකයන්ගේ ද්‍රව්‍යමය හා අධ්‍යාත්මික වුවමනාවන් තෘප්ත කිරීමේ අරමුණින් සිදුවේ. (මීට වෙනස්ව, ධනවාදී සමාජයේ ආර්ථික නියමය වන්නේ, වැටුප් ශ්‍රමය සූරාකෑම මඟින් උපරිම අතිරික්ත වටිනාකම් - ලාභ ප්‍රමාණයක් උකහා ගැනීමයි. මේ නිසා ධනවාදය තුළදී සියල්ලට ප්‍රමුඛ වන්නේ, අතිරික්ත වටිනාකම් වැඩි වැඩියෙන් අත්පත් කර ගැනීමේ, වැටුප් ශ්‍රමිකයා වැඩි වැඩියෙන් සූරාකෑමේ ධනපතියාගේ වුවමනාවයි. එසේ නැතිව ජනතාවගේ සුභසිද්ධිය නොවේ.)

සමාජවාදී රජය සමාජයේ සියලුම සාමාජිකයන්ගේ බහුවිධ සංවර්ධනය ඉලක්ක කරගනිමින් නිෂ්පාදනය සැලසුම් කරයි. ඒ සඳහා බැංකු, ප්‍රවාහන සේවාවන්, සන්නිවේදන සේවාවන්, වරාය, ගුවන්තොටුපළ ස්වභාවික සම්පත්, ඛනිජ නිධි ආදිය සමාජවාදී රජය යටතේ පවත්වාගෙන යාමට සිදුවේ. ඉහත කී ක්ෂේත්‍රයන් පෞද්ගලික ධනපති හිමිකාරීත්වයේ පවතින්නේ නම් ඒවාද ඇතුලත්ව මහා පරිමාණ කර්මාන්ත හා ව්‍යවසායයන් ප්‍රමාණයක් පවරා ගැනීමට සමාජවාදී රජයට සිදුවේ.

එහෙත් මෙම මහා පරිමාණ ධනවාදී දේපළ යනු මීට ඉහතදී සඳහන් කළාක් මෙන් පරම්පරා ගණනක් තිස්සේ වැඩකරන පංතිය හා නිර්ධන පංතිය විසින් සිය ශ්‍රමයෙන් නිර්මාණය කරන ලද ඒවාය. සමාජවාදී විප්ලවයේදී එම දේපළ යළිත් නිර්ධන පංතිය ප්‍රමුඛ වැඩ කරන ජනතාව අතට ලබා දෙයි. එය ඓතිහාසික වැරැද්දක් නිවැරදි කිරීමකි. වැඩකරන ජනතාවගේ ශ්‍රමය විසින් බිහිකරනු ලැබූ දේ ඔවුන්ට අයිති විය යුතුය. සමාජවාදී සමාජයකදී රාජ්‍ය දේපළ ලෙස පවතින්නේ මේවාය.

මීට අමතරව සමාජවාදී සමාජයකදී පුද්ගලික ධනවාදී දේපළද කුඩා හුවමාරු භාණ්ඩ නිෂ්පාදනය මත පදනම් වූ දේපළද පවතී. මේවා පුද්ගලික ශ්‍රමය මත පදනම් වූ කුඩා පරිමාණ දේපළයි. සමාජවාදයේදී අන් අයගේ ශ්‍රමය සූරාකෑම මත පදනම් වූ මහා පරිමාණ පුද්ගලික ධනවාදී දේපළ පවරා ගනු ලැබුවද කුඩා පරිමාණ දේපළ එසේ පවරා ගනු නොලැබේ. මක්නිසාද යත් කුඩා නිෂ්පාදකයාගේ පුද්ගලික ශ්‍රමයෙන් බිහි කරන ලද දේපළ ඔවුන්ගේම අයිතියක් වන බැවිනි.

ජනතාවගේ වර්ධනය වන ද්‍රව්‍යමය, සංස්කෘතිකමය හා අධ්‍යාත්මික අවශ්‍යතාවන් හැකි උපරිම ආකාරයෙන් තෘප්ත කිරීම අරමුණු කරගෙන කටයුතු කරන සමාජවාදී රජය ආර්ථිකය සැලසුම් කරයි. එහිදී කුඩා පරිමාණ ධනවාදී ව්‍යවසායයන් නොසලකා නොහරී. ඔවුන්ද ජනතා

**15වැනි පිටුවට**



"සාමාන්‍ය නිද්‍රාශීලී ජීවිතයේදී ජනතාව අවුරුද්දකින් උගෙන ගන්නවාට වඩා දෑ විප්ලවයක් අතරතුර එක් සතියකදී ඔවුහු උගෙන ගනිති. එසේ වන්නේ, මුළු ජනතාවගේම ජීවිතයේ තියුණු වෙනස්වීමක අවස්ථාවේදී, ජනතාවගේ විවිධ පංති අනුගමනය කරන අරමුණුද, ඒවාට ඇති ශක්තියද, ඒවා උපයෝගී කරගන්නා ක්‍රමද, ඉතාමත් පැහැදිලි වන හෙයිනි."

**ලෙනින්**
**තෝ:කෘ:**
**5වැනි වෙළුම**
**198 පිටුව**

# ධනවාදයේ අර්බුදය තුළ ජාතිවාදී දක්ෂිණාංශය හිස එසවීම




පසුගියදා පැවති එක්සත් ජනපද ජනාධිපතිවරණයේ ප්‍රතිඵලයත් සමඟ ජාත්‍යන්තර දේශපාලනයේ එක් සංවාදයක් බවට පත්ව ඇත්තේ මෑතකාලීන මැතිවරණවලදී ජාතිවාදී දක්ෂිණාංශික දේශපාලන පක්ෂ ලබා ඇති ජයග්‍රහණයන් පිළිබඳවයි. මෑත කාලීන මැතිවරණ වලදී යුරෝපා සංගමයේ රටවල් අතරින් බ්‍රිතාන්‍යය, ජර්මනිය, ප්‍රංශය, ඉතාලිය, නෙදර්ලන්තය, හංගේරියාව, ආදී රටවල්වල දක්ෂිණාංශික දේශපාලන පක්ෂ සම්ප්‍රදායික ධනේශ්වර දේශපාලන පක්ෂ වලට අභියෝගයක් විය හැකි මට්ටමේ වර්ධනයක් පෙන්නුම් කරමින් සිටී. මෙකී සංවාදයට මැදිහත් වන්නන් ඩොනල්ඩ් ට්‍රම්ප්ද එවැනි දක්ෂිණාංශික ජාතිවාදී ප්‍රවණතාවක් ලෙස සලකයි. මෙකී ඇතැම් පක්ෂ මේ වන විට සමහර රටවල සභාග ආණ්ඩුවලටද සම්බන්ධව කටයුතු කරමින් සිටිනු පෙනේ.

| රට | පක්ෂය | අනුපාතික මැතිවරණවලදී ඡන්ද ප්‍රතිශතය |
|---|---|---|
| පින්ලන්තය | The Fiuns | 4.1% → 18% |
| ස්වීඩනය | ප්‍රජාතන්ත්‍රවාදියෝ | 5.7% → 13% |
| ඩෙන්මාර්කය | ඩෙන්මාර්ක් ජනතා පක්ෂය | 12% → 21% |
| නෙදර්ලන්තය | නෙදර්ලන්ත නිදහස් පක්ෂය | 5.9% → 10% |
| ප්‍රංශය | ජාතික පෙරමුණ | 4.3% → 14% |
| ස්විස්ටර්ලන්තය | ජනතා පක්ෂය | 26.6% → 29% |
| ග්‍රීසිය | රන්වන් අරුණෝදය | 6.3% → 7% |
| සයිප්‍රසය | ELAM | 1.08% → 3.7% |
| හංගේරියාව | Jobbik | 16.67% → 21% |
| ස්ලෝවැකියාව | අපේ ස්ලෝවැකියාව | 1.58% → 8% |

වර්ධනය වෙමින් පවත්නා මෙම තත්වය පිළිබඳව ධනේශ්වර විචාරකයින් පවා අනතුරු ඇඟවීමට පටන්ගෙන තිබේ. ඇතැමුන්ට අනුව මෙයට හේතු පාදක වී ඇත්තේ යුරෝපය පුරා පවතින ආර්ථික අස්ථායීතාවයත්, සරණාගත රැල්ලත්ය. 2016 වර්ෂයේ නොවැම්බර් මාසයේදී එළිදැක්වුණු ජර්මනියේ Bertelsmann Stiftung ආයතනයේ සමීක්ෂණ වාර්තාවට අනුව ජනතාව දක්ෂිණාංශික පක්ෂ වෙත යොමුවී ඇත්තේ වත්මන් ආණ්ඩුවල ගෝලීයකරණ ප්‍රතිපත්තියට ඇති බිය නිසාවෙන් බවයි. මෙම සමීක්ෂණය යුරෝපා සංගමයේ රටවල් 28 තුළම පුද්ගලයින් 11,000ක ගෙන් ලබා ගත් තොරතුරු අනුව සකසා තිබුණි. ඔවුන් යෝජනා කරන්නේ සාම්ප්‍රදායික දේශපාලන පක්ෂද ගෝලීයකරණ විරෝධය සිය සටන් පාඨයක් කරගත යුතු බවයි. එසේ නොවුවහොත් මෙම දක්ෂිණාංශික පක්ෂ මෙම රටවල පාලන බලයට පවා ආ හැකි බවට ඔහුන් අනතුරු අඟවති.

ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ ජයග්‍රණයෙන් පසුව මෙක්සිකෝවේ ලා ජෝනර්ඩා පුවත්පතට අදහස් දක්වමින් එක්සත් ජනපදියේ සමාජ විද්‍යාව පිළිබඳව මහාචාර්යය විලියම් අයි රොබින්සන් මෙසේ පවසා තිබුණි.

"ලෝක ධනවාදයේ සර්පිලාකාර අර්බුදය තීරණාත්මක සංධිස්ථානයකට පැමිණ තිබේ. මෙම ක්‍රමය (එලෙස මුලින් උපුටා දැමිය නොහැකි නම්) එක්කෝ අරගලකාරී ලෙස වෙනස් කළ යුතුය. නැත්නම් 21 වන ශතවර්ෂයේ ෆැසිස්ට්වාදය දෙසට තියුණු හැරවුමක් ගත යුතුය. ගරු කටයුතු ප්‍රතිසංස්කරණවාදයේ අසමත්කම හා ලෝක ධනවාදයේ කොල්ලකාරීකමට සහ මසුරුකමට අභියෝගය කිරීමට බහුජාතික සමාගම්වල ප්‍රභූවරුන්ගේ නොකමැත්ත විසින් අර්බුදයට ප්‍රතිචාර ලෙස අධික දක්ෂිණාංශයට ඉඩ සලසා දී ඇත."

මෙම ප්‍රකාශනයෙන් ඔහු මතු කරණ කරුණු කිහිපයකි.

1. ලෝක ධනවාදයේ අර්බුදය තීරණාත්මක සංධිස්ථානයකට පැමිණ තිබීම එය කොතරම්ද යත් මෙ ක්‍රමයම මුලින් උපුටා දැමිය යුතු තත්වයක් දක්වා එය වර්ධනය වී තිබීම. (එය එතරම්ම විනාශකාරීය)

2. අර්බුදයට හේතු වී ඇත්තේ ධනවාදයේ කොල්ලකාරී බව හා මසුරුකමයි.

3. එය මුලින් උපුටා දැමිය නොහැකි නිසා අඩු වශයෙන් අරගලකාරී ලෙස වෙනස් කළ යුතුය.

4. මෙම ක්‍රමය අරගලකාරී ලෙස වෙනස් කිරීමට 'ගරු කටයුතු' සාම්ප්‍රදායික ප්‍රතිසංස්කරණවාදී වැඩපිළිවෙලවල් අසමත් වී තිබීම.

## ඊශ්‍රායලය: නිර්ලජ්ජිත හැසිරීමක




එක්සත් ජාතින්ගේ ආරක්ෂක මණ්ඩලයේ නවතම යෝජනාවට ප්‍රතිචාරයක් වශයෙන් ඊශ්‍රායලයේ නැගෙනහිර ජෙරුසලමේ තවත් නිතී විරෝධී ජනාවාසකරණයක් සඳහා අවශ්‍ය නිවාස 5600ක් ගොඩනැගීමට තීරණය කර තිබේ. ඊට අමතරව ඔවුන් ගිලෝ ප්‍රදේශයේ නිවාස 2600ක්ද ශිවැට් හා මැටෝන් ප්‍රදේශයේ නිවාස 2600ක්ද රැමැට් ග්ලෝටෝ ප්‍රදේශයේ නිවාස 400ක්ද ගොඩනැගීමට බලාපොරොත්තු වන බව ඊශ්‍රායල පුවත් පත් වර්තාකර තිබේ.

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය මේ යෝජනාව සම්මත කරගනු ලැබුවේ දෙසැම්බර් 24වැනි දිනය. ඒ සඳහා පක්ෂව ඡන්ද 14ක් ලැබුණු අතර විරුද්ධව ඡන්ද නොලැබුණි. එක්සත් ජනපදය එහිදී ඡන්දය දීමෙන් වැළකී සිටියේය. මීට පෙර මෙවැනි යෝජනා ගෙනා හැම විටකදීම එක්සත් ජනපදය නිෂේධ බලය පාවිච්චි කරමින් එවා සම්මත වීම වළක්වනු ලැබිණි.

මීට අමතරව එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ මෙම තීරණයට ප්‍රතිචාර ලෙස එක්සත් ජාතීන්ගේ ආයතනවලට දෙනු ලබන ඊශ්‍රායල ආධාර නවතා දැමීමටද එරට අගමැති නෙතනියාහු තීරණය කර තිබේ.

## කියුබාව: ෆිදෙල්ගේ කැමැත්තට ගරුකර



2016 දෙසැම්බර් 27 වන දින කියුබානු පාර්ලිමේන්තුවේ දී විශේෂ පනතක් සම්මත කර ගැනුණි. එම පනත වුයේ නායක පිදෙල් කැස්ත්‍රෝගේ නම හෝ ඔහුගේ රූපය කියුබාවේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කිරීම හෝ ඔහුගේ ප්‍රතිමා හෝ වෙනත් එවැනි දෑ ඔහුට ගෞරවයක් ලෙස තැබීම තහනම් කරමින් ගෙනා පනතයි. එසේම මෙම පනත මගින් ඔහුගේ නම, රූපය, හෝ ප්‍රතිමා වෙළඳ ප්‍රචාරණය සඳහා හෝ වෙනත් එවැනි වෙළද කටයුතු සඳහා භාවිතා කිරීම තහනම් කෙරුණි.

මෙම පනත පිළිබඳව අදහස් දැක්වූ එරට ජනාධිපති රාවුල් ක්‍රැස්ත්‍රෝ මෙම පනත ගෙන ආවේ පිදෙල් ක්‍රැස්ත්‍රෝ සහෝදරයාගේ අවසන් කැමැත්ත අනුව බවයි. කෙසේ වුවද මෙම පනත මගින් කලාකරුවන්ට ඔවුන්ගේ කලා කටයුතු සඳහා පිදේල්ගේ නම හෝ රූපය භාවිතා කිරීම හෝ යුදමය ආයතන තුළ ඔහුගේ රූපය ප්‍රදර්ශනය කිරීම තහනම් කර නැත.

## චීනය: බෙදුම්වාදයට රතු එළියක්



නිල වශයෙන් පසුගිය දෙසැම්බර් 28 වනදා චීනය තායිවානයේ හා හොංකොංහි බෙදුම්වාදීන්ට අනතුරු ඇඟවීය. මෙම දෙරටම චීනයට අයත් ප්‍රදේශ ලෙස චීනය සලකයි. හොංකොං පාලනය බ්‍රිතාන්‍යයෙන් චීනය වෙත අත්වුයේ 1997 දීය.

එක්සත් ජනපදයේ තේරී පත් වු ජනාධිපති ඩොන්ල්ට් ට්‍රම්ප් සිය මැතිවරණ ජයග්‍රහණයෙන් පසු ඍජුව තායිවාන් නායක ටිසායි ඉන්ග් වෙත දුරකථනයෙන් ඇමතීය. එය චීනය කුපිත කරවන්නක් බවට පත් විය. චීනය එහිදී ප්‍රකාශ කළේ එක්සත් ජනපදය "එක් චීනයක්" යන ප්‍රතිපත්තියට ගරු කළ යුතු බවයි.

පසුගිය වසරේදී හොංකොං දේශය තුළ චීන විරෝධි උද්ඝෝෂණ ඇති විය. චීන ආණ්ඩුව ප්‍රකාශකරණ අන්දමට මේ වසර තුළදී චීන විරෝධී හොංකොං ක්‍රියාකාරීන් තායිවානයට ගොස් සාකච්ඡ පවත්වා ඇත. චීනය පවසන්නේ බෙදුම්වාදී කුඩා කණ්ඩායම්වලට චීනය බෙදා දැමීමට ඉඩ නොලැබෙන බවයි.

# රාජ්‍ය පෞද්ගලික සහභාගිත්ව ව්‍යාපාර (PPP): විකිණීමේ අලුත්ම කලාව

මෙවර වික්‍රමසිංහ-සිරිසේන හවුල් පාලනය පාර්ලමේන්තුවට ඉදිරිපත් කළ අයවැය මගින් බොහෝ නව බදු හඳුන්වා දීම රට තුළ උද්ඝෝෂණ තත්වයයක් ඇති වූ නමුත් ඒ හා සමානව බරපතළ ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්කම් රැසක්ද යෝජනා කර තිබීම පිළිබඳව වැඩි මහජන අවධානයක් යොමු වී නැත. එහෙත් ආණ්ඩුව තමන් මුහුණ ඇති ගෙවාගත නොහැකි අසීමිත ණය කන්දරාව හමුවේ ණයට හිලව් කිරීම සඳහා ජාතික සම්පත් විකුණා දැමීම තෝරාගෙන තිබේ. නමුත් විකිණීම හෝ පෞද්ගලීකරණය කිරීම යන වචන වෙනුවට ආණ්ඩුව විසින් එම ක්‍රියාවලිය නම්කර ඇත්තේ රාජ්‍ය-පෞද්ගලික සහභාගිත්ව ව්‍යාපාර ඇති කිරීම යනුවෙනි. (PPP)

රාජ්‍ය දේපළ විකිණීමට (පෞද්ගලීකරණය) ලංකාවේ ආණ්ඩු හැම එකකටමත්, විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂ පාලනයටත් ඇත්තේ අපකීර්තිමත් ඉතිහාසයකි. 1977න් පසු එ.ජා.ප.ය හඳුන්වා දුන් ආර්ථිකය විවෘත කිරීමේ ක්‍රියාවලිය පුරාම තිබී ඇත්තේ පාඩු ලබන මෙන්ම ලාභ ලැබූ රාජ්‍ය ව්‍යාපාර විවිධ නාමකරණයන් මගින් විකිණීමට ලක් කිරීමේ ඉතිහාසයකි. එම විකිණීමට පාර්ලිමේන්තුවේ අත් එසවීමේ බලය අද මෙන්ම ශක්තිමත් අවස්ථාවලදී සෘජුව පෞද්ගලීකරණය ලෙසිනුත් අනිකුත් අවස්ථාවන්හිදී ජනතාකරණය, ඔබ සතුකරණය, කොටස් හිමිකාරිත්වය නිකුත් කිරීම, ආදී විවිධ වේෂයෙන් ක්‍රියාවට නැගී ඇත. ජේ.ආර්. ජයවර්ධන පාලනය සමයේ, සෘජුව විවෘත ආර්ථිකය ලෙසින් රාජ්‍ය ව්‍යාපාර ආයතන 40කුත් විවෘත ආර්ථිකයට මානුෂික මුහුණුවරක් යටතේ චන්ද්‍රිකා කුමාරතුංග පාලන සමයේදී රාජ්‍ය වැවිලි සමාගම ඇතුළු රාජ්‍ය ව්‍යාපාර 41කුත් මෙලෙස පෞද්ගලීකරණයට ලක්කළ අපකීර්තිමත් ඉතිහාසයක් ලංකාවට උරුම වී ඇත.

මෙවර අයවැය තුළ මෙම PPP ක්‍රමවේදය හඳුන්වා දී ඇති අතර එය ඉතා සූක්ෂම ලෙස දේශීය ව්‍යාපාර හා කර්මාන්ත පුළුල් කිරීමේ ක්‍රමවේදයක් ලෙස නම් කර ඇත්තේ මෙලෙසය.

I. අයවැය 167 වගන්තිය

"කොළඹ නගරයේ විශේෂිත අත්කම් අලෙවි මධ්‍යස්ථානයක්, රාජ්‍ය, පෞද්ගලික දෙඅංශයේ සහභාගිත්වය (PPP) පදනමින් ස්ථාපිත කිරීමට යෝජනා කරන අතර, එමගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට තොග වෙළඳාමේ විශේෂයෙන්ම අත්කම්, රෙදිපිළි හා පාවහන් කර්මාන්තවල නියැලීමට ඉඩ ප්‍රස්ථා සලසා දෙනවා. 2017 වසරේදී මේ සඳහා රු. මිලියන 100ක් වෙන් කිරීමට යෝජනා කරනවා"

II. "මෙය දූපතක් වුවත් අපට අවශ්‍ය ලුණු ආනයන කිරීමට සිදුවීම හාස්‍යයට කරුණක්, එවැනි වටපිටාවක් යටතේ වැඩි ආයෝජනයක් අප ලබාගත හැකි වන පරිදි මෙම කර්මාන්තය රාජ්‍ය හා පෞද්ගලික සහභාගිත්ව ව්‍යාපාර (PPP) සඳහා විවෘත කිරීමට හා යෝජනා කරනවා.

ඉතාම මෘදු ලෙස සාධාරණ හේතු පෙන්වා දෙමින් රාජ්‍ය ව්‍යාපාර විකිණීම සැලසුම මෙසේ අයවැය තුළ එළිදැක්වුවද ඇත්ත යථාර්ථයේ එම ක්‍රියාවලිය සිදුවන්නේ ඊට හාත්පසින්ම වෙනස් දරුණු විකිණීමේ ක්‍රියාවලියක් ලෙසටය.



## වරායත් - PPP

හම්බන්තොට මුළු වරායත්, කොළඹ වරායේ රාජ්‍ය පංගුව යටතේ ඉතිරි වී ඇති නැගෙනහිර ජැටියත් විකිණීම සඳහා දැනටමත් ටෙන්ඩර් කැඳවා ඇත. එය අයවැය තුළ PPP යෝජනාවක් ලෙසටවත් පාර්ලිමේන්තුවට වාර්තා කර නොමැත. හේතුව සමහර විට එහි රාජ්‍ය සහභාගිත්වයට ඇත්තේ විකිණීමේ ක්‍රියාවලියට පමණක් නිසා හෝ පෞද්ගලික සහභාගිත්වය ලෙස දේශීය පෞද්ගලික අංශයක් නොමැති නිසා විය හැකිය. කෙසේ වුවත් අවසාන ප්‍රතිඵලය වනු ඇත්තේ ජාතික සම්පතක් වන වරායක් ලාංකේය ජනතාවට අහිමි වීමයි. දැනට යෝජිත ආකාරයට හම්බන්තොට වරාය චීන සමාගමකට විකිණීමට යෝජිතව ඇත්තේ 99 අවුරුදු වාර දෙකක් ලෙස වසර 198ක කාලයකටය. එය හුදු වරායක් පෞද්ගලීකරණය පමණක් නොව රටේ ජාතික ආරක්ෂාව හා දේශයේ ස්වෛරීභාවය අලෙවි කිරීමකි. කොළඹ වරායේ නැගෙනහිර ජැටිය බදු දීමේදී ආණ්ඩුව ටෙන්ඩර් පත්‍රිකාව සකස්කර ඇත්තේ එය දකුණු ආසියානු රටකට ලබාගත හැකි වන ලෙස බව පැවසේ. ඒ අනුව කොළඹ වරායේ ජැටිය ඉන්දියාව විසින් ලබා ගනු ඇතැයි සිතුවද දැනට ඇති සමහර තොරතුරුවලට අනුව මෙය බංගලාදේශය හරහා චීන සමාගමක්ම අයත් කර ගැනීමට ඉඩ තිබේ. කෙසේ වුවත් කොළඹ වරායේ ජැටිය විදේශ සමාගමකට බදු දීම ස්ථිරය. වරාය විෂය භාර අමාත්‍යවරයාම රාජ්‍ය පංගුව 51%ක් වඩා තබාගත යුතු යැයි කැබිනට් පත්‍රිකාවට යෝජනා කර තිබියදී "විකිණීමේ කණ්ඩායම" නොහොත් ආර්ථික කළමනාකරණ කමිටුව විකිණීමට නිර්දේශ කර ඇත්තේ රජයට අයිතිය 15% ක් සහ මිලදී ගන්නා කාට හෝ 85% ක් හිමිවන ලෙස විකිණීම වඩා "ලාභදායක" ලෙසිනි. එය ppp (රාජ්‍ය-පෞද්ගලික සහභාගිත්වය) ඉක්මවා යන කුණු කොල්ලයටම ජාතික සම්පත් විකිණීමකි.

> ගැටලුව වන්නේ ආණ්ඩුවේ විකිණීමේ අරමුණ සමග නොවේ. මෙම ජනතාව රටටටා ආණ්ඩුව සිදුකරන ජාතික අපරාධ සඳහා, ඉඩම්, වරාය මංකොල්ල සඳහා ජනවරමක් ලංකාවේ ජනතාව ලබාදී තිබේද යන්නය. රාජපක්ෂ පාලනය ප්‍රතික්ෂේප කළ යහපාලනයක් අපේක්ෂා කළ ජනතාව තමන්ගේ එක් ඡන්දයක්වත් විකිණීම වෙනුවෙන් භාවිතා කර නැත.

## ඉඩම් - PPP

විශේෂයෙන් එ.ජා.ප. පාලනයන් පැවති සෑම විටකදීමත්, පැවති සියලු ආණ්ඩු පාලනයන් තුළත් ලංකාවේ ඉඩම් සම්පත් විදේශිකයන් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය විවිධ ආකාරයන්ගෙන් ක්‍රියාවට නැගුණි. දේශීය ඒජන්තයෙකුගේ නමින් 99 අවුරුදු හෝ 39 අවුරුදු බදු පදනම යටත් හෝ හවුල් ව්‍යාපාර ලෙස සංචාරක කර්මාන්තයේ මුවාවෙන් හෝ මෙම අලෙවි කිරීම සිදුවිය. පැවති රාජපක්ෂ පාලනයේ කලු දශකයේදී ගෝල්ෆේස් පිටිය විකිණීම, සීගිරියට නූතන ලළනාවන් ගෙවීමේ ක්‍රමයට - සීගිරිය සංචාරක කලාපයක් කිරීමේ යෝජනාව ආදිය ක්‍රියාවට නැගීමට උත්සාහ කළත් යම් මට්ටමකට එම උත්සාහය රටේ ජනතාවගේ සහ දේශපලන ව්‍යාපාරයන්ගේ විරෝධතා නිසා යටපත් විය. නමුත්, විකිණීමේ ආණ්ඩු වුවමනාව යටපත් නොවීය. එහි වර්තමාන මුහුණුවර වී ඇත්තේ PPP නමින්, හම්බන්තොට අක්කර 15,000ක ගොවි බිම සෘජුවම චීනයට ලබාදීමට පිඹුරුපත් සකස් කිරීමය. ඊට එරෙහිව දැනටමත් ජනතා විමුක්ති පෙරමුණ මූලිකත්වයෙන් දැවැන්ත ජනතා විරෝධයක් මතුව තිබේ.

අයවැය මගින්ද වක්‍රාකාරයෙන් ගොවිබිම් අලෙවි කිරීමේ යෝජනාවක් ඉදිරිපත්ව තිබේ. එය නම්, මාදුරුඔය දකුණු ඉවුරේ සහ වෙනත් ප්‍රදේශවලින් රජයේ ඉඩම් අක්කර 20,000ක් වාණිජ මට්ටමේ ගොවියෙකු සඳහා දිගුකාලීන බදු ක්‍රමය යටතේ අවම වශයෙන් ඉඩම් අක්කර 1,000 බැගින් ලබාදීමයි. ඉඩම් අක්කර 1,000ක් තනිව වගාකරගත හැකි ගොවියකු ඇත්නම් ඔහු ගොවියෙකු නොව ගොවි ව්‍යාපාරිකයෙකුමය. මෙය දැනටමත් ඇඹිලිපිටිය, සෝමාවතිය ප්‍රදේශවල ඉඩම් ලබාගෙන වාණිජ පරිමාණයෙන් වගාවන් කරගෙන යන ඇමරිකානු ඩෝල් සමාගම වැනි "ගොවි සමාගම්" මිස දේශීය ගොවි ජනතාව නොවන බව නිසැකය.

## ඛනිජ සම්පත - PPP

ආණ්ඩුව විකිණීමේ ක්‍රියාවලියට අත ගසා ඇති තවත් ක්ෂේත්‍රයක් වන්නේ ලංකාවේ නුදුරු අනාගතයේදී සමාජවාදී රජයක් යටතේ ලංකාව අනාගත ලෝකය හමුවේ දියුණු රටක් බවට පත් කරන වැඩපිළිවෙළට යොදාගත හැකිව ඇති ජාතික සම්පත වන ඛනිජ සම්පත් විකිණීමටය. ඒ අනුව දැනටමත් ඔස්ට්‍රේලියානු සමාගමක් සමඟ කහටගහ පතල විකිණීමේ එකඟතා ගිවිසුමකටද අත්සන් තබා ඇත. ලෝකයේ දුර්ලභම ඛනිජ සම්පත් ඇති (ටයිටේනියම්) පුල්මුඩේ ඛනිජ වැලි නිධියද අගය එකතු කිරීමේ ව්‍යාපාරයක් බවට පත් කිරීමේ වුවාවෙන් විකිණීමට (PPP) ඉදිරිපත් කර ඇත. එය රාජ්‍ය භාරයද අත් හරිමින් PP පමණක් වන ලෙස විකිණීමටද ඉඩ ඇත. බෝගල පතල, කහටගහ පතල, පරන්තන් කෙමිකල් ආයතනය, ආදියද මෙම අලෙවි ලැයිස්තුවේ ඇත.


## PPP ලැයිස්තුගත කිරීම

මෙම රාජ්‍ය-පෞද්ගලික සහභාගී මුවාවන් පෞද්ගලීකරණයට ආයතන පෙළ ගැස්වීම මෙවර 2017 වසර සඳහා ඉදිරිපත් කළ අයවැයේ දක්වා ඇත්තේ මෙසේය.

"අප 2017 වසරේදී Grand Oriental Hotel, Waters edge,West Coast, Hilton, Mantai salt සහ Hambantota salt වැනි උපාමාර්ගික නොවන වාණිජ ව්‍යාපාරය ලැයිස්තු ගත කිරීමට (Listing) බලාපොරොත්තු වෙනවා. මෙමගින් අවම වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 1000ක් රජයට ලැබෙනු ඇත. මෙමගින් පසුගිය අතාර්කික හා ප්‍රශ්න සහගත පොලී ණය ගෙවීමට යොද ගන්නවා. 2017 වර්ෂය තුළ සිදුකරන අනෙකුත් ලැයිස්තුගත කිරීම පිළිබඳව පාර්ලිමේන්තුව දැනුවත් කරනු ඇත."

කාරණය ඉතා පැහැදිලිය. ආණ්ඩුවේ වුවමනාව නිරවුල්ව ඉදිරිපත් කර ඇතත් 2017 වසරේදී ඉහත ආයතන විකිණීමට නොව කොටස් කිරීමට ලැයිස්තු ගත කරන අතර, 2017 වසරේදී අලුතින් මීට අමතරව ලැයිස්තුගත කරන තවත් ආයතන තිබේ. ඒව පිළිබඳව පසුව දැනුවත් කරනු ලැබේ.

සුපිරි බලය සහිත තනි ඒකාධිපති අමාත්‍යවරයෙක් නිර්මාණය කිරීම සඳහා පනතක් කෙටුම්පත් කරන්නේද මෙම 15 වැනි පිටුවට



"පොරොන්දු වීමත් පොරොන්දු ඉෂ්ඨ කිරීමත් අතර පරීක්ෂා නොකරන ලද මනුෂ්‍ය ස්වභාවයේ අම්බලම් බොහෝ තිබේ."

**බෘනෝ ආපිට්ස්**

# මානව හිමිකම් කතාවට පමණක් සීමා නොවීමට නම්...



දෙසැම්බර් 10 දිනට යෙදී තිබූ මානව හිමිකම් දිනය සුපුරුදු ලෙස මෙවරත් රාජ්‍ය මට්ටමින් හා විවිධ මානව හිමිකම් සංවිධාන විසින් සමරනු ලැබිණි. සම්ප්‍රදායික ලෙස යෙදෙන දිනයක් සමරනවා වෙනුවට හුදු උත්සවයක් පවත්වනවා වෙනුවට ඉන් ඔබ්බට ගොස් මානව අයිතීන් පිළිබඳ වඩාත් අර්ථාන්විත දිනයක් බවට එම සැමරුම් පත්විය යුතුය. වර්තමානයේ අප රට තුළ මානව අයිතීන් සම්බන්ධයෙන් වන ගැටලු වඩාත් සාධනීය ලෙස සාකච්ඡාවට ලක්කර ඒවාට විසඳුම් සෙවීමේ කතිකාවක් එම සැමරුම් තුළින් ආරම්භ විය යුතුය. ආරම්භයක් ලෙස මානව හිමිකම් සංවිධාන ඒ සඳහා ක්‍රියාකාරීව මැදිහත්විය යුතුය.

අප රට තුළ ළමුන්ගේ මානව අයිතීන් පිළිබඳව කතාබහට ලක්වන්නේ ඉතා අඩුවෙනි. බොහෝ විට ළමුන්ගේ අයිතීන් වැඩිහිටියන් අතින් කඩවන අවස්ථා බහුලව දක්නට ලැබුණත් ඒවා පිළිබඳව අවධානය යොමු වන්නේ ඉතා අඩුවෙනි. ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක වන්නේ නම් ඒද ඉතා මන්දගාමීවය. විවිධ ජන වර්ගයන්ට අනුවද නීතිය ක්‍රියාත්මක වන්නේ විවිධාකාරයෙනි

පසුගිය මාස කිහිපය තුළ සමාජය තුළ මුස්ලිම් ගැහැණු දරුවන් අඩු වයසින් විවාහ කරදීම පිළිබඳව කතිකාවක් ආරම්භ විය. එම කතිකාව ආරම්භ වනවාත් සමගම ඇතැම් මුස්ලිම්වරුන්ගෙන් ඊට දැඩි ලෙස විරෝධය එල්ල විය. ඇතැම් මුස්ලිම් කාන්තා සංවිධාන මුස්ලිම් ළමා විවාහවලට එරෙහිව කතා කරන්නට විය. රජයේ පාර්ශ්වයෙන් තවමත් ඒ සම්බන්ධයෙන් නිහඬ පිළිවෙතක් අනුගමනය කරමින් සිටී.

මුස්ලිම් විවාහ හා දික්කසාද පනතින් අවුරුදු 12ත් 15ත් අතර කුඩා ගැහැණු දරුවන් විවාහ කර දීමට නීතිමය ඉඩකඩ සලසා තිබේ. ලංකාවේ පොදු විවාහ ආඥා පනත යටතේ මුස්ලිම් ජනතාවට විවාහ විය නොහැකි ලෙස කොන්දේසියක් පනවා ඇත. දැනට ලංකාවේ සාමාන්‍ය විවාහ වීමේ වයස් සීමාව අවුරුදු 18ක් වුවද මුස්ලිම් ජනතාවට එම නීතිය අදාළ නොවේ.

මුස්ලිම් විවාහ හා දික්කසාද පනත 1951 වසරේදී සම්මත කරගනු ලැබූවකි. එය ඉන්දුනීසියාවේ එකල පැවති නීතියක් ගෙඩි පිටින්ම මෙරට නීති පද්ධතියට ඇතුළත් කර ගැනීමක් වන අතර ඉන්දුනීසියාව තුළද එය අවස්ථා කිහිපයකදී සංශෝධනය කර ළමුන් හා කාන්තාවන්ගේ අයිතීන් යම්තාක් දුරට තහවුරු කිරීමට පියවර ගෙන ඇත. ඇෆ්ඝනිස්ථානය, පාකිස්ථානය වැනි මුස්ලිම් රටවලද කලින් පැවැති නීති සංශෝධනය කිරීමකට ලක්කර ඇතත් ලංකාවේ පමණක් එය සංශෝධනයකට ලක් නොවී පවතී.

මෑත කාලයේ මුස්ලිම් ළමා විවාහ වැඩිවීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබෙන බව මුස්ලිම් කාන්තා සංවිධාන පවසයි. එයට බලපා ඇති ප්‍රධාන හේතුව ලෙස ඔවුන් දක්වන්නේ දෙමාපියන් පෙළෙන දුගීබවයි. ඇතැම් ධනවත් දෙමාපියන්ද ගැහැණු දරුවන්ගෙන් ඉක්මනින් නිදහස් වීමේ අරමුණින් ළමා වයසේදීම තම දියණියන් විවාහ කරදීමට පෙළඹෙන බව පැවසේ.

මෙයට අමතරව උතුරේ කාන්තාවන් හා ගැහැණු දරුවන් මුහුණ දෙන තත්වයද ඛේදජනකය. විශේෂයෙන්ම යුද්ධයේ විනාශකාරී බලපෑම නිසා වැන්දඹුවන් බවට පත් වූ කාන්තාවන්ගේ මෙන්ම මව්පියන් දෙදෙනාම අහිමි වූ දරුවන් හා පියා අහිමි වූ දරුවන් රැසක් උතුරේ සිටින අතර ඔවුන් අනාරක්ෂිත තත්වයට පත්ව තිබේ. ඔවුනට සමාජමය රැකවරණයක් නැත.

පොදුවේ ගත්විට ලංකාවේ කාන්තාවන් හා ළමුන්ගේ තත්වය බොහෝවිට ඛේදජනකය. විවිධ පීඩාවන්ට ලක්වීමට සිදුවන ඔවුන්ගේ මූලික මිනිස් අයිතීන් පවා නොරැකේ. කාන්තාවන්ගේ හා ළමුන්ගේ අයිතීන් ලබාදීමට වත්මන් සමාජ ක්‍රමය අසමත්ය. එබැවින් මානව හිමිකම් සැබෑ ලෙස රැකිය හැකි නව සමාජයක් ගොඩ නැගීම වෙනුවෙන් මානව හිමිකම් ගරු කරන සියලුදෙනා පෙරට ආ යුතුය.



## එක්ව පිසලමු කිරිබතක් නව හීන කැන්දා

කන්න දෙක තුන ණය තුරුස් වී
බිස්ස හිස් වේ තුඹස් බැන්දා
ණයට ඉල්ලා ගත්ත හාලෙන්
කුමන නම් කිරිබත්ද මන්දා

ජනේරුව සරදමට වාගේ
රූප පෙට්ටියේ තිරෙන් කැන්දා
පරණ මුට්ටිය ලිප තබා අපි
අලුත් අවුරුදු සිරිය වින්දා

යාන්තම් පොල් බෑය මිරිකා
ගත්ත කිරි දිය රසද මන්දා
ඊට ඉහළින් තෙල් පොහොර රස
හැංගිලා තිබුණාද මන්දා

අනේ මේ කරුමේ කියාගෙන
අහක බලමින් ඉන්න හන්දා
පිදුරු කාපන් කියා නොකියා
බතේ රස අඩු වුණිද මන්දා

දිසාපාමොක් උරණ වී
සිප්හලේ දොර වැසී යාදෝ
මිනී නොකනා නිල්වලා
ගංතෙරේ පැටවුන් වැලපුනාදෝ

මවු ළමැද රැඳි ගිනි නිවන්නට
ගං දියට කෙලෙස නම් හැකිදෝ
පිටිකරට මිස පයේ රෝගෙට
කවදාක නම් බෙහෙත් වුණිදෝ

වෙනද වාගෙම පාන්දර විත්
හවස ඉරගල වැටෙන හින්දා
අනේ උන්නත් මලත් දාහයි
කියා ඇස් කන් වසා බැන්දා

අතේ ඇති දේ කටේ දාගත්තම
අනේ ඇති සිතූ හින්දා
ඉබේ වැටෙනා හුස්ම පොද මිස
අලුත් කිසිවක් කොහිද මන්දා

වත්ත බද්දට දීලා ඇස්සට
දෙස් තියන්නට දස්ස හන්දා
ඇත්ත අවුරුදු උන්ට දී අපි
සුසුම් රස කර කඳුළු වින්දා

තිත්ත වනමුත් ඇත්ත යුත්තට
හිස නමා කොඳු නොගෙන බින්දා
පැත්ත ගියමුත් එක්ව පිසලමු
කිරිබතක් නව හීන කැන්දා

## සිව්දෙසින්



### කියුබානු තාරුණ්‍යය නායකත්වයේ මඟ ගනිමින්...


ජනවාරි 02 දින හවානාහි ජොසේ මාටි චතුරස්‍රයේ පැවැත්වීමට නියමිත පෙළපාළියේ හා හමුදා සංදර්ශනයේ කියුබන් තරුණ තරුණියන් ප්‍රධාන තැනක් ගන්නා බව තරුණ කොමියුනිස්ට් ලීගයේ ජාතික සභාවේ සාමාජිකයෙක් වන ජෝන් කැබේ මිජරෙස් පවසයි.

විප්ලවීය නායක ෆිදෙල් කැස්ත්‍රෝ සහෝදරයාට ගෞරව දැක්වීම හා කියුබන් විප්ලවයේ 58 වැනි සංවත්සරය සැමරීම වෙනුවෙන් මෙය සංවිධානය කර ඇති අතර පෙළපාළියේ ඉදිරියෙන්ම පාසල් සිසුන්ගේද දායකත්වයෙන් ග්‍රැන්මා යාත්‍රාවේ අනුරුවක් රැගෙන යාමට නියමිතය. සිසුන් හා තරුණ තරුණියන් විශාල ප්‍රමාණයක් ඊට සහභාගිවීමට නියමිතය.

### කයිරෝහි මිලියන 5ක් සොහොන් ගෙවල් තුළ...


ඊජිප්තුවේ නිල සංඛ්‍යාලේඛනවලට අනුව, කයිරෝහි මිලියන 5කට නිවාස නොමැති බවත් ඔවුන් කයිරෝහි සුසාන භූමියක සොහොන් ගෙවල් තම නිවෙස් ලෙස භාවිතා කරන බවත් පැවසේ.

මෙය දුප්පත්කම විසින් ජීවත්වන හා මියගිය වුන්ගේ සීමා මායිම් මකා දමා ඇති බව පෙන්වන්නක් වන අතර සොහොන්වල ආරක්ෂාව හා පිරිසිදු කිරීම දුප්පතුන් ගෙන් සිදුවන නිසා මියගිය අයගේ ඥාතීන් විසින් කිසිදු මුදලක් අය නොකර සොහොන් ගෙවල් පාවිච්චි කිරීමට ඉඩ දී ඇත. කයිරෝහි මිලියන 25ක ජනගහනයක් වෙසෙයි.



දැනුම සමාජය හා චින්තනය 12

# අනිවාර්යය හා අහම්බය



දැනුම පිළිබඳ ප්‍රශ්නයේදී, අප අවට ලෝකය හා එහි සිදුවන සිදුවීම් නිවැරදිව වටහා ගෙන ඊට නිවැරදි ප්‍රතිචාර දැක්වීමේදී, අප දෛනිකව මුහුණ දෙන ගැටලු විසඳා ගැනීම සඳහා ඒවා තේරුම් ගැනීමේදී "අනිවාර්යය හා අහම්බය" නම් ප්‍රකෘතිය තේරුම් ගැනීමේ ආකාරයද වටහා ගත යුතුය. ලෝකයේ සිදුවන සියලුම දේවල් සිදුවන්නේ එක්කෝ අනිවාර්යයන් ලෙසය. නැතිනම් අහම්බයන් ලෙසය. අනිවාර්යයන් ලෙස සිදුවන දේ පිළිබඳව අපට කළ හැකි දෙයක් නැත. මන්ද ඒවා අනිවාර්යයන් වන බැවිනි. ඒවා ප්‍රමාද කිරීම හෝ කඩිනම් කිරීම සඳහා පමණක් මිනිසාට මැදිහත් විය හැකි අතර අනිවාර්යයන් නතර කිරීමට නොහැක. උපදින සෑම කෙනෙක්ම මිය යාම අනිවාර්යයකි. එය නතර කිරීමට කිසිවෙකුට නොහැක. එහෙත් අනිවාර්යය වන මරණය ප්‍රමාද කර ගැනීමට හෝ ඉක්මන් කර ගැනීම සඳහා අපට යමක් කළ හැකිය. මෙය එලෙස තේරුම් ගත හැක.

**අනිවාර්යයට බලපාන හේතු**

අනිවාර්යය හා අහම්බය යනු කුමක්ද? මෙය එකම ක්‍රියාවලියක අන්තර් සම්බන්ධිත පැති දෙකකි. අනිවාර්යය යනු යම් වස්තුවක ප්‍රපංචයක, ක්‍රියාවක ප්‍රධාන සාධක විසින් ප්‍රධාන ප්‍රතිවිරෝධය විසින් ඇති කරවන තත්වයකි. එහෙත් අහම්බය යනු එසේ නොවේ. එය අදාල වස්තුවේ හෝ ක්‍රියාදාමයේ ප්‍රධාන සාධක හෝ ප්‍රධාන ක්‍රියාමාර්ග විසින් නොව බාහිර හෝ ප්‍රධාන නොවන සාධක විසින් ඇති කරන්නකි. ඒ නිසා ඒවා අනිවාර්යය නොවේ. මෙය මෙලෙස වටහා ගත හැකිය. සෑම අනිවාර්යයක්ම අහම්බයක් නොවේ. එය අනිවාර්යයකි. එහෙත් හැම අහම්බයක්ම එය සිදුවන මොහොතට අනුව අනිවාර්යයකි. ඉන් කියවෙන්නේ අහම්බ අනිවාර්යයන් කියා නොවේ. කිසියම් දෙයක ප්‍රධාන සාධකවලට අනුව සිදු නොවිය යුතු දෙයක් වෙනත් හේතුවක් මත සිදුවීම අහම්බය වේ. සමහර විට අහම්බයේ හේතුව අපට සොයාගත නොහැකි වීමට ඉඩ තිබේ. එහෙත් අහම්බය සිදුවන අවස්ථාවේ සිදුවන හා පෙළගැසෙන ක්‍රියාවන්ට සාපේක්ෂව එය අනිවාර්යයක් වේ.

**උදාහරණ මගින් තේරුම් ගැනීම**

සරල උදාහරණ කිපයකින්ම මෙය තේරුම් ගැනීමට අපට පුළුවන. ගුවන්යානාවක ගමනකින් මෙය තේරුම් ගනිමු.

ගුවන් යානා නිෂ්පාදනය කර තිබෙන්නේ විද්‍යාත්මක නියම අනුව ගුවන් ගතවී ගුවනේ පියාසර කොට නියමිත ස්ථානයට ගොඩ බැස්වීමට හැකිවන ලෙසය. ඒ අනුව ගුවන්යානා නිෂ්පාදනයේදී යොදාගන්නා විද්‍යාත්මක සාධකවලට අනුවත් එහි තාක්ෂණික උපකරණ හා ක්‍රියාකාරිත්වයට අනුවත් ගුවන් ගමනක අනිවාර්ය වන්නේ එය අදාල ස්ථානය කරා නිරුපද්‍රිතව පියාසර කිරීමය. එහෙත් සමහර විට ගුවන්යානා මඟදී කඩා වැටේ; ගිනිගැනීමට ලක්වේ. එය අනිවාර්යක් නොව සමස්ත ක්‍රියාවලියට අනුව අහම්බයකි. මන්ද ගුවන්ගත වන හැම ගුවන්යානාවක්ම මඟදී කඩා නොවැටෙන බැවිනි. ඒ අනුව ගුවන්යානයක් මඟදී කඩා වැටීම සමස්ත ක්‍රියාවලියට අනුව අහම්බයක් වුවද එය ඒ නියමිත මොහොතේ සිදුවූ අනපේක්ෂිත සිදුවීමට සාපේක්ෂව කඩාවැටීම අනිවාර්යයකි. එය තේරුම් ගත යුත්තේ එසේය. මිනිසෙකුගේ ජීවිතය දෙසද මේ ආකාරයෙන්ම අපට බැලිය හැක. මහමග වාහන අනතුරට ලක්වීම, ගස් නගින කෙනෙක් ගහෙන් ඇද වැටීම, පිහිනුම් ශූරයෙක් දියේ ගිලී මිය යාම වැනි සමාජීය සිදුවීම් මේ කරුණට අනුව තේරුම් ගත් විට අප වෙනත් වැරදි නිගමනවලට යන්නේ නැත. පිහිනුම් ශූරයෙක් දියේ ගිලීම අනිවාර්යයක් නොව අහම්බයකි. එහෙත් ඒ මොහොතේ බලපෑ අමතර සාධකවලට අනුව අනිවාර්යයකි. මෙය සමාජ ක්‍රමවලටද අදාලය. වහල් ක්‍රමය වෙනස්වී වැඩවසම් ක්‍රමය ඒම අනිවාර්යය වූවා මෙන්ම ධනවාදය වෙනස්වී නව සමාජයක උපත සිදුවීමද අනිවාර්යයකි. ඒවා ප්‍රමාද වීම අහම්බයන්ය.

**අසුබවාදයට නොවැටීමට**

අනිවාර්යයක් හා අහම්බයක් තේරුම් ගැනීමට නොහැකි වීමෙන් සමාජයේ වැරදි ප්‍රවණතා දෙකක් මතුවේ. එකක් අසුබවාදය වන අතර අනෙක විඥානවාදයයි.

අසුබවාදය යනු අහම්බයක් අනිවාර්යයක් ලෙස සලකා නිතර ඊට බියෙන් සිටීමය. එවැනි අය ගුවන්යානාවල යාමට බියවෙති. ඒ, ගුවන්යානා අනිවාර්යයෙන්ම කඩා වැටේ යන සිතුවිල්ල නිසාය. සමහරු උසකට නැගීමට බියවෙති. ඒ

> පිහිනුම් ශූරයෙක් දියේ ගිලීම අනිවාර්යයක් නොව අහම්බයකි. එහෙත් ඒ මොහොතේ බලපෑ අමතර සාධකවලට අනුව අනිවාර්යයකි. මෙය සමාජ ක්‍රමවලටද අදාලය. වහල් ක්‍රමය වෙනස්වී වැඩවසම් ක්‍රමය ඒම අනිවාර්යය වූවා මෙන්ම ධනවාදය වෙනස්වී නව සමාජයක උපත සිදුවීමද අනිවාර්යයකි. ඒවා ප්‍රමාද වීම අහම්බයන්ය.

අනිවාර්යෙන් ඇද වැටේ යයි සිතාය. ඇතැමෙක් සමාජ ක්‍රම වෙනස් නොවේ යැයි සිතති. ඒ, පවතින දේ පැවතීම අනිවාර්යක් ලෙස සලකාය. සමහරු බරපතළ ශල්‍යකර්මවලට බයවෙති. ඒ, ඒවා අසාර්ථක වීම අනිවාර්යය සේ සලකාය. මන්ද අහම්බ ලෙස සමහර ශල්‍යකර්ම අසාර්ථකවී රෝගීන් මිය යන අවස්ථා තිබෙන නිසාය. මෙය බරපතළ වූ විට මානසික රෝගයක් බවටද පත්වේ. මෙහි අනෙක් අන්තයද ඇත. ඒ අහම්බ ගැන නොසලකා සිටීමය. එය සර්ව අසුබවාදය වේ. එවිට සිදුවන්නේ අහම්බ ලෙස සිදුවන අහිතකර දෙයක් වළක්වා ගැනීමට නොහැකි වීමය. ලොව බොහෝ නිෂ්පාදනවලදී අනිවාර්ය ගැන සේම අහම්බය ගැනද සිතා තිබේ. ගුවන්යානයම යළි උදාහරණයට ගත්විට එය අහම්බෙන් කඩා වැටිය හැකි නිසා සමහර සමාගම් ගුවන්යානාවලට එංජින් දෙකක් සවිකර තිබේ. ඒ, එකක් අහම්බෙන් අක්‍රීය වුවහොත් අනෙක පණ ගන්වා ගැනීම සඳහාය. එසේම ගුවන්යානාවල පැරෂුට්, ජීවිතාරක්ෂක කබා ආදිය මගින් සඳහා සකස්කර ඇත්තේද මෙම අහම්බවලට මුහුණදීම සඳහාය. මොටර් රථවල අමතර රෝදයක් ගෙන යන්නේද අහම්බෙන් එක රෝදයක් අක්‍රිය වුවහොත් ඒ වෙනුවට යොදාගෙන ගමන යාම සඳහාය. මේ නිසා අහම්බ අනිවාර්ය ලෙස සලකා බියෙන් කටයුතු කිරීම මෙන්ම අහම්බ නොසලකා කටයුතු කිරීමද වැරදිය.

**වෙලාවද? වාසනාවද?**

ජීවිතයේ සිදුවන අහම්බ තේරුම් නොගැනීම නිසා මිනිස්සු විඥානවාදයට වැටෙති. වෙලාව, වාසනාව, අවාසනාව ආදි ලෙස පවතින අදහස්වල පදනමේ ඇත්තේ මෙම අහම්බයන්ය. අප හදිසි අනතුරකට, ආපදාවකට, රෝගී තත්වයකට අහම්බයක් ලෙස මුහුණ දුන්විට එය 'නරක වෙලාව' ලෙසද අවාසනාව ලෙසද සලකා හිත හදාගැනීමට මිනිස්සු පුරුදුව සිටිති. එසේම අහම්බෙන් යම් අනතුරකින් කරදරයකින් බේරුන විට එය 'හොඳ වෙලාව', 'වාසනාව' ලෙස විශ්වාස කරති. මේ නිසා බිහිවූ මිත්‍යා ඇදහිලි තිබේ. උදාහරණ ලෙස ගත හැක්කේ බල්ලන් කන්පට ගැසීම, හූනන් ඇඬීම අසුබ ලෙස සැලකීමය. සමහර විට ගමනක් යනවිට හූනෙක් ඇඬීමත් අහම්බෙන් එම ගමනේදීම කෙනෙකුට කරදරයක් වීමක් යන එකිනෙකට අසම්බන්ධිත සිදුවීම් දෙක එකට එක්කර ඉන් පොදු මිත්‍යා සංකල්පයන් ගොඩනගා ගැනීමට මිනිස්සු පෙළඹී සිටිති. හූනෙක් ඇඬීම හෝ බල්ලෙකු කන් සෙලවීම සමග අපට සිදුවන අහම්බීය කරදරවලට කිසිම සම්බන්ධයක් නැත. ඒවා අහම්බ වේ. එහෙත් ඒ අහම්බ අනිවාර්ය ලෙස සැලකීම නිසා මිනිස්සු මිත්‍යාවට ගොදුරු වෙති. ලෙඩට වෛද්‍ය ප්‍රතිකාර ලබන අතර ආගමික හෝ යන්ත්‍ර මන්ත්‍රවලින් වතාවත් කිරීමද එසේය. රෝගියා සුවවූ විට එය සිදුවූයේ යන්ත්‍ර, මන්ත්‍ර හෝ ආගමික වතාවත් නිසා යයි සිතති. රෝගියාගේ සුවවීම සමග ඉහත කටයුතුවල කිසිදු සම්බන්ධයක් නැත. මේ පිළිබඳ ප්‍රසිද්ධ ඉතාලි කියමනක් තිබේ. ඒ "රෝගියා මියගියේ නම් වෛද්‍යවරු ඔහු මරා දැමුවෝය, රෝගියා සුවපත් වූයේ නම් සුර දූතයෝ ඔහු බේරා ගත්තෝය" ලෙසය.

මේ සියලු කරුණුවලින් අපට පැහැදිලි වන්නේ කුමක්ද? ලෝකය හා එහි ක්‍රියාකාරකම් තේරුම් ගැනීමේදී නිවැරදි විද්‍යාත්මක දැනුම් ක්‍රමයක් යොදා නොගතහොත් මිනිසුන් මුලාවට හා දුෂ්කරතාවයට පත්වන බවය. අප අවට සිදුවන දේ පිළිබඳ නිරවුල් වැටහීමක් අපට තිබිය යුත්තේ ඒ නිසාය. අප අවට සිදුවන දේවල් සිදුවන්නේ අනිවාර්යයන් ලෙසත් අහම්බයන් ලෙසත්ය යන්නත් අහම්බ 15 වැනි පිටුවට



"ද්‍රව්‍යමය ජීවනයේ නිෂ්පාදන ක්‍රමය විසින් සමාජමය දේශපාලනමය හා චෛතසික ජීවනයේ ක්‍රියාදාමයන් පොදු වශයෙන් හැඩගස්වනු ලැබේ. මිනිසුන්ගේ සත්තාව නිර්ණය කෙරෙන්නේ ඔවුන්ගේ විඥානය විසින් නොවේ. ඊට ප්‍රතිකූල වශයෙන් ඔවුන්ගේ විඥානය නිර්ණය කෙරෙන්නේ ඔවුන්ගේ සමාජ සත්තාව විසිනි."

**ලෙනින්**
**තෝ:කෘ:**
**1වැනි වෙළුම**
**20-21 පිටු**

# ජනතාවගේ අයිතිය වනසන
# හම්බන්තොට ඉඩම් මංකොල්ලය

'ආරක්ෂිත හිස්වැසුම් පැළැඳගත් චීන ජාතිකයින් කිහිපදෙනකි. ඔවුන් සමග කරුණු සාකච්ඡා කරන ටයි පටි පැළැඳගත් අපේ රටේ රාජ්‍ය නිලධාරීහුද ඔබ මොබ ගමන් කරමින් සිටිති. ඔවුන්ට සහය දෙනවා යැයි සිතිය හැකි සේවකයෝද තමන්ට රාජකාරියක් පවරන තෙක් බලා සිටිති. ඔවුන් අත මින්දෝරු කාර්යයන් සඳහා යොදා ගනු ලබන මිනුම් උපකරණද දක්නට තිබේ. ඒ දෙස බලා සිටින ජනතාව කිහිප දෙනෙකි. සිදුවන්නේ කුමක්දැයි මුලදී අපහැදිලි නිසා ජනතාව නිහඬව ඒ දෙස බලාසිටිති. එහෙත් මද වේලාවකින් සිදුවන දේ සැකහැර අවබෝධ කර ගැනීමට ඔවුන්ට හැකිවේ. එම නිසාම අදාළ ස්ථානයට අවට ජනතාව ක්‍රමයෙන් ඒකරාශී වෙති. අවසානයේ මින්දෝරු කාර්යය සඳහා පැමිණි චින් ජාතිකයන් සහ කණ්ඩායම ආපසු තමන් පැමිණි වාහන වලට ගොඩවෙති. ජනතා විරෝධය හමුවේ තමන් පැමිණි කාර්යය සාර්ථක කිරීමට ඉඩකඩ ලැබෙන ඔවුහු ස්ථානයෙන් පළායති.'

මෙය සිනමා පටයක් සඳහා කරන රූගත කිරීමක අදාළ දර්ශන පෙළගැස්මක් නොවේ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවත්වීමේ අයිතිය කොල්ලකන්නට වත්මන් ආණ්ඩුව සකස් කරන ලද සැලසුමක ආරම්භක අවස්ථාවයි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ අක්කර 1200 ක් පමණ මේ වනවිටත් චීනයට පවරා දීමට කටයුතු කර ඇත්තේ හම්බන්තොට වරාය ඉදිකිරීම හා ඊට සමගාමීව ගොඩනැගෙන හම්බන්තොට වරාය නගරය සඳහාය. එසේ තිබියදීත් හම්බන්තොට, ඇඹිලිපිටිය හා මොනරාගල ප්‍රදේශවලින් තවත් අක්කර 15,000ක් පමණ චීනයට පවරා දීමට වත්මන් ආණ්ඩුව කටයුතු කරමින් සිටී. අදාළ තීරණ හා ප්‍රතිපත්ති මෙන්ම සැලසුම්ද මේවනවිට අවසන් කර ඇත. ඉඩම් වෙන් කර ගැනීම සඳහා ඔවුහු සූදානමින් සිටිති. මෙය සෘජුවම ජනතාවගේ අයිතිය පැහැර ගැනීමකි. මක්නිසාදයත් ඉඩම් යනු අපේ රටේ ජනතාවගේ ජීවිත හා බැඳුණු අයිතියක් වන නිසාය.

### භූගෝලීය වැදගත්කම

ශ්‍රී ලංකාවේ ගිණිකොණ දිග සීමාවේ පිහිටා ඇති විශාලත්වයෙන් කි.මී. 2622.82ක් වූ සමස්ත භූමි ප්‍රමාණයෙන් 1/25ක් පමණ වන හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාවට භූගෝලීය



කාලගුණික මෙන්ම සමාජ විද්‍යාත්මක ප්‍රශ්න රාශියක් උද්ගත වෙමින් ඇත. එනම් පාලකයින්ගේ පැවැත්ම වෙනුවෙන් හම්බන්තොට ගොඩනගන ලද ජාත්‍යන්තර වරාය හා ඉඩම් අක්කර 15,000ක් චීන රජයට වසර 99කට පවරා දීමට සැලසුම්කර ඇති නිසාය.

මෙම භූමිය උත්තරාංශක $6^0$ සිට $6.5^0$ දක්වා නැගෙනහිර දේශාංශ $80.6^0$ - $81.7^0$ දක්වා විහිදී පවතී. වයඹින් හා බටහිරින් හඳුගල සියාරපිටිය, කටුවන කිරම වැනි ප්‍රදේශ හැරුණු විට මෙබිම තැනිතලාවලින් යුක්තය. භූමියෙන් 1.2% වැව් හා ජලාශ වේ. තැනිතලා රැලිබිම්ද සාමාන්‍ය උසකින් යුත් පඳුරුවලින්ද, පැලැස්ස නමින් ජනතාව හඳුන්වන බිම්වලින් අනූන වන අතර යාල, ලුණුගම්වෙහෙර ඇතුළු රක්ෂිත වන සම්පත්ද කඩොලාන පරිසර පද්ධතීන්ගෙන්ද පෝෂිතය. සාගර ඉමෙහි බොකු, කලපු, කුඩා වරාය රාශියකි. මේ හැරුණු කොට, වලවේ ගඟ, මැණික් ගඟ, ඌරුබොකු ඔය, කිරිඳි ඔය, කුඹුක්කන් ඔය ඇතුළු දිය දහරාවන් 19ක් දිස්ත්‍රික්කය සාරවත් කරමින් මුහුදට ගලා බසී. මේ මනරම් භූමියෙහි ගැඹුරෙහි ඛනිජ හා පාෂාණ වර්ග පිළිබඳව පරිපූර්ණ විද්‍යාත්මක ගවේශණයක් සිදුකර නොමැති අතර කළුගල්, මැටි, සිප්පි වැනි දේ පමණක් ප්‍රයෝජනයට ගනිමින් සිටී.

අතීතයේ සිටම මෙහි ප්‍රධානතම සුවිශේෂී සම්පත වන මානව සම්පත ප්‍රමාණයෙන් 628 000කි. (ජන හා නිවාස සංගණනය 2012 හා 2015 ඇස්තමේන්තු)

එහෙත් අප ඉහතින් දක් වූ සශ්‍රීක භූමියෙහි ගත වූ වසර 68ක පාලනයෙන් හම්බන්තොට ජනතාව තවමත් මුහුණ දෙන අනේකවිධ ගැටලු අතර, ඉඩම් හිගය, ජල හිගය, ආදී ගැටලු රාශියකි. පාලකයින් මෙම ප්‍රජාව සතු දැනුම හා ශ්‍රමය කළමනාකරණය කර සශ්‍රීක බිමක් ගොඩනගනවා වෙනුවට සියල්ල විකුණා දැමීමට සැලසුම් කරමින් සිටී. මේ මොහොතේ ආසන්න ව්‍යසනය වී ඇත්තේ හම්බන්තොට ජාත්‍යන්තර වරාය විකිණීම හා ඉඩම් අක්කර 15,000ක් චීන රජයට පවරා දීමට සැලසුම් සකස් කිරීමයි. පාලකයින්ගේ පැවැත්මට මෙම ගනුදෙනුව තීරණාත්මක වන්නා සේම ජනතාවගේ ජීවිත ඉරණමද තීරණාත්මක තැනකට පැමිණ ඇත. මේ මගින් ජනතාවට අහිමි වන්නේ භූමිය පමණක් නොවේ. ඔවුන්ගේ ජීවන පැවැත්මද මෙම විකිණීමේ ක්‍රියාවලිය සමග විකිණෙනු ඇත.

> "පාලකයින්ගේ පැවැත්මට මෙම ගනුදෙනුව තීරණාත්මක වන්නා සේම ජනතාවගේ ජීවිත ඉරණමද තීරණාත්මක තැනකට පැමිණ ඇත. මේ මගින් ජනතාවට අහිමි වන්නේ භූමිය පමණක් නොවේ. ඔවුන්ගේ ජීවන පැවැත්මද මෙම විකිණීමේ ක්‍රියාවලිය සමග විකිණෙනු ඇත."

ජාත්‍යන්තර වරායක් සඳහා වූ කදිම භූගෝලීය පිහිටීමකට අපි උරුමකම් කියන්නෙමු. ජාත්‍යන්තර නාවික මාර්ගය වෙරළේ සිට කිලෝමීටරයක් තරම් දුරින් පිහිටීමත් නවීන නාවික යාත්‍රා සඳහා අවශ්‍ය මීටර් 10-20ක ගැඹුර මෙම සාගර කලාපයේ තිබීමත් ජාත්‍යන්තර නාවික ගමනාගමනයේ ප්‍රධාන මග සලකුණු දෙකක් වන මහා රාවණා කොටුව (Great Base) සහ කුඩා රාවණා කොටුව (Little Base) ප්‍රදීපාගාර හම්බන්තොට සාගර කලාපය තුළ පිහිටා තිබීමත් මෙම සුවිශේෂිකමට ප්‍රධාන හේතුවයි.

අතීතයේ පටන් නාවුක කටයුතුවලදී අපේ රටේ වෙරළ තීරය විශේෂ වැදගත්කමක් අත්කරගෙන ඇත. ඒ නිසාම බොහෝ විදේශිකයන්ගේ අවධානයද අප රට කෙරෙහි යොමු විය. හම්බන්තොට වෙරළ තීරය පදනම් කරගනිමින් වරායක් ඉදිකිරීම වඩා ඵලදායී කාර්යයක් බව අපේ රටේ බොහෝ බුද්ධිමතුන් විසින් විවිධ අවස්ථාවන්වලදී කරුණු හෙළිදරව් කරන ලදී. අපේ රටේ වෙනත් වරායන් හා සසඳන විට හම්බන්තොට මෙම වෙරළ තීරය ප්‍රධාන නාවුක මාර්ගයක ආසන්නයේ පිහිටා තිබීමත් එකී යෝග්‍යතාවය තවතවත් තහවුරු කර ඇත. එබැවින් මෙහි ඉදිකළ යුතුව තිබුණේ ලංකාව පසුකර යන නැව්වලට සේවා සපයන වරායකි. එහෙත් රාජපක්ෂ පාලනය ගොඩබිම හාරා භාණ්ඩ හසුරුවන වරායක් ඉදිකළේය. හම්බන්තොට වරාය පාඩු ලබන එකක් වූයේ ඒ නිසාය.

### ජන ජීවිත බිඳවැටීම

ඒ අනුව හම්බන්තොට වරාය සම්බන්ධ විවිධ ගැටලු මතු කරනු ලැබුවද එය ජනතාව සතු සම්පතක් විය යුතුව ඇත. එහෙත් දැන් සිදු වන්නේ පක්ෂ දෙකේ පාලනය විසින් මෙම සංවර්ධන ව්‍යාපෘතිය චීනයට අලෙවිකර දැමීමයි. එමගින් වරායේ ලංකාණ්ඩුවට හිමි කොටස් 20% වෙනුවෙන් ඩොලර් මිලියන 1012ක් ලැබීමට නියමිත අතර එය ආණ්ඩුවට හදිසි අවශ්‍යතාවයක් වන්නේ කඩා වැටෙමින් තිබෙන රුපියලේ අගය රැකගැනීම සඳහාය. ඊටත් වඩා සාහසික වන්නේ ඒ අවට ජනතාව සතු ඉඩම් අක්කර 15,000ක් වසර 99කට චීනයට බදු දීමයි. යෝජිත අක්කර 15,000 පිළිබඳව නීත්‍යානුකූල ගැසට් නිවේදනයක් හෝ විධිමත් පරිසර අධ්‍යයනයක් ඉදිරිපත් වී නැත. එසේම විනිවිදභාවයක්ද දක්නට නැත. සියලු සැලසුම් දන්නා පාලකයෝ මාධ්‍ය සංදර්ශන පවත්වමින් ජනතාවගේ ජීවත්වීමේ අයිතිය විකිණීම සඳහා ගිවිසුම් අත්සන් කරමින් සිටිති. වරාය චීනයට විකිණීමට අමතරව වරාය අවටින් තවත් අක්කර 15,000ක් කර්මාන්ත පුරයකට යැයි පවසමින් චීනයට වසර 99කට බදු දීමට ආණ්ඩුව ගෙන ඇති තීරණය නිසාවෙන් එම ඉඩම්වල ජීවත් වන ජනතාව පත්වී ඇත්තේ බරපතළ ඛේදවාචකයකටය.

යෝජිත භූමිය තුළ ප්‍රධාන වශයෙන්ම සම්ප්‍රදායික පාරම්පරික ගම්මාන රාශියකි. එසේම පසුගිය ආණ්ඩු විසින් ජපන් ණය ආධාර යටතේ සංවර්ධනය කර ජනතාව පදිංචි කළ ගොවි බිම්ද මෙහි පිහිටා ඇත. එම ගොවි බිමක වපසරිය හෙක්ටයාර 01කි. සංවර්ධනය කිරීමට වැය කළ මුදල රු ලක්ෂ 18කි. එලෙස සංවර්ධනය කරන ලද බිම් කැබලි හා වාරි ඉඩම් 5227ක් පවුල්වලට ලබා දී ඇත. පවුල් 6400කි. මේවාට මහවැලිය බදු අයකරමින් සිටී. එසේම ඒවායේ කෙසෙල්, ගස්ලබු වැනි වගාවන් සහ වී වගාවද කෙරෙමින් පවතී. එම ප්‍රජාව සියලු දේ උගස් කර බැංකුවලට ණය වෙමින් ගොවිතැන් කරගෙන යති. ආණ්ඩුව චීනයට විකිණීමට සූදානම් වන්නේ ජනතාවගේ මෙම සියලුම සම්පත් බව ඉතා පැහැදිලිය. මීට අමතරව හම්බන්තොට ප්‍රදේශයෙන් මුළු භූමි ප්‍රමාණය සම්පූර්ණ කිරීමට නොහැකි නිසා රත්නපුර දිස්ත්‍රික්කයෙන් ද හම්බන්තොටට ආසන්නයෙන් මොණරාගල දිස්ත්‍රික්කයෙන්ද ඉඩම් අත්පත් කර ගැනීමට ආණ්ඩුව සූදානම් වෙමින් සිටී. එසේම මෙම ව්‍යාපෘතියට අවශ්‍ය ජලය සැපයීම වෙනුවෙන් ගොවි ජනපද හා ජල යෝජනා ක්‍රම බිලිදීමට සිදුවනු ඇත. එමගින් බරපතළ සමාජ අර්බුදයක් දිස්ත්‍රික්කය පුරා පැනනැගීම වැළැක්විය නොහැක.

### නිහඬ නොවිය යුතු ජනහඬ

එසේම හම්බන්තොට ප්‍රදේශයේ සංවර්ධනයේ නාමයෙන් අතරමංවී සිටින අලි ඇතුන් දිනපතා ගම් වදී. අලින් වෙනුවෙන් කලාපයක් ගැසට් කිරීමද රාජපක්ෂ පාලනය විසින් අතහැර දැමීය. වර්තමාන පාලකයින් මිනිසුන් ගැන නොසිතා සතුන් ගැන කවර කතාද? මෙම ව්‍යාපෘතිය හේතුවෙන් අසරණ සතුන් හා ශාක ප්‍රජාව ගැටලු රාශියකට මුහුණ දෙන අතර එමගින් බරපතළ පාරිසරික ගැටලු ගණනාවක්ද නිර්මාණය කරනු ඇත.

මෙම කරුණු අනුව අක්කර 15,000ක් චීනයට ලබා ගතහැකි වුවහොත් එමගින් සිදුවන සමාජමය හානිය පිරිමැසිය නොහැක. අදත් ජල හිගයෙන් පෙළෙන ජනතාව සතු වතුර ස්වල්පය කර්මාන්ත වෙනුවෙන් වැයකළ විට දැනට ඇති ගොවි බිම්ද පුරන්වනවා මෙන්ම පානීය ජල ප්‍රශ්නයද උග්‍ර වනු ඇත. මේ සියල්ලෙන් වැනසෙන්නේ ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිතය බව ඉතා පැහැදිලිය.

සංවර්ධනයේ මුවාවෙන් සිදුකරන ජනතාවගේ අයිතිය වනසන මංකොල්ලයන් හමුවේ නිහඬව සිටිය හැකි නොවේ. පාලකයන්ට තම දුෂ්ට සැලසුම් සාර්ථක කරගත හැකි වන්නේ ජනතාවගේ නිහඬ වුවහොත්ය. ජනතාව නිහඬ නොවන්නේ නම් පාලකයන්ට තමන්ට අවැසි කාර්යයන් සිදුකිරීමට ඉඩක් නැත. හම්බන්තොට ජනතාවගේ ඉඩම් අයිතිය පිළිබඳ ගැටලුවද විසඳාගත හැකි වන්නේ ජනතා ක්‍රියාකාරිත්වයක් තුළින් පමණක් බව පැහැදිලිය. බර්ටෝල් බ්‍රෙෂ්ට් වරෙක මෙසේ ප්‍රකාශ කර තිබිණි. 'යමෙක් යමක් නොදැන කිසිවක් නොකර සිටින්නේ නම් එය ඛේදවාචකයකි. එහෙත් යමෙක් යමක් දැනගෙන කිසිවක් නොකර සිටින්නේ නම් එය අපරාධයකි."

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස්
වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2016 දෙසැම්බර් 01



# ආපදාවට ලක්වූවන්ට ආධාර ගන්නත් පාරට බැහැලා උද්ඝෝෂණය කරන්න සිද්ධ වුණා

## පාර්ලිමේන්තු මන්ත්‍රී නලින්ද ජයතිස්ස සහෝදරයා

ශ්‍රී ට දශක කිහිපයකයකට කලින් අපේ රට ගැන කථා කරන කොට අප බොහොම ආඩම්බරයෙන් කිව්වා, "අපි නායයෑම්වලින් තොර, භූමි කම්පාවලින් තොර, මහා ආපදාවලින් තොර රටක්" කියලා. නවසීලන්තය වාගේ රටක් මුහුණ දෙන භූමිකම්පා හෝ ගිනි කඳු අපට නැහැ. වාසනාවකට, තවමත් අපි ඒ ආකාරයේ මහා භූතල දෙකකට ආසන්නයේ නොවෙයි ඉන්නේ. නමුත්, වර්තමානයේ අප මුහුණ දෙන ස්වභාව ධර්මයෙන් එන ආපදාවන්ට, ඒ වාගෙම මිනිසා විසින් නිර්මිත ආපදාවන්ට නිවැරැදි සැලසුමක් ඇතිව මුහුණ දෙන්නට කටයුතු කරනවාද කියන ප්‍රශ්නය තිබෙනවා.

මහා පීඩනයක්, බරක්, ජල කඳක් දරා ගත හැකි මධ්‍ය කඳුකරයක් නොවෙයි, අපට තිබෙන්නේ. ඒ නිසාම මේ මධ්‍ය කඳුකරයේ වන වැස්ම ආරක්ෂා කර ගැනීම මෙවැනි ආපදාවන් වළක්වා ගැනීමේ අංක එකේ උපක්‍රමයක්. බ්‍රිතාන්‍යයන්ට අපේ රට ගැන කැක්කුමක් තිබුණේ නැහැ. 1796 බ්‍රිතාන්‍යයන් අපේ රට අල්ලා ගත්තාට පස්සේ ඔවුන් බැලුවේ මෙය ලාභ ලබන යටත්විජිතයක් බවට පත් කර ගන්නේ කොහොමද කියලායි. ඒ නිසා ඔවුන් මධ්‍ය කඳුකරයේ වන වැස්ම ශුද්ධ කර දමලා එහි ආර්ථික භෝග සිටුවන්න පටන් ගත්තා. කෝපි වැව්වා. තේ වැව්වා. පහළ කොටසේ රබර් වැව්වා. නමුත් ඒ කාලයේ ඔවුන් තේ වගාව කර ගෙන යන කොට අඩු තරමින් යම් පාංශු සංරක්ෂණ ප්‍රතිපත්තියක් අනුගමනය කළා. ඔවුන් ඒ කරපු වැඩේ වැරදියි. ඒ වන වැස්ම ඉවත් කිරීම අතිශයින්ම පරිසරයට හානිදායකයි. ඒ අතරත් අඩු තරමින් තමන්ගේ භෝග වගාව පවත්වා ගෙන යන්නවත්, පෙට්ටි කාණු දමලා, ගල් වැටි දමලා, ගස් වවලා යම් පාංශු සංරක්ෂණ ක්‍රමවේදයක් අනුගමනය කළා. නමුත් පෞද්ගලික කොම්පැනිවලින් වතු ටික ගත්තාට පස්සේ එවැනි කුඩා ප්‍රමාණයෙන් පාංශු සංරක්ෂණ ක්‍රමවත් අනුගමනය කළේ නැහැ. ඒ නිසා ඒ හානියට, ඒ විපතට අද අපි මුහුණ දෙනවා.

### අවිශ්වාසය

අපේ ආපදා කළමනාකරණයේ මූලික ප්‍රශ්නයක් තමයි ආපදා සන්නිවේදනය පිළිබඳ ගැටලුව. ලෝකයේ ආපදා සන්නිවේදනය දැන් වේගයෙන් දියුණු වෙලා තිබෙනවා. ආපදා සන්නිවේදනයේ ප්‍රධාන කරුණු කිහිපයක් තිබෙනවා. එකක් තමයි, ජීවිත ආරක්ෂා කර ගත හැකි තොරතුරු හැකිතාක් ඉක්මනින්, හැකිතාක් නිවැරදි ලෙස, විවිධ මාර්ග යන් ඔස්සේ ඉලක්කගත පිරිසකට බෙදා හැරීම. ඒ නිසා ආපදා සන්නිවේදනයට ඔන්න ඔය කියන කරුණු පහම අඩංගු වෙන්න ඕනෑ. නිවැරදි තොරතුරු ඉක්මනින්, ජීවිත ආරක්ෂා කරන විභවයක් තිබෙන තොරතුරු බහුවිධ මාර්ගයන් ඔස්සේ ඉලක්කගත ප්‍රජාවට බෙදා හැරීම. හැබැයි, අපේ රටේ ආපදා සන්නිවේදනය පැත්තෙන් අපි කොයි තරම් දුරකට ගිහිල්ලා තිබෙනවාද? පසුගිය කාලයේ කෑගල්ලේ, බුලත්කොහුපිටිය පැත්තේ නායයෑමේ අවදානමක් තිබෙනවා කියන කොට, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හරි, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් හරි ඇවිල්ලා ලවුඩ්ස්පීකර් එක දමා ගෙන තැන් තැන්වලට ගිහිල්ලා කියනවා හැර, මෙගා පෝන් එක පාවිච්චි කරලා කියනවා හැර විධිමත්ව, කඩිනමින්, ඉලක්කගත ප්‍රජාවක් සඳහා තොරතුරු ලබා දෙන්න තිබුණ වැඩපිළිවෙළ කුමක්ද?

> මෙතැන පැන නගින ප්‍රධාන ගැටලු දෙකක් තිබෙනවා. එකක් තමයි ලබා දෙන තොරතුරු පිළිබඳව ජනතාවගේ විශ්වාසය මුළුමනින්ම බිඳ වැටී තිබීම. දෙවැනි කාරණය තමයි තොරතුරු ලැබුණත් ජනතාවට තමන්ගේ දේපොළ දමලා යන්න තරම් විශ්වාසයක් නොමැති වීම.

මෙතැන පැන නගින ප්‍රධාන ගැටලු දෙකක් තිබෙනවා. එකක් තමයි ලබා දෙන තොරතුරු පිළිබඳව ජනතාවගේ විශ්වාසය මුළුමනින්ම බිඳ වැටී තිබීම. ඒ නිසා කලින් ඒ තොරතුරු ලබා දීලා එවැනි ආපදාවක් සිදු නොවුණහොත් ජනතාව ඒ තොරතුරු පැත්තකට දමනවා. දෙවැනි කාරණය තමයි තොරතුරු ලැබුණත් ජනතාවට තමන්ගේ දේපොළ දමලා යන්න තරම් විශ්වාසයක් නොමැති වීම. ඒ නිසා පසුගිය ගංවතුර වෙලාවේදී අගමැතිතුමාට කියන්න සිද්ධ වුණා " පොලිසිය දමලා දේපොළ ආරක්ෂා කරවන්නම්, යන්න." කියලා.

### ආර්ථික බැඳීම්

ඒ ප්‍රදේශය දමා යන්න කියලා NBRO එකෙන් කිව්වාට ඒ මිනිසුන් ගෙවල් හදාගෙන ඉන්නේ ඒ ප්‍රදේශයේ නම්, වගා කරලා තිබෙන්නේ එතැන නම්, වෙන යන්න තැනක් නැත්නම්, දීලා තිබෙන ඉඩමත් යෝජනා කරලා තිබෙන ඉඩමත් තමන්ට රැකියාවක් කර ගන්න අපහසු තත්ත්වයක තිබෙන එකක් නම්, ජනතාව එතැන දමා යන්න සූදානම් නැහැ. "අද මුහුදු යන්න එපා" කියලා ධීවරයින්ට කිව්වාට ඒ මිනිසුන්ට වෙන ජීවත් වෙන්න විධියක් නැත්නම් මොකක්ද කරන්නේ? කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට ඇඟ බේරා ගන්න පුළුවන්. හැබැයි ප්‍රශ්නයට විසඳුමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේ රජයේ ආයතන සියල්ල වැඩ කළ යුත්තේ තමන්ගේ ඇඟ බේරා ගන්න නොවෙයි. ජනතාව බේරා ගන්නයි.

සාලාව අවි ගබඩාව පිපිරීමේ ප්‍රශ්නය ගත්තොත්, ජනතාවට ගෙවල් අහිමි වෙලා විතරක් නොවෙයි, ව්‍යාපාර කර ගන්නට බැරි වෙලා තිබෙනවා විතරක් නොවෙයි, තමන්ගේ වන්දි ආධාර ලබාගන්නට දැන් පාරට බහින්නත් සිද්ධවෙලා තිබෙනවා.

මා ළඟ තිබෙනවා, 2016 වර්ෂයේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් නිකුත් කළ වාර්තාව. ඒ අනුව මේ දක්වා අපේ රටේ ආපදා තත්වය හේතුවෙන් පවුල් තුන්ලක්ෂ හැත්තෑහතරදාහක් පමණ, නිවාස හානි හාරදහස් දෙසීයක් පමණ, අර්ධ නිවාස හානි පනස්පන්දාහක් විතර සිද්ධ වෙලා තිබෙනවා. කඩිනම් සහන සඳහා කෝටි දහතුනකුත්, රුපියල් දහදාහේ ආපදා සහනධාර සඳහා කෝටි පනස්දෙකකුත් වෙන්කර තිබෙනවා.

මේ ආධාර ටික වුණත් නිකම්ම ලැබුණේ නැහැ. කෑගල්ලේ කළුපහනේ ජනතාවට, කඩුවෙල ජනතාවට, සාලාව ජනතාවට පාරට බැහැලා උද්ඝෝෂණය කරන්නට සිද්ධ වුණා.

2016 දෙසැම්බර් 01



# 'රාජ්‍ය පෞද්ගලික දෙඅංශයටම භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක විය යුතුයි'

## පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක සහෝදරයා

ජාතික භාෂා ප්‍රතිපත්තිය තිබුණාට, ඒ ප්‍රතිපත්තිය නීත්‍යනුකූලව ක්‍රියාත්මක කරවීමට දැනට බලය තිබෙන්නේ, රාජ්‍ය ආයතනවලට පමණයි. ඒ නිසා මා වර්තමාන ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, අනිවාර්යෙන්ම මෙම ජාතික භාෂා ප්‍රතිපත්තිය රටේ ආණ්ඩුව ඇතුළු සෑම පුරවැසියෙක්ම, සෑම පවුලක්ම, පෞද්ගලික අංශය ඇතුළු සෑම සංවිධානයක්ම ක්‍රියාත්මක කළ යුතු දෙයක් විධියට නීතිය සංශෝධනය කරන්න කියලා.

අද රටේ ආර්ථික කටයුතු ගත්තොත් සියයට 90ක් පමණ මෙහෙය වන්නේ පෞද්ගලික අංශයෙන් කියලා ඔබතුමා දන්නවා. එතකොට, පෞද්ගලික අංශය ඒ භාෂා ප්‍රතිපත්තිය රකින්නේ නැතිනම්, ආණ්ඩුවට පමණක් -ආණ්ඩුවේ කාර්යාලවල තිබෙන බෝඩ් එකකින් පමණක්, එහෙමත් නැත්නම් එවැනි කටයුත්තකින් පමණක් - මේ ජනතාව මුහුණ දෙන සන්නිවේදන ගැටලු බේරා ගන්න බැහැ.

මගේ මූලිකම ඉල්ලීම තමයි, පෞද්ගලික අංශයට සහ රටේ ඕනෑම තැනකට බලපාන විධියට අඩුම වශයෙන් එම භාෂා දෙකෙන් වැඩ කරන්න පුළුවන් වන ආකාරයට නීතිය වෙනස් කරන්න කියන එක. ඒවාගේම සමහර ස්ථානවල නම් සම්බන්ධ කරුණුවලදීත්.

### භාෂා ගැටලුව

අපි කනගාටු වෙනවා මේ අමාත්‍යාංශයට වෙන් කරලා තිබෙන මුදල ගැන. මම දන්නේ නැහැ මේ අමාත්‍යාංශයට පසුගිය අයවැයෙන් වෙන් වුණු මුදල්වලින් වැඩ ගත්තාද කියලා. නමුත් ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයට වගකීමක් තිබෙනවා, -මේ රටේ භාෂා ප්‍රශ්නය නිසා ගැටලු ඇති වුණු නිසා- විශේෂයෙන්ම උතුරු පළාතේ සහ වෙනත් ප්‍රදේශවල ආණ්ඩුවේ කාර්යාලවලට සිංහල සහ දෙමළ භාෂා දෙකම දන්නා නිලධාරීන් බඳවා ගැනීමට. ඒ සඳහා මේ ආමාත්‍යාංශයට බලයක් තිබෙනවා. යම් ප්‍රමාණයක් බඳවාගෙනත් තිබෙනවා. නමුත් අපි දන්නා දේ තමයි ඒක හරියාකාරව ඉෂ්ට වෙලා නැහැ කියන එක.

අද අපි දෙමළ ජනතාවගේ ප්‍රශ්න ගැන කථා කරනවා, මේ ප්‍රදේශවල ජීවත් වන දෙමළ ජනතාවට සිංහල නොදැනීම නිසා. ත්‍රිකුණාමල නගරයට ගියාම ඒ ප්‍රශ්නයටම සිංහල ජනතාව මුහුණ දෙනවා. ත්‍රිකුණාමල නගරයේ ප්‍රධන කාර්යාල සියල්ලේම ඉන්න බහුතර නිලධාරීන් දෙමළ සහ මුස්ලිම්. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. ඊට ආසන්න කන්තලේ ජීවත් වන සිංහල ජනතාව දෙමළෙන් කථා කරන්න දන්නේ නැහැ. ඒ ප්‍රශ්නයටම මුහුණ දෙනවා වවුනියාවේ ඉන්න සිංහල ජනතාවත්. අපි දකින දේ තමයි මේ අමාත්‍යාංශයෙන් අවශ්‍ය තරම් ද්විභාෂා දැනුම තිබෙන නිලධාරීන් බඳවාගෙන නැති බව. සමහර විට බඳවාගෙන තිබෙන පුද්ගලයන් ඒ ප්‍රදේශවල අය නොවෙයි.

> මම එදත් කිව්වා, විග්නේශ්වරන් මහතාගේ එක කුස උපන් සහෝදරයා තමයි, මහින්ද රාජපක්ෂ මැතිතුමා කියලා. විග්නේශ්වරන් මහත්තයා නැත්නම් මහින්ද රාජපක්ෂ මහත්තයාට දේශපාලනයක් නැහැ.

### අරමුදල් කප්පාදුව

සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයට 2016 අවුරුද්ද සඳහා රුපියල් මිලියන 791ක් වෙන් කරලා තිබුණා. නමුත් 2017 අවුරුද්ද සඳහා වෙන් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 677යි. හරියටම ගත්තොත් රුපියල් මිලියන 115ක් කපලා තිබෙනවා. 2016දී වර්ෂයේ අමාත්‍යාංශයට වෙන් කළ ප්‍රමාණයෙන් සියයට 16ක් කපලා තිබෙනවා.

මේ රටේ දෙමළ ජනතාව යුද්ධයෙන් සුවිශාල පීඩාවකට ලක්වුණු බව අප කවුරුත් පිළිගන්නවා. ඒ ගැන කිසිම විවාදයක් නැහැ. සිංහල ජනතාවත් එම පීඩාවට ලක්වුණා; මුස්ලිම් ජනතාවත් ලක්වුණා; වැඩිපුර යුද්ධය තිබුණේ උතුරේ නිසා දෙමළ ජනතාව වැඩිපුර පීඩාවට ලක් වුණා. එම නිසා පක්ෂයක් වශයෙන් අප දිගින් දිගට කියා තිබෙනවා. යුද්ධයෙන් පසුව රාජ්‍ය අයවැයෙන් වැඩිම මුදල් ප්‍රමාණයක් උතුරට වෙන් කරන්න කියා. මේ වුණු වැරැද්ද, මේ වුණු අඩුපාඩුව, මේ වුණු පීඩාව අප රටක් වශයෙන් එකතු වෙලා හදන්න ඕනෑ. උතුරේ දෙමළ ජනතාව සම්බන්ධයෙන් වැඩි හැඟීමක් තිබෙන බව පෙන්වීම සඳහාත් ඔවුන්ගේ ජන ජීවිත ගොඩනැගීම සඳහාත් හැම පැත්තෙන්ම මුදල් - හදල් වෙන් කරන්න කියලා අප කියා තිබෙනවා. ඒක අප ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගන්නවා. ඒ දෙය කරන්න කියා අප ඉල්ලා සිටිනවා.

### ජාතිවාදය

මම දැක්කා, ඡ් එකේ එක්තරා ජාතිවාදී සිංහල සංවිධානයක් දමපු කාරණයක්. මම එහි කොටසක් කියන්නම්. ඔක්කොම කියන්නේ නැහැ. මොකද, ඒවා ඉස්මතු කරන්න ඕනෑ නැති නිසයි. ඔවුන් ලංකාවේ දළ ජාතික නිෂ්පාදනයට පළාත්වලින් තිබෙන දායකත්වය ගැන තමයි ප්‍රශ්න කරන්නේ. බස්නාහිර පළාතෙන් සියයට 42ක් දායක වෙනකොට උතුරු පළාතෙන් තිබෙන්නේ සියයට 3.6යි. එතකොට මේ පාර්ලිමේන්තුව උතුරු නැගෙනහිරට ප්‍රතිපාදන වෙන් කළ යුතු වන්නේ සියයට 3.6ද? නැහැ. අපි විශ්වාස කරනවා. උතුරු නැගෙනහිරට සියයට 25ක් වියදම් කළ යුතුයි කියා. මොකද, අවුරුදු 30ක් පිටුපසින් තමයි උතුරු නැගෙනහිර පළාත ඉන්නේ. නමුත් ජාතිවාදී විධියට නම් මේ ප්‍රශ්නය එන්නේ, ජාතිවාදීන් නියමෙටම ඒවා පාවිච්චි කරනවා. හැබැයි, අපි කවුරුත් සම්බන්ධ යුද්ධයක්; කවුරුත් වගකිවයුතු යුද්ධයක්. කවුරුත් අසාර්ථක වෙච්ච කාරණයකදී උතුරේ මන්ත්‍රීවරු එක්කෙනෙක් දෙන්නෙක් කියනවා නම් එහි සම්පූර්ණ වගකීම දකුණේ සිංහල අය භාරගන්න ඕනෑ කියලා, එහෙම නම් සිංහල ජාතිවාදීන් කියයි, උතුරෙන් දළ ජාතික නිෂ්පාදනයට දායකත්වය තිබෙන්නේ සියයට 3.6යි; එහෙම නම් ඒ සියයට 3.6 ගන්න කියලා. උතුරු නැගෙනහිරට සියයට 3.6ක් වෙන් කළොත් එහි සිටින ගුරුවරුන්ට සහ වෛද්‍යවරුන්ට පඩි ගෙවන්නවත් ප්‍රමාණවත් නැහැ. ඒක වැරැදියි. ඔබතුමන්ලා ඒ තරමම සංවේදීව හිතන්නේ නැති වන්නට 15වැනි පිටුවට

කවුළුව හැර තබමි

# ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණේ



සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම් පුරා හතළිස් පස් වසරක් අපමණ වෙහෙස දරා අවබෝධ කරගෙන බුදුන් වදාළා යැයි කියන ධර්මය පවා අද මේ ධර්මද්වීපය යැයි කියන රටේ මල්වත්ත පාරේ, සීඩී තැටියකට දමා පේමන්ට් එකේ අලෙවි කරනු ලබයි. මිනිස්සුද ඒවා ශ්‍රද්ධා භක්තියෙන් මිලදී ගනිති.

මෙහෙව් රටේ පසුගිය වසරේ නොවැම්බර් මස 2017 වසර සඳහා අයවැය ලේඛනයක් ඉදිරිපත් කළ මුදල් ඇමතිවරයා කීවේ මෙවර රටේ ජනයා හොල්මන් වන අයවැයක් ඉදිරිපත් කරන බවය. අයවැය දෙස බලන විට අපට පැන නැගුණේ ඇත්තටම මේ අයවැය ඉදිරිපත් කර ඇත්තේ හොල්මන් වූ ජනතාවක් සිටින රටකට දැයි යන ප්‍රශ්නයයි.

මෙවර වැඩකරන ජනයා භුක්ති විඳි දින 180කින් ස්ථිර වීමේ අයිතිය පවා උදුරාගෙන ඇති මේ අයවැය, රටේ රාජ්‍ය ආයතන සහ භූමිය ඇතුළු ස්වාභාවික සම්පත් සියල්ල විකිණීම සඳහා මිල ගණන් ලංසු කැඳවූ වෙන්දේසිකරුවකුගේ ටෙන්ඩර් පත්‍රයකට සමානය. අද ලංකාවේ ආණ්ඩු කරන්නේ දේශපාලනඥයින් නොව වෙන්දේසිකරුවන්ය. ඔවුන්ගේ එකම තේමා පාඨය 'සියල්ල අලෙවිය සඳහා' යන්නය. ඒ අනුව මේ ඉදිරිපත් කර ඇත්තේ අයවැය ලේඛනයක් නොව මුළු ලංකාවම විකුණා දැමීම සඳහා මිල ගණන් කැඳවූ ටෙන්ඩර් දැන්වීමකි.

ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ජාත්‍යන්තර උකස්බඩු කඩවලට ලංකාව උකසට තබා ඇති අපේ රටේ පාලකයෝ දැන් පම්පෝරි ගසන්නේ ලංකාවට 'ඩොලර්' ගංගාවක් ගලා එන බවටය. බඩු උගස් තබා ණය ගැනීමට විශේෂඥ දැනුමක් අවශ්‍ය නැත. එමෙන්ම රට උකසට තබා ඩොලර් කුට්ටියක් ගෙන ඉන් කොටසක් යටිමඩිගසා ඉතිරිය ණය ගෙවීමට යොදා ඒ සඳහා රටම විදෙස් කොල්ලකරුවන්ට බිලිදීම සුපිරි ආර්ථික සංවර්ධනයක් ලෙස හඳුන්වන ලෝකයේ එකම රට ලංකාව විය හැක. හෝ රටට ගිය කල..

# ගෙල වැලලාගෙන පතනා පැතුම්!

සුපුරුදු පරිදි නව වසරේ සුභ පැතුම් දෝරේ ගලායයි. මාධ්‍ය හරහා සුභ පැතුම් වර්ෂා වසී. මඟ තොටේදී, කාර්යාලයේදී හමුවන හැම දෙනාගේම මුවින් පිටවන්නේ 'හැපි නිව් ඉයර්' කියායි. ජනාධිපතිවරයාගේ සිට මඟ තොටේ හමුවන රට කජු වෙළෙන්දා පවා 'හැපි නිව් ඉයර්' කියයි. මේ සෙල්ලම අප කරන්නේ දශක ගණනක සිටය. එහෙත් එසේ සුභ වූ එකදු වසරක්වත් ලාංකේය ජනයාට උදා වුයේද? හැම අලුත් වසරකම ඊට කලින් වසරට වඩා අසුභ දේම රටේ ජනයාට නොලැබුණේද?

පත්තරයක් ගත්තාම මුල් පිටුවේ සිට අග ක්‍රීඩා පිටුව දක්වාම ඇත්තේ අසුභ ප්‍රවෘත්තිය. සිතට සහනය දෙන එකදු ප්‍රවෘත්තියක් නැත. සුභපතා ගන්නා හැම දිනකම සිය ගණනක් මහපාරේ අනතුරුවලින් මියයති. මව්පියෝ, දූ දරුවෝ බූදල්වලටම මරා ගනිති. බීලා පිස්සු කෙළින මිනිස්සු රේල් පාරේ පීලිගලවති. රටේ කොතනක හෝ මංකොල්ලයකි. මිනීමැරුමකි. ඒවා රටේ ජන ජීවිතයේ දෛනිකාංග බවට පත්වී ඇත.

ආණ්ඩුව කම්කරුවන්ට තඩිබාති. මාධ්‍යවලට වාරණ, තර්ජනය. දඩබර, බදුබර, බඩු මිල අහස උසටය. ජනයා නොමරා මරති. පාලකයෝ සැපම ඉල්ලති; ලබා ගනිති.

ධනවාදය මිනිසුන් අන්දවනවා




මෙන්ම එකිනෙකා අන්දවා ගැනීමටද අවකාශ සලසයි. මේ ඇන්දීම දැන් ජීවන විලාසිතාවකි. නග්න ස්වාර්ථකාමය හැර හැර වෙන කිසිවක් ඉතිරිකර නැති මේ නරුම සමාජ ක්‍රමය එකිනෙකාව රවටා ගැනීමට, ලණු දීමට, ලණු ගිලීමට පොළඹවා ඇත්තේ මෙතරම් සූක්ෂම ලෙස ද? මෙහෙව් රටක මිනිසුන් එකිනෙකාට සුභ පතා ගැනීමට හෘද සාක්ෂිය අවදි කර ගන්නේ කෙසේද? ඇත්තටම අපිට සුභ වන්නේ මේ ව්‍යාජ බැඳීම් සහ රංගනයන් කඩා බිඳ දැමූ දවසක නොවේද? මේවා සැබෑවටම තේරුම් ගත් දිනයක නොවේද? අපට ආකාශ්මික පැතුම් අවශ්‍ය නැත. ඇත්ත මිනිස් පැතුම් අවශ්‍යය. ඒ සඳහා ඇත්ත මිනිස් බැඳීම් සහිත සමාජයක් අවශ්‍යය. එදාට සුභ පැතුම් යන්නද අවශ්‍ය නොවේ. මන්ද මිනිස් ජීවිත ඇත්තටම සුභ වන පරිසරයක් නිර්මාණය වන නිසාය. එතෙක් අප හැමෝම ඉන්නේ ගෙලට තොණ්ඩුව දමාගෙන 'හැපි නිව් ඉයර්' කියන සමාජයකය.

# ඓතිහාසික ජනවාරි 01

දිගින් දිගටම එල්ල වූ ඇමරිකානු හා අධිරාජ්‍යවාදී සම්බාධක හමුවේත් අසූව දශකයේ සිදුවූ සෝවියට් සමාජවාදී රාජ්‍ය පද්ධතියේ කඩා වැටීමත් නිසා බරපතළ අභියෝග රැසකට මුහුණ දුන් සමාජවාදී කියුබාවේ නායක පිදෙල් කස්ත්‍රෝගෙන් වරක් මාධ්‍යවේදියෙක් මෙසේ ප්‍රශ්නයක් ඇසීය.

"ඔබ දැන් තනිවෙලා නේද?" පිදෙල් ඊට දුන් පිළිතුර වූයේ "ඔව්, ඒත් අපි ඉහළින්ම" යනුවෙනි.


1959 ජනවාරි 01 දින කියුබානු විප්ලවය සිදු වුණේ මුළු අධිරාජ්‍යවාදී ලෝකයම සලිත කරමින් හා ලොව පුරා පීඩිත ජනයාට, පීඩිත ජනතා ව්‍යාපාරවලට නව බලාපොරොත්තුවක්, නව ජවයක් ගෙන එමිනි. එය ලතින් ඇමරිකා කලාපය තුළ ඓතිහාසික කාල පරිච්ඡේදයක ආරම්භයක්ද විය.

සෝවියට් දේශයේ කඩා වැටීමත් සමඟ ලොව බොහෝ වාමාංශික රටවල් සහ ව්‍යාපාර තම රතු ධජ හකුළා ගනිද්දී කියුබාව සිය විප්ලවීය ධජය තව තවත් ශක්තිමත්ව ඉහළට එසවීය. කියුබානු නායකයාගේ සහ ජනතාවගේ විශේෂත්වය එයය. යුගයේ විප්ලවීය පූර්වාදර්ශයද එයය.

විවිධ න්‍යායික පීලි පැනීම් හමුවේ සමාජවාදී රාජ්‍ය සහ ව්‍යාපාර කඩාවැටෙද්දී "සමාජවාදය ඉවරයි", "දැන් අවලංගුය"යනුවෙන් කෑමොර දුන් සකලවිධ ප්‍රතිගාමීන් විමතියට පත්කරමින් සිය විප්ලවීය ධජය ලොව ඉහළින්ම ලෙලවමින් කියුබානු ජනතාව අදත් සමාජවාදය වෙනුවෙන් දිවිහිමියෙන්ම සටන් වදිති.

"අපි තනිකිරීමට කැසකවන්නේ තොපය. එහෙත් අපි අපේ ජනතාව අතර ඉහළින්ම සිටිමු. ලොව පීඩිත ජනයාගේ හදවත්ද අපව ඉහළින්ම ඔසවනු ලැබ ඇත." කියුබානු නායකයාගේ ඉහත කෙටි ප්‍රකාශයේ අන්තර්ගතයයි.

දණින් නොවැටෙන ජනතාවක් නිම කළාට, දණින් නොවැටෙන රටක් නිම කළාට, සමාජවාදී ධජය ඔසවාගෙන ඉදිරියටම යන රටක් ලොවට දායාද කළාට, ජනවාරි 01වැනි දිනය ඓතිහාසික දිනයක් බවට පත් කළාට 'පිදෙල් සහෝදරය' ඔබට ස්තුතියි.



# පොලිටිකල් පංතිය

පොලිටික්ක පංතියට උදෙන්ම ඇවිත් මේසේ කොණකට බර දීලා පංතියට එන හැමෝටම ගුඩ් මෝනිං කියනවා.

"මේකනම් කැන්වසින් වැඩක්..." මංජුව මෝනිං කියල යන ගමන් කනියගෙ බඩට ඇඟිල්ලෙන් ඇනල කිවුව.

"ළමයිනේ පහුගිය දවස්වල නිවුස් බැලුවද?" හැමෝම වගේ වාඩිවෙනකම් ඉඳල පොලිටික්ක ඇහුව.

"නිවුස්නම් බැලුව සර්. කීයක් කියල නිවුස් තිබුණාද?...සර් කියන්න හදන නිවුස් එක මම බැලුවද දන්නෙ නෑ." මංජුව නක්කලේට කිවුව.

"ඔය ළමය දැක්කද මං දන්නෙ නෑ. මං ඇහුවෙ වරායෙ ස්ට්‍රයික් එක ගැන." පොලිටික්ක බොහොම ඉවසිල්ලෙන් කතාව.

"ආ ඔව් සර්. අපිත් දැක්ක. හරි පවු නේද?" පංතියෙ කීප තැනකින්ම හඬවල් ඇහුණ.

"දැක්කද ස්ට්‍රයික් එකකට නේවි එක දම්මල ගහනව." නිවුස් එක දැකල තිබුණට පොලිටික්කට දැනුණ හැපි එකට ගහපු එකේ බරත් හෑල්ලු වුණා වගේ. "මං කිවුවෙ... කොච්චර අමානුෂිකද කම්කරුවන්ට ගහන එක. අනෙක නාවික හමුදාපතිම මැරයෙක් වගේ මාධ්‍යවේදියෙක්ට තඩි බානව."

"මාධ්‍යවේදියගෙ හක්ක පන්නන්න හැදුවෙ කලින් යෝ බඩා නේවි එකට අරන් ඩබල් ප්‍රමෝෂන් දීපු ලොක්කලු නේද?" කනියත් නිවුස් අප්ඩේට් වෙලා.

"වරාය සේවකයින්වත් අරන් තියෙන්නෙ අන්දල නේද වරාය අධිකාරියට බන්ද ගන්නව කියල." චමියත් නිවුස් බලල විතරක්ම නෙමෙයි. "බුදු අම්මේ ඔය රස්සා ටිකට ෆෝම් කොළ කීදාහක් බෙදන්න ඇද්ද? ඡන්ද කීයකට තොරෙම්බල් කළාද? සමහරු සල්ලිත් දීල ඇවිත් තියෙන්නෙ. අපිත් දැන්නෙ දන්නෙ වරායෙ වැඩ කළාට මෑන් පවර් වගේ ඉඳල තියෙන්නෙ කියල."

"දේශපාලකයන්ගෙ රස්සා බෙදිල්ලෙ තරම තමයි ඕක. අනෙක ඕනැම තැනක ආණ්ඩුව ඔය වගේ වැඩ බේරගන්න හදන්නෙ තමන්ගෙ සන්නද්ධ බලේ පාවිච්චි කරලනෙ." සමන දර්ශනේ දැම්ම.

"එහෙම බැරිලුනෙ සමන්. දැන් මහින්ද මහත්තයත් රැස්වීමක කිවුව සේනාධිනායකගෙ අවසරයක් නැතුව හමුදාව කැඳවන්න බැරිලු. ඒ කියන්නෙ ජනාධිපති මේකෙ වගකීම ගන්න ඕනැලු." පොලිටික්ක අහිංසක විදිහට තෝරාගත් ප්‍රශ්නවලට බහ තෝරනව.

"දැන් මහින්ද මහත්තයට ඒක තේරෙනවලුද?" මංජුවගෙ කින්ඩි හිනාව ආයෙත් මතුවුණා.

"ඇයි මොකද ළමයො, මහින්ද මහත්තය ජනාධිපති වෙලා හිටපු අත්දැකීමෙන්නෙ කියන්නෙ." පොලිටික්කට ටිකක් විතර අඤ්ඤකොරොස් වුණා.

"ඇත්ත තමයි මහින්ද මහත්තය කියන්නෙ. එයා ඒක දන්නව." සමන ස්ථිරෙට කිවුව.

"අන්න හරි සමන්." ගහගෙන ගිය පොලිටික්ක පිදුරු ගහක එල්ලුණා.

"මම මහින්ද මහත්තය දන්නව කිවුවෙ එයා එහෙම කරපු හින්ද. රතුපස්වලට හමුදාව කැඳවල වෙඩි තිබ්බ. මිනිස්සු මළා. කටුනායක සේවක උද්ඝෝෂණේට හමුදාව කැඳෙව්වා. වෙඩි තිබ්බා. රොෂේන් චානුක මැරුවා. හලාවත ධීවර උද්ඝෝෂණේ මර්දනේ කරන්න හමුදාව දැම්ම. වෙඩි තිබ්බ. ඇන්තනි සහෝදරයා මැරුව. ඉතින් මහින්ද මහත්තයා මේ හමුදාව කැඳවිල්ල හොඳට දන්නව." සමන කියාගෙන යනව, චක්කඩ කැඩුව වගේ. "අවුල තමයි එයා දැන්වත් ඒ මරණවල කොහොම වෙතත් හමුදාව කැඳවපු එකේවත් වගකීම බාර ගන්නෙ නැති එක."

සමනගෙ කතාව අතරෙ පොලිටික්ක නැතිවුණු මොනවද හොයනව වගේ හම් මල්ලට මූණ ඔබා ගත්තත් හැමෝම දැනගත්ත පොලිටික්කගෙ නැති වුණේ මොකද්ද කියල.

## අර්බුදයට විසඳුම...

05 පිටුවෙන්




මෙහිදී මෛත්‍රී සිටින්නේ දෙගෙඩියාවකය. ආණ්ඩුව පවත්වාගෙන යාමට, බටහිර හොඳහිත දිනාගැනීමට, දෙමළ සංවිධානවල හොඳහිත දිනාගැනීමට ඔහු නව ව්‍යවස්ථාව වෙනුවෙන් පෙනී සිටිය යුතුය. එහෙත් නව ව්‍යවස්ථාවට මහින්ද කල්ලියෙන් එල්ලවන විරෝධය 'රට බෙදන්න හදනවා' යනුවෙන් වන මතය හා ඒ මගින් ශ්‍රීල.නි.ප. තුළ වන බෙදීම තව තවත් තීව්‍රවීම මෛත්‍රීට හොඳ නැත. ඔහු ඊට කැමතිද නැත. විශේෂයෙන් පළාත් පාලන ඡන්දය එන්නේ නම් ඒ අස්සේ මෙවැනි සංවාදයක් මෛත්‍රී පිලට අහිතකරය. ඒ නිසා ඔහු ව්‍යවස්ථාව මඟහැර සිටීමට උත්සාහ කළොත් එය පුදුම විය යුතු නැත.

මහින්ද රාජපක්ෂ කල්ලිය යෝජිත ව්‍යවස්ථාවට දැනටමත් විරෝධය පළකොට ඇති අතර ඔහු මෙය තම දේශපාලන බංකොලොත්බව වසාගැනීම සඳහා ජාතිවාදී ස්වරූපයකින් යොදාගන්නවා ඇත. රාජපක්ෂ කල්ලියේ අනෙක් පක්ෂද එම මඟම යනු ඇත. ඒ අතර දෙමළ ජාතික සංවිධානය මේ දෙස බලනු ඇත්තේ උතුරේ දේශපාලනය තුළ තම නොහැකියාව වසා ගැනීමටත් යළි බලය බෙදීමේ දිශාවට සංවාදය සකසා සිය දේශපාලන වුවමනාවන් වෙනුවෙන් මෙය උපයෝගීකර ගැනීමටය.

මේ තත්වය මත විවිධ පක්ෂ තම තමන්ගේ පංති අරමුණුවල සිට ක්‍රියාත්මක වන තත්වය තුළ නව ව්‍යවස්ථාවක් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දයෙන් හා ජනමත විචාරණයකින් සම්මත කර ගැනීම ඉතාම දුෂ්කර කාර්යයක් වනු ඇත.

මේ තත්වය මත නව ව්‍යවස්ථාව සඳහා වන සංවාදය ජාතිවාදය අවුළුවන සංවාදයක් බවට පත්ව පංති අරගලය හා සමාජ වෙනසක් සඳහා වන සංවාදය යට කරන්නේ නම් ඊට ඉඩ නොදීමටත් ඒ අතරම ව්‍යවස්ථාවක් සකස්කරන්නේ නම් ඉන් ජනතාවට යමක් දිනා ගැනීමටත් කටයුතු කිරීම පොදු ජනතාවගේ පැත්තෙන් කළ යුතු වේ. අප කටයුතු කළ යුත්තේ එසේය. ව්‍යවස්ථාව බිල්ලෙක් ලෙස දැක මුළුමනින්ම ප්‍රතික්ෂේප කිරීම හෝ සමස්ත දේශපාලනය ඊට යට කොට එය වැළඳ ගැනීම අපගේ කාර්යය නොවන අතර අපේ කාර්ය වන්නේ සමාජ පරිවර්තනයක් සඳහා ජනතා බලවේග එකතු කිරීම හා සංවිධානය කිරීමය. අපට ව්‍යවස්ථාවක් වුව වැදගත් වන්නේ එම කාර්ය සඳහා අමතර යමක් දිනා ගැනීමේ හා ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදය හා අයිතීන් දිනාදීමේ අර්ථයෙන් පමණි.

## සමාජවාදය තුළදී...

07 පිටුවෙන්

අවශ්‍යතාවන් උපරිම ආකාරයෙන් තෘප්ත කිරීමේ පොදු සැලැස්මෙහි කොටස්කරුවන් බවට පත් කර ගනී.

සමාජවාදය යටතේ භූමිය, ඛනිජ සම්පත්, වනාන්තර හුවමාරු භාණ්ඩ නොවේ. හුවමාරු භාණ්ඩයක් යනු හුවමාරුව, විකිණීම අරමුණු කරගෙන නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩයකි. ප්‍රධාන නිෂ්පාදන මාධ්‍ය (කර්මාන්තශාලා, වතු, නිධි ආදිය) විකිණීමට හෝ මිලදී ගැනීමට නොහැකිය.

සමාජවාදී සමාජයකදී භූමිය, එහි ඇති ඛනිජ සම්පත්, ජලය සහ වනාන්තර යන සියල්ල රජයට අයත්ය. බැංකු, වරාය, ගුවන්, තොටුපල, සන්නිවේදනය, පොදු ගමනාගමනය ආදී ක්ෂේත්‍රද රජය සතුව පවතී. නොබෙදිය හැකිකම සමාජවාදී රාජ්‍ය දේපළෙහි එක් ප්‍රධාන ලක්ෂණයකි. කිසිවෙකුට රාජ්‍ය දේපළෙහි තමාගේ කොටස ඉල්ලා සිටිය නොහැකිය. රාජ්‍ය දේපළ සෑම දෙනාටම එකවිට අයිතිය. පුද්ගලයන්ට රාජ්‍ය දේපළ අත්පත් කර ගැනීම නොකළ හැකිය.

අප විසින් මෙතෙක් පැහැදිලි කරනු ලැබුවේ සමාජවාදී සමාජයකදී පවත්නා පොදු තත්වයයි. එහෙත් ප්‍රායෝගිකත්වය තුළදී භාවිතාවේදී මෙම තත්වයන් ඒ එක් එක් රටෙහි එකී මොහොතේ පවත්නා වෙනස්කම් අනුව වෙනස් වේ.

විශේෂයෙන්ම අප වැනි අඩු සංවර්ධනයක් සහිත රටක සමාජවාදය ගොඩනැගීමේදී එකී විශේෂතා සැලකිල්ලට ගැනීමට සිදුවේ. සංවර්ධිත ධනේශ්වර රටවල මෙන් නොව ශ්‍රී ලංකාව වැනි රටක මහා පරිමාණ දේපොළ (මහා පරිමාණ කර්මාන්ත හා ව්‍යවසායන්) ඉතාම සීමිතය. එබැවින් අප වැනි රටක සමාජවාදය ගොඩනැගීමේදී මූලිකවම අවධානය යොමු කිරීමට සිදුවනු ඇත්තේ, දේපොළ පවරා ගැනීමට නොව නිෂ්පාදනය ඉහළ දැමීමටය. එවිට සමාජවාදී රජයට සිදුවන්නේ, රටේ නිෂ්පාදනයේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් ඒ සඳහා කර්මාන්තකරුවන්ගේ, නිෂ්පාදකයින්ගේ හා අනෙකුත් ව්‍යවසායකයින්ගේ සහාය හා දායකත්වය ඒ වෙනුවෙන් ලබා ගැනීමටය. රටේ සමස්ත කර්මාන්තයේ, කෘෂි කර්මාන්තයේ, ව්‍යවසායන්ගේ හා අනෙකුත් නිෂ්පාදනය ඉහළ දමා ගැනීම සඳහා ඒ එක් එක් ක්ෂේත්‍රයේ දායකත්වය ලබා ගැනීමටය.

## රාජ්‍ය පෞද්ගලික...

09 පිටුවෙන්



විකිණීමේ යාන්ත්‍රණය දැනට පවතින ඉඩම්, කෘෂිකර්ම නීති වැනි පවතින නීතිරීතිවලින් ඇති බාධාවන්ද ඉවත් කර වෙන වෙනම සිදු කිරීමටය.

මේ සියලු කරුණුවලින් ආණ්ඩුවේ වුවමනාව, ගමන පැහැදිලිය. ගැටලුව වන්නේ ආණ්ඩුවේ විකිණීමේ අරමුණ සමඟ නොවේ. මෙම ජනතාව රවටටා ආණ්ඩුව සිදුකරන ජාතික අපරාධ සඳහා, ඉඩම්, වරාය මංකොල්ල සඳහා ජනවරමක් ලංකාවේ ජනතාව ලබාදී තිබේද යන්නය. රාජපක්ෂ පාලනය ප්‍රතික්ෂේප කළ යහපාලනයක් අපේක්ෂා කළ ජනතාව තමන්ගේ එක් ඡන්දයක්වත් විකිණීම වෙනුවෙන් භාවිතා කර නැත. ඒ නිසා PPP හෝ කවර නාමකරණයකින් පැමිණියත් ජනවරමක් නැති ඒ ජාතික සම්පත් විකිණීමේ කොල්ලකෑමට එරෙහිව පෙළගැසීමේ අයිතිය ජනතාවට ඇත්තේය. එම ජනතා සංවිධානය කර අරගලයට කැඳවීමේ මොහොතේ ප්‍රගතිශීලී සියලු සමාජ ව්‍යාපාරයන්ගේ අත්හළ නොහැකි වගකීමද වී ඇත.

## අනිවාර්යය හා...

11 පිටුවෙන්

යනු අනිවාර්යයක් නොව විශේෂ හේතු නිසා නිර්මාණය වන දෙයක්ය යන්නත් වටහා ගත යුතුය. එහෙත් ඕනෑම ක්‍රියාවකදී ඕනෑම මොහොතක අහම්බ ඇතිවිය හැකි බවත් අප අනිවාර්යයන්ට මෙන්ම අහම්බයන්ටද මුහුණ දීමට සූදානම් නම් අපේ කටයුතු නොවරදින බවත් තේරුම් ගැනීම අවශ්‍ය වේ. ලෝකයේ බොහෝ හොඳ මෙන්ම නරකද අහම්බයන් මත සිදුවී තිබේ. ඒ නිසා අනිවාර්යය මෙන්ම අහම්බයද වටහා ගැනීම අත්‍යාවශ්‍යය.

මෙලෙසම ප්‍රකෘතිය හඳුනා ගැනීම සඳහා තවත් එක් ආකාරයක් ගැන කථාකිරීමට මීළඟට අපි හමුවෙමු.

## රාජ්‍ය පෞද්ගලික දෙඅංශයටම...

13 පිටුවෙන්



පුළුවන්, යුද්ධයේ පීඩාව සහ මේ විවාදය තිබෙන්නේ නොවැම්බර් මාසයේ නිසා. මොකද, ඒ මාසය ඔබතුමන්ලාට සංවේදී මාසයක් වන නිසා. නමුත් ඒක වැරැදියි. එහෙම හිතුවොත් ඌව පළාතට සියයට 5යි වෙන් කරන්න පුළුවන්. නමුත් ඒ විධියට මේ රටට කටයුතු කරන්න බැහැ.

උතුරේ මහ ඇමති විග්නේශ්වරන් මහතාගේ මූලිකත්වයෙන් ජාතිවාදය ක්‍රියාත්මක වීමක් වෙනවා. නමුත්, අපි සතුටු වනවා ටී.එන්.ඒ. එකේ නායක මණ්ඩලය ඒක එලෙස අරගෙන නැති එක ගැන. මම එදත් කිව්වා, විග්නේශ්වරන් මහතාගේ එක කුස උපන් සහෝදරයා තමයි, මහින්ද රාජපක්ෂ මැතිතුමා කියලා. විග්නේශ්වරන් මහත්තයා නැත්නම් මහින්ද රාජපක්ෂ මහත්තයාට දේශපාලනයක් නැහැ. විග්නේස්වරන් මහ ඇමතිවරයා කරන ජාතිවාදී ප්‍රකාශ තමයි, අද රාජපක්ෂ මහත්තයාගේ ජාතිවාදී දේශපාලනයට එකම ඔක්සිජන් එක.

උතුරේ යම් ජාතිවාදී ක්‍රියාවලියක් විග්නේශ්වරන් මහ ඇමතිතුමා ක්‍රියාත්මක කරනවා කියන එකත් බොරු නොවෙයි. සිංහල මිනිසුන්ට දෙමළ තේරෙන්නේ නැති නිසා, ඕනෑ බොරුවක් ලොකු කරලා දාන්න පුළුවන්. ඒකම සිංහල පත්තරවලත් වනවා ඇති. අපි ඔක්කොම යුද්ධය නිසා ඇති වෙන්න පරිප්පු කාලා, බැට කාලා තිබෙනවා. එම නිසා මම ඉතා ඕනෑකමින් ඉල්ලා සිටින්න කැමැතියි, කරුණාකරලා ජාතික සමගිය වෙනුවෙන්, ජාතික සංහිඳියාව වෙනුවෙන් හැම දේශපාලන නායකයෙක්ම මැදිහත් වෙන්න කියලා.

## නව වසරේ...

03 පිටුවෙන්



කාලේ. ඒ නිසා රටේ සම්පත් හා රාජ්‍ය ආයතන විකිණීමට එරෙහි සටන අතට ගන්න ඔවුන්ට බැහැ. හම්බන්තොට හා මොනරාගල ඉඩම් අක්කර 15,000ක් චීනයට දීමට තීරණය ගත්තේ රාජපක්ෂ ආණ්ඩුව. ඒ නිසා ඒ සටනට කිට්ටු වෙන්න ඔවුන්ට බැහැ. හම්බන්තොට වරායට බඳවාගත් සේවකයින් වරායට බඳවා නොගෙන පුද්ගලික සමාකමකට බඳවාගෙන (පගාවත් අරගෙන) ඒ සේවකයෝ රවටා අතරමං කළේ රාජපක්ෂවරු. ඒ නිසා තමයි හම්බන්තොට වරාය සේවකයෝ නාමල් රාජපක්ෂට හූ කිව්වේ. ඒ නිසා රාජපක්ෂ කල්ලියට මේ සටන් අතට ගන්න බැහැ. ඊළඟට රටේ ඉන්න පෝස්ටර් හා මාධ්‍ය නිවේදනවලින් විතරක් දේශපාලනය කරන කුඩා කල්ලිවලටත් මේ සටන අතට ගන්න බැහැ. ඒකයි අපි කියන්නේ මේ සටන් සියල්ලටම නායකත්වය දෙන්නන පුළුවන් අපට විතරක් බව. ඒ සටන් පොදු ජයග්‍රාහී අරමුණකට පෙළ ගැස්වීම සඳහා වූ වැඩ පිළිවෙළක් තියෙන්නේ අපට විතරයි.

***නියමුවා:- වර්තමානයේ රට තුළ පැනනගින ජනතා සටන් එක අරමුණකට, එක වැඩපිළිවෙළකට පෙළ ගැස්වීමක් ගැන ඔබ සඳහන් කළා. මොකක්ද ඒ?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** ඔව්, රටේ එක් එක් ජනකණ්ඩායම් තුළ එක් එක් ආයතන තුළ වෙන වෙනම පැන නගින සටන් හුදකලාව පැවතුණොත් බොහෝ විට ඒවා කෙළවර වෙන්නේ පරාජයෙන්. ඒවට හොඳ දේශපාලන නායකත්වයක් නැති වුණොත් ඒවා වල්මත් වෙන්න පුළුවන්. පාවා දීමට ලක්වෙන්න පුළුවන්. ඒත් මේ එක් එක් තැන්වල පැන නගින සටන් ඒ ඒ ස්ථානවල ඒ ඒ තැන්වල සටන් කරන අතරම මේ සියලු ගැටලු ධනවාදී අර්බුදයේ පොදු මූලයන්ගෙන් පැවතන ඒවා නිසාත්, ධනපති හවුල් ආණ්ඩුවේ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග විසින් ඇතිකරන ලද ඒවා නිසාත් මේ සියලු හුදකලා සටන් පොදු සටනක් බවට පත්කරන්න ඕනෑ. සටන්වල ශක්තිය වැඩිවෙන්නේ එවිටයි. එය කළ හැක්කේ අපට පමණයි. ඒ විතරක් නෙවෙයි එම සටන් එම සටනේ ඉල්ලීම් දිනාගැනීමේ සීමාවේ නතර කරනවා වෙනුවට පවතින ධනවාදී ක්‍රමය පරාජය කොට නව සමාජවාදී සමාජයක් සඳහා ජනතාවාදී ආණ්ඩුවක් පිහිටුවා ගැනමේ ක්‍රියාවලිය දක්වා ගෙනයා යුතුයි. ජනතාවාදී ආණ්ඩුවක් සඳහා ගොඩනැගෙන ජනතා මධ්‍යස්ථානයක කොටස්කරුවන් කළ යුතුයි. සටන සැබැවින්ම ජයග්‍රහණයෙන් අවසන් කළ හැක්කේ එවිටයි. ඒ සඳහා නායකත්වය දීම තමයි අපේ අරමුණ. අපි එය ඉටුකරනවා.

***නියමුවා:- මේ අර්බුද මැද පවතින අවස්ථාවක් ගැන කලින් ඔබ සඳහන් කළා?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** ඔව්, පැහැදිලිවම ලංකාවේ දේශපාලනයේ බලවේගයන්ගේ ස්වභාවය හා දේශපාලන තත්වය වෙනස්වෙලා තිබෙනවා. වත්මන් ධනවාදයේ අර්බුදය ප්‍රකාශයට පත්වෙලා තියෙන්නේ පොදු ජනතාව තුළින් විතරක් නෙවෙයි. ධනපති ක්‍රමයේ අර්බුදයෙන් පීඩාවට පත්ව අර්බුදයට ගිහින් තියෙන්නේ අපේ පංතිය විතරක් නෙවෙයි. ලංකාවේ පාලක පංතියත් අර්බුදයට ගිහිල්ලා. මේ ධනපති ක්‍රමයේ අර්බුදය පාලක පංතිය තුළත් ප්‍රකාශයට පත්වෙලා. මේකට අපි කියනවා පහළින් ඇතිවන අර්බුදය හා ඉහළින් ඇතිවන අර්බුදය කියලා. දැන් අපේ පංතිය වගේම පාලක පංතියත් ඉන්නේ අර්බුදයක. අපේ පංතියට පැරණි ක්‍රමයට තවදුරටත් ජීවත් වෙන්න අමාරුයි වගේම පාලක පංතියටත් තව දුරටත් පැරණි ක්‍රමයට රට පාලනය කරන්න බැරිවෙලා. බලන්න පාලක පංතිය දුර්වල වෙලා. හවුල් ආණ්ඩුවේ පෙනුම 'සමගි' වුණාට ඇතුලෙ ගැටලු. එ.ජා.ප. හා ශ්‍රීල.නි.ප.ය එකට ආණ්ඩුවේ හිටියට නිතර ගැටෙනවා. ප්‍රතිවිරෝධතා වැඩියි. බලය හා වරප්‍රසාද වෙනුවෙන් එකට හිටියාට ඒ වෙනුවෙන්ම යළි එකිනෙකා සමඟ ගැටෙනවා. ඔවුන් දුර්වලයි. එ.ජා.ප.ය පක්ෂයක් ලෙස දුර්වලයි. ලොකු බලයක් නැහැ. දැන් සුපිරි ඇමති කෙනෙක් හදන්න යන්නේත් ඒ අඩුව පුරව ගන්න. ඒ වගේම ශ්‍රීල.නි.ප.ය දෙකඩ වෙලා. කැලි දෙකම දුර්වලයි. රාජපක්ෂ කල්ලිය දිනපතා පිරිහෙනවා. වත්මන් ආණ්ඩුව මිනිසුන්ට එපා වෙනකොට එහි විකල්පය බවට පත්වෙන්න දැන් තවත් ධනපති පක්ෂයක් නැහැ. ඒ අනුව වමට, අපට අවස්ථාවක් තියෙනවා. එක් මීට පෙර නොතිබු අවස්ථාවක්.

ඉහළින් හා පහළින් ඇතිවන අර්බුදය සමාජ පරිවර්තනයකට අවශ්‍ය දේශපාලන පසුබිම සකස් කරනවා. ඒක තමයි ජනතාව ඉදිරියේ තිබෙන අවස්ථාව. එම අවස්ථාව අපතේ යා නොදී එය හරියටම අත්පත් කරගෙන ජනතාවගේ ජයග්‍රහණයක් සඳහා යොදා ගැනීම තමයි අපේ අරමුණ. මේ වසරේ අප හා ජනතාව ඉදිරිපිට තිබෙන කාර්යය එයයි.

***නියමුවා:- හොඳයි, මේ මතුවී තිබෙන විශේෂ අවස්ථාව ජනතාවගේ ජයග්‍රහණයක් දක්වා ගෙනයාමට ජ.වි.පෙ. සතුව තිබෙන වැඩපිළිවෙල කුමක්ද? ඒ සඳහා ඔබ මේ නව වසරේ ජනතාවට දෙන පණිවුඩය කුමක්ද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** ධනපති ක්‍රමයත්, ධනපති දේශපාලනයත් අර්බුදයට පත් කරමින් මතුවී තිබෙන මේ විශේෂ දේශපාලන තත්වය නව සමාජයක් නිර්මාණය කිරීමේ ජනතාවාදී ආණ්ඩුවක් ගොඩනැගීම වෙනුවෙන් යොදා ගත යුතුයි. ඒ සඳහා වන පුළුල්තම ජනතා බලයක් ජනතා මධ්‍යස්ථානයක් ගොඩනැගීමේ කාර්යයට අපි දැන් උරදීලා ඉන්නවා. 2020 මහ මැතිවරණය එනවිට ලංකාවේ ධනපති පක්ෂ තවදුරටත් බංකොලොත් වී දුර්වලවී තිබේවි. ඒ තුළ විකල්ප බලවේගයක් ගොඩනැගීමේ ඉඩ විවර වී තිබෙනවා. දැනටමත් අපි එවැනි ජනතා මධ්‍යස්ථානයක් ගොඩනැගීම සඳහා එකතු කළ හැකි ජනතා බලවේග, වෘත්තීය සමිති, ගොවි සංවිධාන, වෙනත් විවිධ සමාජ සංවිධාන, උගතුන්, බුද්ධිමතුන්, වෘත්තිකයන්, පරිසරවේදීන්, කලාකරුවන්, මාධ්‍යවේදීන් සංවිධාන ලෙසත් පුද්ගලයින් ලෙසත් එකතු කිරීමේ කාර්යය ආරම්භ කර තියෙනවා. දැනට පැන නැගී ඇති සටන් රැල්ලත් එයටම එකතු කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ අතර ගම්වල බිම් මට්ටමින් දිරිය සමිති ගොඩනැගීම සිදුකරනවා. මේ සියලු බලවේග එකම තැනකට එක් කොට බලය ගතහැකි මධ්‍යස්ථානයක් ගොඩ නැගීම තමයි අපේ අරමුණ.

ඒ නිසා අපි ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ වසර 68ක අසාර්ථක තට්ටුමාරු දේශපාලනයට ආයුබෝවන් කියලා නව දේශපාලන ගමනක් වෙනුවෙන් නව වසරේ පෙළගැසෙන ලෙසයි.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com





සමුනොගත් ෆිදෙල් සමරමින්...



වී ගැන විමසීමට වී අලෙවි මණ්ඩලයට ගොස්...



ජනතාවගේ ඉඩම් පවරා ගැනීමට එරෙහිව...



කාන්තා ගැටලු පිළිබඳ දැනුවත් කරමින්...



පලස්තීනයට සහයෝගය පළ කරමින්...




උමා ඔය විනාශයට එරෙහිව...

## පරපෝෂිත කණ්ඩායමෙන් රට මුදා ගැනීම අපේ අභියෝගයයි

**ජ.වි.පෙ. නායක**
**අනුර දිසානායක සහෝදරයා**

ෆිදෙල් කස්ත්‍රෝ නම් ශ්‍රේෂ්ඨතම මිනිසෙක් පිළිබඳවත් ඔහුගේ දර්ශනය පිළිබඳවත් සමාජවාදය පිළිබඳවත් කියුබාව පිළිබඳවත් එහි සමාජ ජීවිතය පිළිබඳවත් බොහෝ දෙනාට දාර්ශනික කෘති, සාහිත්‍ය නිර්මාණ කළ හැකි නමුත් රට හමුවේ ඇති ඇත්ත අභියෝගය වනුයේ ලංකාව තුළ සමාජවාදය ගොඩ නැගීම සඳහා එවායින් දියුණුතම අත්දැකීම් උකහා ගැනීමට සමත් වීම යැයි ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා පැවසීය.

ඔහු මේ බව කියා සිටියේ, පසුගිය 04වැනි දින කොළඹ විහාර මහා දේවී එළිමහන් රංග පීඨයේ සංවිධානය කරන ලද 'ආදරණීය ෆිදෙල්.. සමුගැනීමක් නොවේ' ජනතා සැමරුමේ ප්‍රධාන දේශනය පවත්වමිනි. වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර සහෝදරයා මෙසේද පැවසීය

"අපිට පැවරී තිබෙනවා වගකීමක්. අපේ රට අන් කවරදාටත් වඩා බෙලහීන වූ රාජ්‍යයක්. සමාජීය වශයෙන් කඩාවැටුණු රාජ්‍යයක්. කිසිදු ජනකොටසකට තෘප්තිමත්ව ජීවත්වීමට බැරි රාජ්‍යයක්. තරුණයන් රට අතහැර යන රාජ්‍යයක්. තරුණ තරුණියන්ට අනාගතය පිළිබඳව අපේක්ෂාවක් නැති රාජ්‍යයක්. ළදරු මන්දපෝෂණය පැතිරුණු රාජ්‍යයක්. ගැබිණි මව්වරුන්ගේ රක්තහීනතාව පැතිරුණු රාජ්‍යයක්. සිංහල කෙනා කෙරෙහි මුස්ලිම් කෙනා සතුරුභාවයෙන් බලන, මුස්ලිම් කෙනා කෙරෙහි සතුරුභාවයෙන් සිංහල කෙනා බලන, සිංහල කෙනා කෙරෙහි දෙමළ කෙනා, දෙමළ කෙනා කෙරෙහි සිංහල කෙනා සතුරුභාවයෙන් බලන එකිනෙකා ඇණකොටාගන්න වෛරය, ක්‍රෝධය වපුරන රාජ්‍යයක්. බලය වෙනුවෙන් ඕනෑම මජර වැඩකට අතගහන රාජ්‍යයක්.

මේ අය කොහොමද ප්‍රජාතන්ත්‍රවාදී පාලකයෝ වෙන්නේ. මේ අය කොහොමද මානවවාදී පාලකයෝ වෙන්නේ. මේ අය කොහොමද රටේ ජනතාවට ආදරය කරන පාලකයෝ වෙන්නේ. මජරකමින් බඩජාරිකමින් පිරුණු ධනය සම්පත් පුරවා ගන්න අධිපරිභෝජනවාදයට පුරුදු වුණු කෝටි ප්‍රකෝටි ගණන් වාහන, සීත කරපු කාමර, විශාල් ගෙවල් අවශ්‍ය පරිපෝෂිත රැලක් අපේ රට අද පාලනය කරනවා. ජනතාව වැඩකරලා ධනය උපයනවා. ඒ ධනයෙන් යැපෙන පරපෝෂිත රැලක් ඉන්නවා. පරපෝෂිත කණ්ඩායමකට ජනතාවක් ගොඩනගන්න, රටක් ගොඩනගන්න පුළුවන්කමක් නැහැ.

අද අප



**02 වැනි පිටුවට**

## රනිල් මෛත්‍රී බොනපාට්වාදී පාලනයට එරෙහිව පෙරට එන්න

**ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම්**
**විජිත හේරත් සහෝදරයා**

ජනතාවගේ ප්‍රශ්න යට ගැසීමට කටයුතු කරන ආණ්ඩුව අයිතිවාසිකම් වෙනුවෙන් නැගී සිටින ජනතාව මර්දනය කරන්නේයැයි ප්‍රකාශ කළ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා කෙසේ වුවද ආණ්ඩුව තම පැවැත්ම වෙනුවෙන් ඇමතිවරුන්ට, මන්ත්‍රීවරුන්ට පමණක් නොව හිටපු ජනාධිපතිවරයාටද වරදාන, වරප්‍රසාද ලබාදෙමින් සිටින්නේයැයි චෝදනා කළේය.

පසුගිය 01වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඔහු මෙසේද කීය. "මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාට මේ ආණ්ඩුව මගින් නිවසයක් ලබාදුන්නා. එහි අලුත්වැඩියාව සඳහා කෝටි 3ක මුදලක් වෙන් කළා. එයිනුත් නොනැවතුණු ආණ්ඩුව පසුගියදා මහින්ද රාජපක්ෂගේ නිවාස පරිශ්‍රයේ නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් රුපියල් එක් කොටි අනූහත් ලක්ෂයක් වෙන්කළා. මේවා තමයි වරදාන, වරප්‍රසාද. මේ වරදාන, වරප්‍රසාද නිසා තමයි මහින්ද රාජපක්ෂ අයවැයට එරෙහිව විශ්වාසභංගයට එරෙහිව වැට් පනතට එරෙහිව ඡන්දය ලබාදෙන්න පාර්ලිමේන්තුවට එන්නේ නැත්තේ. මේවා තමයි ඇත්ත ඩීල්.



මෙම රනිල් මෛත්‍රී බොනපාට්වාදී පාලනය සිදුකරන ජනතා විරෝධී ක්‍රියාමාර්ගවලට එරෙහිව පෙරට එන ලෙස අපි ජනතාවට ආරාධනා කරනවා."

## එදා නීති කඩා අවසර දුන් සයිටම් එක දැන් නීති නමා පවත්වාගෙන යනවා

**ජ.වි.පෙ. ජාතික සංවිධායක**
**බිමල් රත්නායක සහෝදරයා**



රටේ නීති කඩා රාජපක්ෂ ආණ්ඩුව විසින් අවසර දුන් සයිටම් ආයතනය වර්තමාන හවුල් ආණ්ඩුව විසින් නීති නමා පවත්වාගෙන යන බව ප්‍රකාශ කළ ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික බිමල් රත්නායක සහෝදරයා එස් බී දිසානායක අමාත්‍යවරයා විසින් මුලින් නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ රෙගුලාසි උල්ලංඝනය කරමින් සයිටම් ආයතනයට නීතිමය බලතල ලබා දී ඇති නමුත් පනත උල්ලංඝනය කර සහ දේශපාලන බලය යොදා එම ආයතනයට බලතල නොදෙන ලෙස වත්මන් ආණ්ඩුවට අවධාරණය කර සිටියේය.

පසුගිය 20වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවේදී වැඩිදුරටත් අදහස් දැක්වූ බිමල් සහෝදරයා මෙසේද කීය.

"කිරිඇල්ල ඇමතිවරයා කියනවා මේක පසුගිය ආණ්ඩුව කරපු දෙයක් නිසා අපිට කරන්න දෙයක් නැහැ කියලා. අපි කියන්නේ පහුගිය ආණ්ඩුව කරලා තිබෙන්නේ නීති විරෝධී වැඩක් කියලයි. උසස් අධ්‍යාපන ඇමතිවරයාට බලතල තිබෙනවා නීතිවිරෝධීව බලය ලබාදුන් ගැසට් එක අවලංගු කරන්න. දැනටත් ඇතැම් පෞද්ගලික අධ්‍යාපන ආයතන ගැසට් කරනවා. අපිට සැකයක් තිබෙනවා ඒවායේ ප්‍රමිතිය ගැන. පනතේ කොන්දේසි අනුව ප්‍රමිතිය ගැන හොයලා අවසර දෙනවාද කියන එක ගැටලුවක්.

ඒ නිසා මෙම සයිටම් ආයතනය අහෝසි කළ යුතුමයි. ජනතා විමුක්ති පෙරමුණේ අපි විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සමග වෛද්‍යවරුන් සමග විද්වතුන් සමග මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා ආයතනයට එරෙහිව නීතිමය කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වගේම විශ්වවිද්‍යාල සිසුන් සමග අරගලය තවදුරටත් දියත් කරනවා. සල්ලිකාරයින්ගේ මුදල් අරගෙන නීතිවිරෝධී බිස්නස්වලට අවසර දෙන එක නතර කළ යුතුයි."

## ආණ්ඩුව බැඳුම්කර වංචනිකයින් රකින බවට සැක මතුවනවා

**ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික**
**සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා**



ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික, පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා

නව වසරේ පාර්ලිමේන්තුවේ ප්‍රමුඛ පළමු කටයුත්ත හැටියට බැඳුම්කර ගනුදෙනුව අදාළ කෝප් වාර්තාව විවාදයට ගත යුතු බවට ආණ්ඩුවට අවධාරණය කළ ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා, වාර්තාව ගැන තීරණ ගැනීමේ අයිතිය තිබෙන්නේ නීතිපතිවරයාට නොව පාර්ලිමේන්තුවට බවත් ආණ්ඩුව අදාළ පියවර නොගැනීමෙන් බැඳුම්කර වංචාවේ වරදකරුවන් ආරක්ෂා කිරීමට උත්සාහ කරන බවට සැක මතුවන බවත් පෙන්වා දුන්නේය.

සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 26වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවකදීය.



ජනවාරි 01 දාට යෙදෙන කියුබානු විප්ලවයේ 58 වන සංවත්සරයට අපේ විප්ලවීය සුභපැතුම්!

**ජනතා විමුක්ති පෙරමුණ**


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.



ද්විමාසික කලා සංස්කෘතික
සඟරාමය අතිරේකය
සමාජවාදී කලා සංගමයේ ප්‍රකාශනයකි.
නව සංස්කරණය 2017 ජනවාරි
06 වන කලාපය

# රළ

## කලාවේ අර්බුදයේ පතුල සොයා යාම

වත්මන් ලාංකේය සමාජයේ කලාවේ බිඳවැටීම සම්බන්ධයෙන් විවිධ පිරිස් හා පුද්ගලයන් මෙන්ම කලාකරුවෝ විවිධ අදහස් දක්වති. ඒවා අධ්‍යයනය කිරීමේ දී විවිධ තලවල සිට ඔවුහු මෙම කලාවේ හා සාහිත්‍යයේ මෙන්ම නාට්‍ය කලාවන් වැනි සෑම ක්ෂේත්‍රයකම අර්බුදය ගැන අදහස් පළ කරති.

එම පළ කරන අදහස් කැටි කොට ඒවායේ වර්ගීකරණය කළ විට කරුණු තුනක් මත හඳුනා ගත හැක. පළමුව කලා ප්‍රකාශනයේ පවතින අර්බුදයන්, දෙවැනිව කලාකරුවන්ගේ හා ශිල්පීන්ගේ නිවැරැදි සමාජ කියැවීමක් නොමැති වීමේ අර්බුදය සහ තුන්වැනිව පවතින රාජ්‍ය තන්ත්‍රය විසින් සිදු කරනු ලබන ක්‍රියාමාර්ගයන් වේ.

වර්තමානයේ කලා කෘතියක් බිහි වීමේ දී ගුණාත්මකභාවය ගැන සමාජයේ සෑම ස්ථරයකින්ම පාහේ විවේචන ඉදිරිපත් වේ. එම විවේචන සමහරක් සාධාරණ වන අතර, තවත් සමහරක් සාධාරණ නොවන විවේචන වේ. යම් කිසි කලා මාධ්‍යයක එහි ප්‍රකාශනය හා නිර්මාණයේ දුර්වලතාවය මෙන්ම එහි පවතින තාක්ෂණික ගැටලු හඳුනා ගත හැක. එහෙත්, එම නිර්මාණ බිහි කිරීමේ දී ප්‍රාග්ධනය හා ගැට ගැසී පවතින තත්වයන් මත එම කලා කෘතීන්වලට සාධාරණයක් ඉෂ්ට නොවන අවස්ථා දැකිය හැකිය. කලාකරුවන් හා ශිල්පීන් සිය නිර්මාණ බිහි කිරීමේ දී එම නිර්මාණ තුළින් ඔවුන්ගේ සමාජ කියැවීමේ දුප්පත්කම මත එම නිර්මාණවලට සිදු වන පාඩුව එම නිර්මාණ තුළින් බොහෝ විට දක්නට ලැබේ.

යාචකයෙක් ඕනෑම කෙනෙකුගෙන් මුදල් හෝ ද්‍රව්‍යයන් සිඟාකෑම සුලභව දැකිය හැකි කරුණකි. තරාතිරම නොබලා සිඟාකෑමේ යෙදෙන්නා මෙන් කලාවේ අර්බුදයක් ඇතැයි සැමවිටම ප්‍රකාශ කරන කලාකරුවෝ පවා තමා හට නිවැරැදි සමාජ කියැවීමක් නොමැති අඩුව නොදකිති. පවතින දේශපාලන තන්ත්‍රය සිය රාජ්‍යයේ පැවැත්ම සහ සිය අවශ්‍යතාවයන් මූලික කරගෙන කලාව මෙන්ම කලාකරුවන්ද හසුරුවමින් යයි. වත්මන් ලංකේය සමාජයේ රාජ්‍ය තන්ත්‍රයට සිය පැවැත්මේ අර්බුදයක් මෙන්ම පවතින ආණ්ඩුවට එම ආණ්ඩුවේ පැවැත්ම පිළිබඳවද බරපතළ අර්බුදයන් පැන නැඟී ඇත. එම තත්වය මඟහරවා ගැනීම සඳහා ආණ්ඩුව සහ රාජ්‍යය යන දෙපාර්ශ්වයම මෙහෙයවන දේශපාලන අධිකාරීත්වය කලාව තුළ යම් හැකියාවන් පෙන්වූ කලාකරුවන් සිය දේශපාලන අර්බුදයෙන් ගොඩ යාම වෙනුවෙන් අතකොළු බවට පත් කර ගැනීමේ තත්වයක්ද වර්තමානයේ ඇති වෙමින් පවතී.

වැඩවසම් සමාජයේ සිට කලාකරුවන්ට රජු විසින් යම් නින්දගම්, ඉඩකඩම් ලබා දීමේ සම්ප්‍රදායයට අනුව යමින්, වර්තමානයේ බොහෝ කලාකරුවන් මෙන්ම කලා ශිල්පීන් පවතින දේශපාලන අධිකාරියේ සහ රාජ්‍ය තන්ත්‍රය වෙත සිය දුක්ගැනැවිලි පවසමින්, (කලාවේ අර්බුදය විසඳීම සඳහා යැයි පවසමින්,) සිය පෞද්ගලික ආර්ථික අවශ්‍යතා ඉටු කර ගනිමින් සිටිති.

මෙම තත්වය පසුගිය ආණ්ඩු යුගයේ ඉතාමත් නිර්ලජ්ජිත ලෙස දක්නට ලැබුණු අතර, එම ප්‍රවාහයට හසු නොවූ කලාකරුවන් හා ශිල්පීන් සිටියේ ඉතාම ස්වල්පයකි. කලා නිර්මාණයක් බිහි කිරීමේ දී එම නිර්මාණය තුළ මිනිස් සමාජය දෙස විමර්ශනාත්මකව බලා එයට ගැඹුරු සමාජ කියැවීමක් එක් කොට එම නිර්මාණය බිහි කිරීමට කටයුතු කිරීමේ දී බොහෝ කලාකරුවන් තම සමාජ අත්දැකීම් මුසු කර ගැනීමේ දී වඩාත් අන්තගාමී ස්ථානයන් වෙත ඇද වැටී ඇති ආකාරයද මෙහිදී පෙන්වා දිය හැක. රාජ්‍ය නොවන සංවිධාන, විදේශ තානාපති කාර්යාල හා ආණ්ඩු මඟින් ලැබෙන යම් යම් වරප්‍රසාද හා මුදල්වලට ගිජු වී සිය නිර්මාණ එම මුදල්වලට පාවා දෙන කලාකරුවන්ද දක්නට ලැබේ. ඔවුන්ගෙන් සාධාරණ කලා නිර්මාණයන් බිහි නොවන අතර, එමඟින් කලා නිර්මාණයන්හි යම් අර්බුදයන් නිර්මාණය කොට තිබේ.

වත්මන් ලාංකේය සමාජයේ පවතින මූලික ආර්ථික අර්බුදයන් නිවැරැදිව කියවා ගැනීමකින් තොරව එම ආර්ථික අර්බුදයන් විසැඳීම සඳහා පවතින සමාජ-ආර්ථික ක්‍රමවේදය කිසිලෙසකින්වත් සාධාරණ නොවන බව වටහා ගැනීමකින් තොරව කලාවේ අර්බුදයද වටහා ගත නොහැක. සාධාරණ හා යුක්තිසහගත සමාජයක් ගොඩනැඟීමට සිය කලා කෘතීන් නිවැරැදි අවියක් ලෙස භාවිත කිරීමට කලාකරුවා තේරුම් ගන්නා තුරු කලාවෙන් නිවැරදි සමාජ මෙහෙවරක් සිදු කිරීමට නොහැක. කලාවේ අර්බුදයේ ත්‍රිවිධ උල්පත නිර්මාණය වන්නේ කලා කෘතීන්, කලාකරුවා හා ශිල්පීන් සහ පවතින පාලන තන්ත්‍රය යන කරුණු ත්‍රිත්වයෙනි. එම කරුණු තුනම පවතින්නේ පවතින සමාජ ක්‍රමය තුළය. එම නිසා සමාජ ක්‍රමය වෙනස් කිරීමකින් තොරව කලාවේ අර්බුදයේ වෙනසක් සෙවීම අපහසු වී තිබේ. මේ අනුව කලාවේ අර්බුදයේ ආරම්භය නිවැරැදිව තේරුම් ගත හැක.



## අලුත් මිනිසෙක් අවශ්‍යව තිබේ!

ශ්‍රී ලාංකේය සමාජය මේ වන විට ස්ථානගතව ඇත්තේ කොතැනක ද? ඒ පිළිබඳව තීරණය කිරීමට ගැඹුරු විශ්ලේෂණයක් අවශ්‍ය නොවේ. දිනපතා පුවත්පත් මගින් සහ විද්‍යුත් මාධ්‍ය මගින් අසන්නට, දකින්නට ලැබෙන දෙයින් අප සමාජයට අත්ව ඇති ශෝචනීය ඉරණම තේරුම් ගත හැකිය. රටේ ආර්ථිකය අගාධයේ පත්ලටම ගිලී ඇති අතර, රටේ ආර්ථික මර්මස්ථාන, ඉඩකඩම් ණයට සින්නවෙමින් තිබේ. ගෞරවයට පාත්‍රව තිබූ සියලුම සංස්කෘතික හර පද්ධතීන් විනාශ වී ඇති අතර, ධනවාදී සමාජ ක්‍රමය විසින් සමාජය ම්ලේච්ඡත්වය කරා ඇදගෙන යමින් තිබේ.

මෙය අද අප අත්විඳින සත්‍යයයි. එහෙත් පාලකයෝ එම සත්‍ය වසන් කර, සිදුව ඇති ව්‍යසනය තමන් විසින් ජනතාවට ලබා දුන් ජයග්‍රහණයන් ලෙස හුවා දක්වති. ණය ගැනීම වීරකමක් සේ සලකන පාලකයෝ, ණය ගන්නා අවස්ථාව රූපවාහිනිය මගින් විකාශය කරවති. හම්බන්තොට වරායත්, එයට සමගාමීව අතිවිශාල ඉඩම් ප්‍රමාණයකුත්, චීනයට පවරාදීම පාලකයන්ට අනුව ඔවුන්ගේ සුවිශේෂි හැකියාවකි. ප්‍රාග්ධනය විසින් මෙහෙයවන මාධ්‍ය විසින්ද පාලකයන්ට අවශ්‍ය පරිදි සත්‍ය විකෘති කිරීමට මෙන්ම, ජනතාවගේ සිතීමේ හැකියාව මොට කිරීමටත් අවශ්‍ය සියලුම දේ කරති. මේ සියලු බාධක තිබියදීම, සිදුව ඇති විනාශය අන්කවරදාකටත් වඩා මේ වන විට ජනතාවට දැනෙමින් තිබේ. ඔව්හු වේගයෙන් සත්‍ය අවබෝධ කර ගනිමින් සිටිති. සමාජය අද ඉල්ලා සිටින්නේ අලුත් මිනිසෙකි. විද්‍යාව සමග ප්‍රතිවිරෝධයක් වෙනුවට, තාක්ෂණය සමග අත්වැල් බැඳගන්නා මිනිසෙකි. ජාතිවාදී, ආගම්වාදී පටු ආකල්ප වෙනුවට, මානව දයාවෙන් පිරිපුන් මිනිසෙකි. අවස්ථාවාදී ස්වර්ථකාමය වෙනුවට, පොදු යහපත වෙනුවෙන් කැපවෙන මිනිසෙකි. එම මිනිසා බිහි කරගැනීම අප හමුවේ

>>ඉතිරිය 03

# සංගීතය භාෂාවකට වඩා ප්‍රබලයි

## ප්‍රවීණ සංගීතවේදී හර්ෂ මාකලන්ද

මෙවර රළ කලා සංස්කෘතික ප්‍රකාශනය අපේ රටේ සිටින ජ්‍යෙෂ්ඨතම සංගීතවේදියෙක් වන හර්ෂ මාකලන්ද මහතා සමඟ කලාව, දේශපාලනය හා සංගීතය විවිධ පැතිකඩයන් පිළිබඳ සංවාදයකට ඉඩ හසර වෙන් කළා.

**රළ:- ඔබ අපේ රටේ සිටින වේදිකාව, ටෙලිනාට්‍ය හා සිනමාවේ සංගීත අධ්‍යක්ෂවරයෙක් විදිහට විශේෂ අනන්‍යතාවයක් ගොඩනඟාගත් සංගීතවේදියෙක් විදිහට හඳුනා ගන්නවා. ඒ වගේම විශ්ව සංගීතයේ ලාංකීය අනන්‍යතාවය පිළිබඳවත් ඔබ සංගීතමය නිර්මාණ දෙස් විදෙස් වේදිකාවට ගෙන ගොස් තිබෙනවා. සංගීතයේ ඔබේ සලකුණු කවරාකාරද?**

හර්ෂ මාකලන්ද:- සංගීතය කියන්නේ විශ්ව භාෂාවක් කියලා මම සියයට සියයක් විශ්වාශ කරන්නේ නැහැ. ඒක විස්තර කළොත් අපි දන්නවා චීන සංගීතය; චීන සංගීතයේ විවිධ පැතිකඩයන් තිබෙනවා. ඒ සංගීතයේ ප්‍රකාශනයක් ලාංකිකයාට තේරෙන්නේ නැහැ. ඒක තේරුම් ගන්න නම් විශේෂයෙන් හදාරන්න වෙනවා. ලාංකිකයාට සතුට දනවන සංගීත ඛණ්ඩ තියෙනවා වගේම චීනයේ ජනයාට ආවේණික වූ සංගීත ඛණ්ඩ තියෙනවා. සමහරවිට චීන සංගීත ඛණ්ඩයක් අපේ උත්සවයක ඉදිරිපත් කළොත් ඒක අපට නොතේරෙන්න පුළුවන්. මං එහෙම කියන්නේ සංගීතය කියන්නේත් සමාජ දේශපාලනික කලා ප්‍රකාශන මාධ්‍යයක් නිසා. මෙතනදී මං විශේෂයෙන්ම චීන සංගීතය උදාහරණයකට ගන්නේ සාමාන්‍යයෙන් අපට බොහෝ සංගීත සම්ප්‍රදායන් යම් ප්‍රමාණයකට තේරෙනවා. ඒත් චීන සංගීතයේ ප්‍රකාශන තේරුම් ගන්න අපහසුයි. ජපාන සංගීතයත් ඒ වගෙයි. ඉන්දුනීසියානු 'ගමිලාන්' සංගීතය අපට දැනෙන්නේ නෑ. හැබැයි ඒ එක්කම කියන්න ඕනෑ රිද්මය පැත්තෙන් හිතුවොත් රිද්මය කියන දෙය හැම සංගීතයකම තියෙනවා. ඒ අදහසින් ගත්තම තමයි සංගීතය විශ්වීය වන්නේ. ලෝකයේ විවිධ රිද්මයන්, ඒ කියන්නේ සංගීතයේ 'රිදම්' කියන දෙය ඕනෑම තැනක ඕනෑම කෙනෙකුට විඳින්න පුළුවන්. ඇත්තටම සංගීතය කියන විෂය භාෂාවකට වඩා ප්‍රබලයි. ඇතැම් සංගීත ඛණ්ඩ නොතේරුනත් කිසියම් රටක අනන්‍යය භාෂාවකට වඩා අපට සංගීතය ප්‍රබලව දැනෙනවා. සන්නිවේදනය වෙනවා. භාෂාවකට වඩා සංගීතය විශ්වීයයි. ඇත්තටම භාෂාවක් ඇතුලේ ආත්මයක් තියෙනවා. සංගීතඥයා කරන්නේ ඒක හොයාගෙන ඒකට පණ දෙනවා. මම නම් සංගීතය කියලා කියන්නේ ඒකට, සංගීත ප්‍රකාශනයක් ඉදිරිපත් කරනවා කියලා කියන්නේ ඒකට. අපේ රටේ නම් අපේ භාෂාව අරගෙන, අපේ ජන රිද්මයන් අරගෙන අපේ ජන සංගීත තාල ඛණ්ඩයක් අරගෙන, අපේ වන්නම්, ජන ගීවල ධ්වනි, චන්දස් අරගෙන ඒවාගෙන් සංගීත ඛණ්ඩ නිර්මාණය කිරීම තමයි විශ්ව සංගීතයේ ලාංකීය සලකුණ වෙන්නේ. හැබැයි ඒවා අපට 'සිම්පනි' විදිහට හඳුන්වන්න බෑ. 'සිම්පනි' කියන සංගීත ප්‍රකාශනය ඔත්සාද්, බිතෝවන්, හයිඩන් වගේ අය නිර්මාණය කලා. හයිඩන් තමයි ඇත්තට 'සිම්පනි' වල පියා හැටියට හඳුන්වන්නේ. සිම්පනියක් කියලා කියන්නේ සංගීතයේ එක ආකෘතියක්.

'ඔකෙස්ට්‍රා' නමින් හඳුන්වන්නේ වාද්‍ය වෘන්දය කියන අදහසයි. සිම්පනි ඔකෙස්ට්‍රා කියලා කිව්වාම වාදකයෝ සමූහයකගේ වැඩක්. වාදකයන් සමූහයක් එකතු වෙලා කිසියම් නියමිත ආකෘතියකට නාදවල සංකලනයක් නිර්මාණය කර සංගීත ඛණ්ඩයක් වාදනය කිරීම අපි සිම්පනි ඔකෙස්ට්‍රාවක් හැටියට හඳුන්වනවා. සිම්පනි ඔකෙස්ට්‍රාවක සාමාන්‍යයෙන් ඛණ්ඩ හතරක් නියෝජනය කරනවා. වුඩ්වින් (Udvin) ඒ කියන්නේ ප්ලුට්, ඔබෝ, බයෝස් වැනි ලීවලින් සාදන ලද භාණ්ඩ නියෝජනයයි. 'ස්ට්‍රීන් සෙක්ෂන්' ඒ කියන්නේ වයලීන් වියෝලා, චෙලෝ නියෝජනය, කරන බ්‍රාජස් සෙක්ෂන් ඒ කියන්නේ පිත්තල වාද්‍ය භාණ්ඩ නියෝජනය, ට්‍රෝම්පට්, පොන්ච්වෙන්ග්, ට්‍රොදම්බෝන් භාණ්ඩ නියෝජනය. හතරවැනි ඛණ්ඩය තමයි. 'පර්කසන්' භාණ්ඩ නියෝජනය ඒ කියන්නේ තාල වාද්‍ය භාණ්ඩ නියෝජනයයි. පියානෝව සහ හාප් භාණ්ඩත් මේ කොටසට අයත් වෙනවා.

**ප්‍රධාන පක්ෂ දෙකම මේ වන විට බලාපොරොත්තු බිඳදමා අවසන්. ඒ නිසා පොදුවේ කලා කරුවන්ටත් කලා නිර්මාණවලටත් සමාජයේ මතවාද ගොඩනැගීමේ විශාල කාර්යයක් පැවරී තිබෙනවා. මං විශ්වාස කරන්නේ මේ රට වෙනස් සමාජ පරිවර්තනයකට ගෙන යා යුතුයි කියලා. ඒ සඳහා සියලු බලවේග එකතු විය යුතුයි කියලා මං විශ්වාස කරනවා.**

**රළ:- ඔබ පෙරදිග සංගීතය මෙන්ම බටහිර සංගීතය මනාව අධ්‍යනය කර ශ්‍රී ලාංකේය සංගීත අනන්‍යතාවයක් වෙනුවෙන් ඔබේ හැකියාවන් භාවිතා කරනවා. ඔබ පැමිණි ගමන් මඟ කෙබඳුද?**

හර්ෂ මාකලන්ද:- සංගීතය කියන්නේ ප්‍රකාශන මාධ්‍යයක්. මට කතා කරන්න ඕනෑ මේ රට ගැන, රටේ දේශපාලනය ගැන, මේ රටේ යන්න ඕනෑ කොයි පැත්තටද කියන එක ගැන. ඉතින් මං මගේ සංගීත භාෂාව ඇතුලේ ඒ හැම දෙයක්ම කියන්න උත්සාහ කරනවා. මං ඉස්සෙල්ලාම සංගීතය ඉගෙන ගත්තේ 'ඈන් මාකලන්ද' කියන මාගේ නැන්දනියගෙන්. පියානෝව තමයි මගේ ආත්ම භාෂාව. මගේ සියලු අධ්‍යයනයන්ගේ ප්‍රතිඵලයක් හැටියට 1992 දී මගේ සංගීත ප්‍රකාශනයක් ඉදිරිපත් කරනවා. ඒක තමයි 'ස්වරසංග වන්නම' ඒ සංගීත ප්‍රකාශනය මං 2007 වර්ෂයේදී ජපානයේදී ලෝකයට ඉදිරිපත් කරනවා. හැබැයි ඒකේ ආකෘතිය සිම්පනි ආකෘතිය නෙවෙයි. සිම්පනිවලට තියෙන්නේ 'සොනාටා' කියන ආකෘතිය 'ස්වරසංග' කියලා අදහස් කලේ ස්වර අතර ගැටීම කියන අදහසින්. 'හාමනී' කියන ආකෘතිය තමයි අපේ රටේ තියෙන්නේ. සිම්පනි කියන ආකෘතිය නෙවෙයි. සිම්පනි ආකෘතියේදී එකකින් පටන්ගෙන තවත් තැනකට ගිහිල්ලා ආයෙත් මුලට එනවා. මේ ක්‍රමය තමයි 'Pop' ආකෘතිය. 'ස්වර සංග



වන්නම' මම හැදුවේ සරල රේඛීය ආකෘතියකට. මේක හදන්න මං දළදා මාළිගාවේ සංගීතය හැදෑරුවා. දළදා පෙරහැර අධ්‍යනය කලා. සරල රේඛීය ආකෘතිය කියන්නේ එක දෙයකින් පටන් ගන්නවා. ඊට පස්සේ තවත් දෙයකට යනවා. එහෙම තව තව දේවලින් ඉස්සරහට යනවා. ආපහු මුලට එන්නේ නෑ. දළදා මාළිගාවේ පෙරහැර සරල රේඛීය ආකෘතියකට ගලාගෙන යන්නේ. හැබැයි ඒක යටින් පිළිවෙලක් තියෙනවා. ගලා යෑමක් තියෙනවා. 'ස්වර සංග වන්නම' පටන් ගන්නේ අවුරුදු උත්සවයක සංගීතයකින්. හේනක පැල් රකින ගොවියෙකු අකුණු ගහන වැස්සකට මුහුණ දෙන්නේ කොහොමද, ඊට පස්සේ වැස්ස නවතින්නේ කොහොමද? ගොයම් කපන්නේ කොහොමද පන්සලක හැඟීම, සිරීපාදේ නැගීමේ හැඟීම මේ වගේ අපේ රටේ රිද්මයන්ගේ ආත්මය තමයි මං ප්‍රකාශ කලේ. අන්තිමට අපේ රටේ ඉතිහාසයේ සිට එන රණකාමී සංගීතයකින් වෙනස් තාලයකට ගෙනැල්ලා අවසන් වෙනවා. මේක 'සිම්පනි' එකක් නොවුණට 'සිම්පනි ඔකෙස්ට්‍රා' එකක් තමයි වාදනය කලේ. 'ස්වර සංග වන්නම' ඇතුලේ මං බටහිර ආකෘතියකට ගැති නොවී ලාංකේය අනන්‍යතාවයකට යන්න උත්සාහ කලා. මේක අහපු ලෝකයේ බොහෝ අය කිවුවා මේකට තියෙන්නේ බටහිර සංගීත අනන්‍යතාවයක් නොවෙයි. ඒක ලාංකිකයි කියලා. ඇත්තටම මට ඕන වුනේ ඒක.

**රළ:- ඔබ ඇන් මාකලන්ද කියන ඔබේ නැන්දනියගෙන් මුලින්ම සංගීතය ඉගෙන ගත්තා. ඊට පස්සේ සංගීත විෂය ප්‍රගුණ කළේ කොහොමද?**

හර්ෂ මාකලන්ද:- මම ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු විද්‍යාව හදාරන්න හිටිය කෙනෙක්. එංගලන්තයේ පාසලකටත් ඇතුල් වුණා. ඒ සඳහා එංගලන්තයේ සංගීත කණ්ඩායම් එක්ක වැඩ කළා. ඒ සඳහා සල්ලි හොයන්න. පස්සේ මට තේරුම් ගියා. ඇත්තටම මට කරන්න පුළුවන් මොකක්ද කියලා. ඇකඩමියේ එක වාරයකට ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු විද්‍යව හදාරන්න සල්ලි ගෙවලත් ඒක අතහැර කණ්ඩායම් සංගීතයකට එක් වුණා. 1978 කාලේ ඉදලා ලෝටස්, සෝලාඩිස්ක් කියන සංගීත කණ්ඩායම් දෙකක් එක්ක බටහිර බොහෝ රටවලත් අප්‍රිකානු රටවලත්, මැදපෙරදිග රටවලත් වැඩ කලා. මට අවුරුදු 29දී තිස්ස අබේසේකරයන් හමු වෙනවා. ඔහුගේ යෝජනාවක් අනුව සරසවි සම්මාන උළෙලකට සංගීත නිර්මාණයක් ඉදිරිපත් කරනවා. ඊට පස්සේ වාර්තා චිත්‍රපට තිස්ස අබේසේකරගේ ඉරහඳ ගල, හඳගමගේ අක්ෂරය වැනි කලා කෘති විශාල ප්‍රමාණයකට සංගීත නිර්මාණය කලා. 88, 89 කාලවලදී මම හිටියේ ජර්මනියේ. ඇත්තටම ලංකාවේ වෙන දේවල් අහගෙන මට ජර්මනියේ ඉන්න බැරි වුනා. ඒ නිසා මං 89 නොවැම්බර් මුල බොහෝ අය රට දාලා යද්දි මං ලංකාවට ආවා. මං වේදිකා නාට්‍යවල සංගීතය අධ්‍යක්ෂණය කරන්න පටන් ගත්තා. 'උක්දඩු ගින්න' නාට්‍ය සංගීත අධ්‍යක්ෂණය කරලා හොඳම සංගීතයට සම්මාන ගත්තා. ධර්මසිරි බණ්ඩාරනායකගේ යක්ෂාගමනයට, රවී බන්දු විද්‍යාපතිගේ මුද්‍රා නාට්‍යවලට සංගීත අධ්‍යක්ෂණය කළා.

**රළ:- ලෝකයේ බිහි වු විවිධ සංගීත සම්ප්‍රදායන් තිබෙනවා. මේ සංගීත සම්ප්‍රදායන් පිළිබඳව ඔබගේ අදහස කුමක්ද?**

හර්ෂ මාකලන්ද:- බටහිර සංගීත සම්ප්‍රදායන්, පෙරදිග සම්ප්‍රදායන් ලෙස උත්තර භාරතීය සංගීතය, දක්ෂිණ භාරතීය සංගීතය, මැද පෙරදිගින් බිහි වු අරාබි සංගීතයත් අපි ප්‍රධාන සංගීත සම්ප්‍රදායන් ලෙස හඳුන්වනවා. මේවා ශාස්ත්‍රීය සංගිත භාවිතාවන්. චීන, ජපන්, ඉන්දුනීසියන් සංගීත භාවිතාවන්ද දක්නට ලැබෙනවා. මැදපෙරදිග මුලාශ්‍රකරගෙන තමා බොහෝ සංගීත භාණ්ඩ බිහි වී තිබෙන්නේ. පියානෝව පවා 'කනොන්' කියන සංගීත භාණ්ඩයෙන් උපදිනවා. 'ෂනායි' කියන සංගීත භාණ්ඩය පවා බිහිවෙන්නේ අරාබියේ. බටහිර සංගීත ආකෘති බිහිවෙන්න පටන් ගන්නේ එක්දාස් පන්සිය ගණන්වලින් පස්සේ. ගෙගුරින්චාන්වලින් පටන් අරන් 'කොන්ට්‍රකමන්ටල් මියුසික්, බරොක් මියුසික්, කලැසිකල් මියුසික්, රොමැන්ටික් මියුසික්වලින් පස්සේ මොර්ඩන් මියුසික් කියන සම්ප්‍රදායට එනවා. 1900න් වගේ පස්සේ තමයි හින්දුස්ථානි සංගීතය බිහිවෙන්නේ. එක්දහස් පන්සිය ගණන්වල තමයි ඉන්දියාවේ අක්බාර් කෝට් එක පදනම් කරගෙන 'තාන්ස්'ලාගේ සංගීතය බිහිවෙන්නේ. බටහිර ගෙගොරින් චාන්ස්ලා බිහිවන විට පෙරදිග තාන්ස්ලා බිහි වෙනවා. අනෙක් රටවලත් මීට සමගාමීව වෙනත් කුඩා කුඩා සංගීත සම්ප්‍රධායන් බිහි වෙනවා. ජෑස්, රොක් ,පොප්, හිපොප් වැනි සංගීත සම්ප්‍රධායන් බිහිවෙන්නේ 1940න් පසුවයි. 'බීට්ල්' වැනි සංගීත කණ්ඩායම් 1960 ගණන්වල බිහි වෙනවා. ඇමරිකාවේ පොප් සංගීතය ලෝකයේ විශාල වශයෙන් ව්‍යාප්ත වෙනවා. රෙගේ සංගීතය ආවේ ඊට පසු කාලීනවයි. පොප් සංගීතයේ විවිධ ස්වරූපයන් පසු කාලීනව ව්‍යාප්ත වෙනවා. ඊට සමගාමීව අනෙක් රටවලත් පොප් සංගීත සම්ප්‍රදායන් ඒ ඒ රටවලට ආවේණික විදිහට බිහිවුණා. අපේ රට වල පවා මේ දේ සිද්ධ වුණා. අපේ සංගීත ආකෘති බටහිර සංගීත සම්ප්‍රදායේ ආකෘති බවට පත් වුනා. හැබැයි අප්‍රිකාණු සංගීතය ඉන්දියානු සංගීතය වැනි සංගීත සම්ප්‍රදායන් ඔවුන්ගේ අනන්‍යතාවයන් සහිත සංගීත ධාරාවන් බවට පත් කර ගත්තා. ජෑස්, බ්ලුස් සංගීතයේ ආභාෂය තමයි රොක්ස් සංගීතය සහ රෙගේ සංගීතය වැනි සම්ප්‍රදායන්ට බලපෑවේ.

**රළ:- අප ඔබ සමඟ ලෝකයේ සංගීත සම්ප්‍රදායන් පිළිබඳව බොහෝ දේ කතා කලා. ඔබ ලාංකේය සංගීතයේ කිසියම් සංගීත අනන්‍යවතාවයක් ගොඩනැගීම වෙනුවෙන් ප්‍රායෝගිකව මැදිහත්වන සංගීතඥයෙක් වගේම සමාජ දේශපාලනික පසුබිමක් ඇති කලාකරුවෙක් ලෙස ලාංකීය ජනතාව වෙත අවසාන වශයෙන් කීමට ඇත්තේ කුමක්ද?**

හර්ෂ මාකලන්ද:- අපි මේ රටේ ප්‍රගතිශීලී වාමාංශික බලවේගය පිළිබඳව දැඩි බලාපොරොත්තුවක පසුවනවා. ප්‍රධාන පක්ෂ දෙකම මේ වන විට බලාපොරොත්තු බිඳදමා අවසන්. ඒ නිසා පොදුවේ කලා කරුවන්ටත් කලා නිර්මාණවලටත් සමාජයේ මතවාද ගොඩනැගීමේ විශාල කාර්යයක් පැවරී තිබෙනවා. මං විශ්වාස කරන්නේ මේ රට වෙනස් සමාජ පරිවර්තනයකට ගෙන යා යුතුයි කියලා. ඒ සඳහා සියලූ බලවේග එකතු විය යුතුයි කියලා මං විශ්වාස කරනවා. මේ රටේ ජනතාව ඒ සඳහා දැනුම සහ අවබෝධය ලබා ගත යුතුයි කියලා, දැනුවත්ව මැදිහත්විය යුතුයි කියලා මං විශ්වාස කරනවා.

## ශින්ඩ්ලර්ගේ ලැයිස්තුව... >>04 පිටුවෙන්

ඇත. එකල අවුට්විශ් ඝාතන කඳවුරේ අභය ස්ථානයක් වශයෙන් ශින්ඩ්ලර්ගේ ලැයිස්තුව නාමකරණය වී තිබුණි.

මෙම කෘතිය මඟින් හෙළිදරව් කරන තවත් සත්‍යයක් වන්නේ නාසි ඒකාධිපතීත්වය සුවිශාල බලයක් අත්පත් කරගෙන ඊට හසුවන සියල්ල තලා-පෙළා, පාගා පොඩි කරමින් ගලා නොගිය බවයි. එය මහා ප්‍රවාහයක් බවට පත්වීමට පීඩකයා මෙන්ම, වින්දිතයන් ද එකසේ  වග කිව යුතු බව මෙම කෘතිය මඟින් සනාථ කරයි. ලියන් ලෙයිසන් පවසන පරිදි හඹා එන ව්‍යසනය කාලය විසින් විසඳනු ඇති බවට අසීමිත විශ්වාසයක් යුදෙව්වන් තුළ විය. ලියෝන් ලෙයිසන් පවසන පරිදි ඔවුන්ගේ පියා ඔවුන් සමග නිතරම පැවසූ වදනක් විය. මනස යොමු කළ සිරකරුවන් එක්කෝ පාවා දෙන්න්නෝ වූහ. නො එසේ නම් නාසීන් සමග එක්ව ස්වකීය සහෝදර-සහෝදරියන්ම පීඩාවට පත් කරන්නෝ වූහ.

ශින්ඩ්ලර් වීරයෙකු වන්නේ මෙවැනි පසුබිමක දීය. දෙවන ලෝක යුද්ධයේ දී ජර්මනිය නිසැකවම යුදෙව්වන්ගේ ශ්‍රමය නිර්දය ලෙස සූරා කමින් සිය ආර්ථිකය ශක්තිමත් කර ගත්හ. ලාභ ඉපයීම වෙනුවෙන් ශ්‍රම සූරාකෑම ධනවාදයේ අනිවාර්ය අංගයක් බව මාක්ස්වාදයේ පැහැදිලි කිරීමයි. වෙනස, එය කොතරම් විවෘතව කරනවාද යන්න හා ආවෘතව කරනවාද යන්නයි. එබැවින්, මෙම ප්‍රකාශයෙන් ශ්‍රම සූරාකෑම සාධාරණීකරණය වන්නේ නැත. එහෙත්, නාසීන් විසින් යුදෙව් ශ්‍රමය නම් අනෙක් පක්ෂයට පක්ෂග්‍රාහීය. එනයින් බලන කල ලියෝන්ගේ The Boy on the Wooden Box: How the Impossible Became Possible කෘතිය අපක්ෂපාතී නිර්මාණයක් නොවේ. එහෙත් එය වැදගත් වන්නේ ලියෝන් මෙම කෘතියෙන් විස්තර කරන්නේ සිය සතුරාගේ පාර්ශවය නියෝජනය කළ මිනිසෙකු වන බැවිනි.

එහෙත්, මෙම කෘතිය ඇතුළු දෙවන ලෝක යුද්ධ සාහිත්‍යයේ බොහෝ කෘති පිළිබඳව අප විසින් එකග නොවන කරුණක්ද සඳහන් කළ යුතුය. එනම්, බටහිර සාහිත්‍යයේ බොහෝ කෘති මඟින් මිනිසාගේ සාමූහිකත්වය අවතක්ස්රුවකට ලක් කරමින් පුද්ගල චරිත ඉස්මතු කර දැක්වීමයි. 1967 වර්ෂයේ බොස්ටන් මැරතන්



එනම්, මෙම යුද්ධයද මහා ලෝක යුද්ධය (යුද්ධය ආරම්භ වූ සමයේ එය දෙවන ලෝක යුද්ධය ලෙස හැඳින්වූයේ නැත. එමෙන්ම පළමු ලෝක යුද්ධය එනමින් හැඳින්වූයේ ද නැත) මෙන්ම ඉක්මනින්ම නිමාවට පත් වෙනු ඇති බවයි. පෝලන්ත ජාතිකයින් විශ්වාස කළ තවත් කරුණක් විය. එනම්, ජර්මන් සෙබළු යනු ශිෂ්ටාචාරවත් යුගයේ මිනිසුන්ගෙන් සැදුම්ලත් හමුදාවක් බවත්, ඔවුන් කිසි දිනක ස්ත්‍රීන්ට හා කුඩා ළමුන්ට හිරිහැර නොකරනු ඇති බවත්ය. එබැවින්, ආරක්ෂාකාරී උපක්‍රම අනුගමනය කරනු වෙනුවට වඩ වඩාත් සතුරා විශ්වාස කිරීමට පෙළෙඹෙමින් හා එමඟින් සතුරාට වඩ වඩාත් අවස්ථාවන් නිර්මාණය කර දෙමින් යුදෙව්වන් ගත කළ පීඩාව විඳීමේ ක්‍රියා පිළිවෙත විසින් නාසීන් වඩාත් බලවත් කළ අතර, ලෙයිසන්ම පවසන පරිදි ''සංවිධානාත්මක විරෝධය දැක්වීම'' තුළින් මේ අසහනකාරීත්වය යම්තාක් දුරකට කළමනාකරණය කර ගැනීමේ හැකියාව යුදෙව්වන් සතු විය. එහෙත්, වඩ වඩාත් ආත්මාර්ථකාමී වෙමින්, සිය ජීවිතය ගලවා ගැනීම පිළිබඳව පමණක් සූරා කන ලද්දේ එහි සාහසිකත්වය ආවරණය නොකරමින් වූ බැවින් එය වෙසෙසින් උලුප්පා දැක්වීමට යුද්ධයේ ජයග්‍රාහකයා වන මිත්‍ර පාර්ශවයට හැකි විය. ශින්ඩ්ලර් විවාදාසම්පන්න චරිතයකි. ඔහු, නාසීන් හා එක්ව යුදෙව්වන් සිය කර්මාන්තවල වහලුන් ලෙස යොදා ගනිමින් කර්මාන්ත කර මුදල් හරිහම්බ කරයි. එහෙත්, ඔහු ලාභ ඉපයීමට අසමත්වේ. ඊට හේතුව, යුදෙව්වන් මරණයෙන් ගලවා ගැනීමට ඔහු එසේ හම්බ කළ මුදල් සියල්ල නොමසුරුව වියදම් කිරීමයි. ඔහු නිර්ලෝභීව නාසි නිලධාරීන් සහභාගී වන ප්‍රිය සාද සඳහා සිය මුදල් වියදම් කළේය. නිර්භයව හා නොපැකිලව නාසි නිලධාරීන්ට මහා පරිමාණයෙන් අල්ලස් ලබා දුන්නේය. සමාජ ශාලා තුළ හා සූදු පොළවල නොමසුරුව මුදල් වියදම් කළේය. මේ සියල්ලේ අවසන් අරමුණ සිය සේවකයින් වශයෙන් සිටි යුදෙව්වන් මරණයෙන් ගලවා ගැනීමයි.

පශ්චාත් යුද්ධ සමයේ රචනා වන කිසිදු සාහිත්‍ය කෘතියක් අපක්ෂපාතී නැත. එය නිසැකවම, එක් පක්ෂයකට හෝ නො එසේ ධාවන තරගයට පිරිමි ක්‍රීඩකයින් සමග එක්ව තරග කරමින් ස්ත්‍රීන්ගේ ක්‍රීඩා අයිතිය වෙනුවෙන් සටන් කළ Kathrine Switzer පිළිබඳව මෑතක දී පළවූ එක්තරා සමාජ ජාලා වෙබ් පෝස්ටුවක මෙසේ සටහන්ව තිබුණි ''ලෝකය වෙනස් කරන ලද්දේ සාමූහික ක්‍රියාකාරකම් නිසා නොව, ඉඳහිට පහළ වන යම් යම් නිර්භීත මිනිසුන්ගේ හුදකලා සිදුවීම් කරණකොට ගෙනය''. මෙම සිනමා කෘතිය හා පොත මෙම පටු අදහසට වක්‍රකාරයෙන් ලබා දෙන මනා පිළිතුරකි. ඇත්ත වශයෙන්ම මෙම කෘති දෙකම ඔස්කා ශින්ඩ්ලර් නම් තනි මිනිසා උත්කර්ශයට නැංවූවද, ඔහු විසින් ගලවා ගනු ලබන්නේ මිනිසුන් දහසක් පමණි. එහෙත්, මිලියන ගණනක් වූ සිය දේශයේ මිනිසුන් පරිත්‍යාග කරමින් හිට්ලර්ගේ කෘෘරත්වයෙන් ලෝකය මුදවා ගන්නා ලද්දේ එවකට සමාජවාදී සෝවියට් දේශයේ රතු හමුදාව විසිනි. එය තනි මිනිසෙකුට කළ හැකි යම් දෙයකට වඩා සංවිධානාත්මක මිනිසුන් පිරිසකට බෝහෝ දෑ කළ හැකි බව සනාථ කරන එක් උදාහරණයක් පමණි.

## අලුත් මිනිසෙක්... >>01 පිටුවෙන්

ඇති අභියෝගයයි.

සැබෑ මිනිස් ක්‍රියාකාරීත්වය හමුවේ සමාජය ගමන් කළේ ඉදිරියටය. ආපස්සට නොවේ. දීර්ඝ කාලීන මිනිස් ඉතිහාසයත්, එම ඉතිහාසය තුළ මිනිසා ලබාගත් ජයග්‍රහණත් විමසා බැලීමේදී, ඒ බව පසක් වෙයි. වත්මන් ශ්‍රී ලාංකික අප හමුවේ ඇති අභියෝගයද සුවිශාලය. එහෙත් කෙසේ හෝ අප එය ජය ගත යුතු ය. එම කර්තව්‍යයේ දී අප හැමගේම උර මත කිසියම් හෝ කාර්යයභාරයක් පැවරී තිබේ. අලුත් මිනිසෙක් බිහිකර ගැනීමේදී, විශේෂයෙන්ම කලාවටත් සාහිත්‍යටත් ඉටු කිරීමට ඇත්තේ සුවිසල් වගකීමකි. එම වගකීම ඉටුකිරීම සඳහා පෙරමුණ ගැනීම වෙනුවෙන් සැමට ශක්තිය සහ ධෛර්යය ප්‍රාර්ථනා කරමු.

## මාක්ස්වාදී ඇසින්

# පංති සමාජය තුළ කලාව

මානව සමාජයේ ආරම්භයත් සමගම කලාව ඉතාම ප්‍රාථමික කලාවක් ලෙස බිහිවුවද මුල්ම මානව සමාජය වූ ප්‍රාථමික සාමූහික සමාජය තුළ කලාව වර්ධනය වූයේ ඉතා සෙමිනි. මෙහි විශේෂය වූයේ ප්‍රාථමික සාමූහික සමාජය තුළ 'කලාව' උපත ලැබුවද 'කලාකරුවා' බිහි නොවීමය. 'කලාකරුවා' උපත ලැබූයේ ප්‍රාථමික සාමූහික සමාජය වෙනස් වී පළමු පංති සමාජය බිහිවීමත් සමඟය. යුරෝපයේදී පළමු පංති සමාජය වහල් ක්‍රමයක් විය. ආසියානු රටවල ඊට වඩා වෙනස් තත්වයන්ද පැවැතිණි. කෙසේ වෙතත් අපට ඉතිහාසය තුළ 'කලාකරුවා' මුණ ගැසෙන්නේ පංති සමාජයේදීය.

'කලාකරුවා' බිහිවීම පංති සමාජයේදී සිදුවූයේ ඇයි? මෙය ඉතාම වැදගත් කරුණකි. මිනිසාගේ මුල්ම සමාජය වූ ප්‍රාථමික සාමූහික සමාජයේ නිෂ්පාදන උපකරණ ඉතාම නොදියුණු විය. නිෂ්පාදන උපකරණ නොදියුණු නිසා නිෂ්පාදනයද සීමිත විය. යම් කෙනෙක්ගේ ශ්‍රමයේ ඵලය ලෙස නිපදවා ගන්නා දේ ඔහුගේ පැවැත්මට පවා ප්‍රමාණවත් නොවීය. ඒ නිසා හැම දෙනාම කුමන හෝ ආකාරයකින් නිෂ්පාදනයට (ආහාර නිපදවා ගැනීමට) දායක විය යුතුය. මේ නිසාම නිෂ්පාදන ක්‍රියාවලිය සාමූහික වූ අතර එය බෙදා හදාගෙන පරිභෝජනය කිරීමද සාමූහික විය. දඩයම්කර සතෙකු මරා ගැනීම, මාළු අල්ලා ගැනීම, අල හාරා ගැනීම, ගෙඩි වර්ග කඩා ගැනීම, ආදියේ සිට ඒවා ආහාරය බවට සකස් කර ගැනීම දක්වා වූ ක්‍රියාවලියට (නිෂ්පාදනයට) සියලුම දෙනා දායක විය යුතු වූ නිසාත්, කෙනෙකුගේ ශ්‍රමයේ ඵලයෙන් තවත් කෙනෙකුට ජීවත් වීමට තරම් ශ්‍රමය ඵලදායී නොවූ නිසාත් නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ නොවී අන් අයගේ ශ්‍රමයේ අතිරික්තයෙන් යැපීමට මුල් සමාජය තුළ කිසිවෙකුට නොහැකි විය. කලාව පමණක් තම කාර්යය කරගත් "කලාකරුවා" ප්‍රාථමික සමාජයේ බිහි නොවූයේ ඒ නිසාය.

ප්‍රාථමික සාමූහික සමාජය වසර දස දහස් ගණනක් තිස්සේ හිමින් හිමින් වුව වර්ධනය වී ඒ තුළ නිෂ්පාදන උපකරණ දියුණුවී නිෂ්පාදිතයන් වැඩිවීමත් සමඟ එනම් සත්ව පාලනය, ගෙවතු වගාව, ඇතිවීමත් සමග මිනිස් ශ්‍රමය, ශ්‍රමිකයාගේ යැපීමට අවශ්‍ය ප්‍රමාණයට වඩා නිපදවීමට සමත් විය. එනම් අතිරික්ත නිෂ්පාදනය ඇතිවිය. ශ්‍රමය සූරාකෑමේ හැකියාව ඇතිවිය. අතිරික්ත ධනය බිහිවිය. එම අතිරික්ත ධනයෙන් වැඩ නොකරන අයට යැපීමට හැකිවිය. සූරාකෑම සහිත පංති සමාජයත් රජයත් බිහිවූයේ මේ සමඟය. වැඩ කරන අයගේ ශ්‍රමයේ අතිරික්තයෙන් යැපීමට පිරිසකට හැකිවීමත් සමඟ එවැනි අය බිහිවිය. රජය ඉන් එකකි. එසේම ආගම් බිහිවිය. පූජක පැලැන්තිය බිහිවූයේද ඒ සමඟය. ඔවුහු අතිරික්ත සමාජ ධනයෙන් ජීවත්වීමට පටන් ගත්තෝය. රජයද සමඟ සම්බන්ධව 'කලාකරුවා' බිහිවූයේද මේ තත්වය තුළය.

'කලාකරුවා'ට නිෂ්පාදන ක්‍රියාවලියට දායක නොවී කලාව වර්ධනය කිරීමට හා කලාවට පමණක් තම කාලය වැය කිරීමට හැකිවූයේ අතිරික්ත නිෂ්පාදනයෙන් දිවි ගෙවීමට ඔහුට හැකිවීම නිසාය. මුල්ම සමාජයේ අතිරික්ත ධනය අයිතිවූයේ පාලක පංතියටය. රජයටය. ඒ නිසාම ආරම්භක 'කලාකරුවෝ' රජය හා සම්බන්ධ වූවෝ වූහ; රජු වෙනුවෙන් හෝ ප්‍රභූන් වෙනුවෙන් එනම් අතිරික්ත ධනය අත්පත් කරගත් අය වෙනුවෙන් කලා නිර්මාණය කළ අය වූහ. ඒ එසේ වූයේ කලාකරුවාට ගෙවීම සඳහා අතිරික්ත ධනය තිබූයේ එවැනි අය ළඟ පමණක් වීම නිසාය. මේ නිසාම අප දකින ප්‍රසිද්ධ කලාකරුවන්ගේ මුල් නිර්මාණ පාලක පංතිය වෙනුවෙන්, ප්‍රභූන් වෙනුවෙන් ආගම වෙනුවෙන් නිර්මාණය වූ ඒවා විය. පුරාණ ග්‍රීසියේ චිත්‍ර, ප්‍රතිමා, නාට්‍ය, හෝමර්ගේ ඉලියඩ්, ඔඩෙසි වැනි මහා කාව්‍ය ඊට නිදසුන්ය. ආසියාවේද මූර්ති, ප්‍රතිමා, වේද ග්‍රන්ථ, මහා භාරතය වැනි මහා කාව්‍ය මීට නිදසුන් වේ. එහෙත් එය දිගටම මෙසේ පැවතියේ නැත.

පංති සමාජය බිහිවීමත් සමාජයේ නිෂ්පාදන උපකරණවල හා සමාජ ධනයේ අයිතිය පාලක පංතිය අත්කර ගැනීමත් සමඟ කලාව මතද ඔවුහු සිය ආධිපත්‍ය පැතිරවූහ. එහෙත් ඒ සමඟම සමාජයේ පැවති පීඩිත පංතිය තුළින්ද කලාවන් බිහිවන්නට විය. ඒවාට අයිතිකරුවන් සිටියේ නැත. එවැනි පීඩිත පංති කලාවක්ද වර්ධනය විය. අප බොහෝ විට ජනශ්‍රැතිය ලෙස හඳුනා ගන්නේද මේවාය. එහෙත් ආරම්භක කලාවේ මහා කලාව රජය සමග, ආගම සමග දැඩිව සම්බන්ධව පැවතිණි. ඒ කලින්ද සඳහන් කළ පරිදි සමාජයේ බලය මෙන්ම දේපලවල අයිතිය පැවතියේ පාලක පංතිය සතුව නිසාය. මෙහිදී විෂයන් ලෙස කලාවේ විවිධ ක්ෂේත්‍රයන් වේගයෙන් වර්ධනය වූයේ නිෂ්පාදන උපකරණ වේගයෙන් වර්ධනය වූ බටහිර ලෝකයේය. එනම් යුරෝපය ආශ්‍රිතවය. යුරෝපයේ දී කලාව විශාල ලෙස වර්ධනය වූ ස්ථානය වූයේ ග්‍රීසියයි. නාට්‍යකරුවෝ, කවියෝ, චිත්‍ර ශිල්පීන් හා මූර්ති ශිල්පීන් හමුවන්නේද ග්‍රීසියෙනි. ආසියාවේදී නම් ඉන්දියාවෙන් හා චීනයෙනි.

මිනිසාගේ බිහිවීමත් සමග ප්‍රාථමික සමාජයේදී ආරම්භව පළමු පංති සමාජය තුළ විෂයයන් ලෙස වර්ධනය වෙමින් ඉදිරියට ආ කලාවේ ගමන්මග මටසිළුටු එකක් වූයේ නැත. පංති සමාජය තුළ කලාවද පංතීන්ට බෙදුණි. අධිපති පංතියේ කලාවක් සමඟ පීඩිත පංති කලාවක්ද වර්ධනය විය. අනෙක් අතට ඉතිහාසයේ ගමන්මග තුළ විශේෂයෙන් යුරෝපයේදී විද්‍යාව මුහුණ දුන් අභියෝගයට කලාවද මුහුණ දුන්නේය. කලාවද යුරෝපයේ 'අඳුරු යුගයේ' බලපෑමට හසුවිය. ඒ, යුරෝපය තුළ ග්‍රීසිය බිඳවැටී රෝමය බලවත්වීමත් රෝම අධිරාජ්‍යය ගොඩනැගීමත් රෝම අධිරාජ්‍ය පසු කලෙක ක්‍රිස්තියානි ආගමේ බලපෑමට ලක්ව ශුද්ධවූ රෝම අධිරාජ්‍යය බවට පත්වීමත් සමගය.

ක්‍රි.ව. 400 සිට 1400 දක්වා වූ යුගය යුරෝපයේ ඉතිහාසය හඳුනාගන්නේ මධ්‍යතන යුගය හෙවත් අඳුරු යුගය ලෙසය. මේ යුගය පුරා එනම් වහල් ක්‍රමය බිඳවැටී බිහිවූ වැඩවසම් ක්‍රමයේ සිට එය බිඳවැටී ධනවාදය බිහිවීම දක්වා වූ කාලය පුරා, යුරෝපා වැඩවසම් සමාජය පුරා විද්‍යාව මුහුණ දුන් ඛේදජනක ඉරණමට කලාවද මුහුණ දුන්නේය. පුරා වසර 1000ක් පමණ වූ මෙම අඳුරු යුගය තුළ යුරෝපයේදී කලාව මුළුමනින්ම ආගමේ බලපෑමට ලක්විය. චිත්‍රකලාව පල්ලියේ චිත්‍ර ඇඳීමටත් මූර්ති ශිල්පය ආගමික මූර්ති නිර්මාණය කිරීමටත් ලේඛන කලාව ආගම ගැන ලිවීමටත් පමණක් සීමා කරන ලදී. ඒ නිසා ග්‍රීසියෙන් ආරම්භ වූ නාට්‍ය කලාව, චිත්‍ර හා මූර්ති කලාව බිඳවැටිණි. මිනිස් ජීවිතය පිළිබඳව, සෞන්දර්ය පිළිබඳ, ප්‍රේමය පිළිබඳ කලාවන් ආගමික මතයන්ට යටකරන ලදී. ඒ අනුව මධ්‍යතන යුගය තුළ යුරෝපයේ කලාව පැවතියේ පල්ලියේ ආධිපත්‍යය තුළය. ආසියාවේ මෙය මෙලෙස නොවුණද එහිදීද කලාවට ආගමික ආයතන කළ බලපෑම දැකිය හැකිය.

කෙසේ වෙතත් මධ්‍යතන යුගය තුළ ආගමික මතවාදයන්ට යට කර තිබූ කලාව ඉන් මිදී නව පණක් ලබන්නේ යුරෝපයේ ධනවාදයේ ආරම්භයත් සමඟය. මෙය 'පුනරුද සමය' නම් විය. පුනරුද සමය තුළ, ධනවාදය තුළ කලාව වර්ධනය වූයේ කෙසේද යන්න මීළඟට කතාකරමු.

# ශින්ඩ්ලර්ගේ ලැයිස්තුව

**මේ කතාන්තර කියවෙන්නේ ස්ටීවන් ස්පිල්බර්ග් 1993 වසරේ නිර්මාණය කළ සිනමා කෘතියක් වන ශින්ඩ්ලර්ස් ලිස්ට් හෙවත්, ශින්ඩ්ලර්ගේ ලැයිස්තුව නම් සිනමා නිර්මාණයේය.**




Schindler's List සමූල ඝාතනය පිළිබඳව කතාන්තරයකි. එසේ වුවද, එය සමූල ඝාතනයට පරිබාහිර සිනමා නිර්මාණයකට වස්තු විෂය සපයා ඇත. මෙම නිර්මාණය තුළින් සමාන්තර චරිත දෙකක සංකලනයක් ප්‍රේක්ෂකයා වෙත ගෙන එයි. වෙනත් ආකාරයකින් පවසන්නේ නම් මෙය යුද්ධය නම් පට පිළිය තුළ සැඟවීමට මාන බලන රැවටිලිකාර මිනිසුන් දෙදෙනෙකුගේ මානසික ස්වභාවය පිළිබඳව කියා පාන කතාන්තරයකි. මෙයින් එක් මිනිසෙක්, එනම් Amon Leopold Goeth ජර්මනියේ හිට්ලර් විසින් උත්කර්ශයට නැංවූ ''තුංවන ජාතියේ'' හා කුරිරු පරිපීඩක යුද්ධයේ සැබෑ නියෝජිතයෙකුගේ ගති ලක්ෂණ මනාව නිරූපණය කරන අතර, ඊට පටහැණිව යමින් ඔස්කා ශින්ඩ්ලර් එකී තුන්වන ජාතිය අසාමාන්‍ය හාස්‍යයට ලක් කරන මිනිසෙකුගේ භූමිකාවවට ජීවය ලබා දෙයි.

ශින්ඩ්ලර් යුද්ධයට පෙර හෝ පසුව සාර්ථක ව්‍යාපාරිකයෙකු වූයේ නැත. එසේම, ඔහු එවැන්නක් අපේක්ෂා කළේද නැත. වරක් ඔහු ප්‍රකාශ කරන ලද්දේ යුද්ද කාල සීමාව තුළ අසාර්ථක ව්‍යාපාර කිරීම සිය අපේක්ෂාව වූ බවයි. නො එසේ නම්, තමා විසින් නිපදවන ශෙල් වෙඩි මඟින් මිනිසුන් මරා දැමීමේ පාපයට තමාද වරදකරුවෙකු විය හැකිව තිබූ බවයි. ඇත්ත වශයෙන්ම ශින්ඩ්ලර් සිය ව්‍යාපර යොදා ගත්තේ මුවාවක් වශයෙනි. එනම්, සිය සේවක සේවිකාවන් වශයෙන් සේවය කළ දහසකට අධික යුදෙව්වන් පිරිසක් බේරා ගැනීමේ පළිහක් වශයෙනි. එහි ප්‍රතිඵලයක් ලෙස යුද්ධය අවසානයේ දී ගොයෙත්ට මරණ දඬුවම ලබා දුන් අතර ශින්ඩ්ලර් වීරයෙකු ලෙස ඉතිහාස ගත විය.

මෙම මිනිසුන් දෙදෙනාගේ කතාන්තරය කීමේ දී ස්පිල්බර්ග් විසින් ඉතා විශාල ප්‍රදේශයක් ආවරණය කරන්නා වූ ද, බේදයන් විසින් වට කරන ලද්දා වූද සමූල ඝාතන ප්‍රබන්ධනාත්මක ප්‍රවේශයක් යොදා ගනී. මානව ඉතිහාසයේ සිදුවූ දැවැන්තම ඛේදවාචක පිළිබඳ කතාන්තර සතුටුදායක ආවසානයකින් නිමා කිරීමට නොහැකි වුවද ස්පිල්බර්ග් විසින් එය ප්‍රබල පණිවුඩයකින් අවසන් කරයි. එනම්, නපුර පරාජය කළ නොහැකි නමුදු එයට එරෙහිව නොබියව හා උපක්‍රමශීලීව නැගී සිටින්නන් එය පියමං කර, යම් සහනදායී වටපිටාවක් කරා ප්‍රවේශ වීමේ අවස්තාව උදා කර ගන්නා බවයි. මන්ද, නාසීන් විසින් නිර්මාණය කළ මිනී වළ තුළ ලෝකයට බොහෝ විකල්පයන් ඉතිරි කළේ නැත. එක්කෝ ඔබ ඔවුන්ගේ අත්වැල් ගායනයට හවුල් විය යුතුය. නැතහොත්, ගිලී මිය යා යුතුය.

නිපදවා වසර 23 කට පසුව මෙම සිනමා කෘතිය පිළිබඳව යමක් ලිවීමට අදහස් කළේ මෑතකදී පළ වූ කෘතියක් හේතුවෙනි. ඒ ලියෝන් ලෙයිසන් විසින් රචිත The Boy on the Wooden Box: How the Impossible Became Possible නම් කෘතියේ සිංහල පරිවර්තන කෘතිය කියවීමෙනි. සේනානි ධර්මරත්න විසින් පරිවර්තනය කරන ලද 'මරණය ජයගත් යුදෙව් දරුවා' නමින් පළකර ඇති මෙහි, ශින්ඩර්ගේ ලැයිස්තුවට ඇතුළත්ව දිවි ගලවා ගත් පෝලන්ත ජාතික යුදෙව් දරුවෙකුගේ සැබෑ කතාන්තරයක් පවසන්නකි.

ශින්ඩ්ලර්ගේ ලැයිස්තුව පිළිබඳව බොහෝ කතාන්තර ලියවී තිබුණද, එය ඇස් දෙකෙන් දැක සනාථ කරගත් මිනිසෙකුගේ අතින් ලියවුනු පළමු අවස්ථාව වශයෙන් මෙම කෘතිය පෙන්වා දිය හැකිය. ඒ, දෙවන ලෝක යුද්ධයේ මහා ඝාතන රැල්ල පෝලන්තය ආක්‍රමණය කරන කාලයේ වයස අවුරුදු 10 ක් වූ Juden, Leib Lejzon. Leib, හෙවත් Leon Leyson, ගේ කතාවයි. එය සමූල ඝාතනයේ කුරිරු සෙවනැල්ලට යටත්ව, සාගතයෙන්, අහේනියෙන්, ආර්ථික අපහසුතාවන්ගෙන් මිරිකෙමින් වුවද, පවුලේ ඔවුනොවුන් හා වන බැඳීම සිඳ බිඳ නොගත් මිනිස් වීරවරයින් පිරිසකගේ කතාවකි.

ජර්මානුවන් විසින් පෝලන්තය යටත් කර ගැනීමෙන් අනතුරුව එහි ඔවුන්ගේ අවසන් විසඳුම ක්‍රියාවට නංවන ලදී. එනම්, සියලු යුදෙව්වන් සමූල ඝාතනය කිරීමයි. මෙම ලුහුබැඳ එන මරණයෙන් දිවි ගලවා ගැනීමට ඇති හැකියාව සම්භාවිතාවක් ලෙස ගත් කළ, අඩුම සම්භාවිතාවක් තිබුණේ දරුවන්ගේ ජීවිත ආරක්ෂා කිරීමටයි. ඊට හේතුව, නාසීන් විසින් වහාම ඝාතනය කළ යුතු පිරිසගේ ලැයිතුවේ ඉහළම ප්‍රමුඛතාව දරුවන්ට හිමිව තිබීමයි. ඊට එරෙහිව යමින්, ශින්ඩ්ලර්ගේ ලැයිස්තුවට ඇතුළත්ව අහම්බයෙන් දිවි ගලවා ගත් වයස අවුරුදු 12ක දරුවෙකුගේ කතාන්තරයක් මෙම පොතට පාදක වී

>>ඉතිරිය 03